# සිව්වැනි කොටස

# සිව්වැනි කොටස

## මහ බැංකුවේ සහ ශ්‍රී ලංකාවේ බැංකු ආයතනවල වැඩ කටයුතු හා මෙහෙයුම්වලට අදාළ 2013 සම්මත කරන ලද ප්‍රධාන නීති අණපනත්

පිටුව


| | | |
|---|---|---|
| 1. | 2013 අංක 1 දරන දිවි නැගුම පනත | 1 |
| 2. | 2013 අංක 3 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති (සංශෝධන) පනත | 12 |
| 3. | 2013 අංක 5 දරන වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු (සංශෝධන) පනත | 13 |
| 4. | 2013 අංක 6 දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත | 13 |
| 5. | 2013 අංක 7 දරන සුරාබදු (සංශෝධන) පනත | 14 |
| 6. | 2013 අංක 8 දරන විදුලි සංදේශ බදු (සංශෝධන) පනත | 14 |
| 7. | 2013 අංක 9 දරන රේගු (සංශෝධන) පනත | 15 |
| 8. | 2013 අංක 11 දරන ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත | 16 |
| 9. | 2013 අංක 12 දරන මුදල් පනත | 17 |
| 10 | 2013 අංක 15 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම) (සංශෝධන) පනත | 22 |
| 11. | 2013 අංක 16 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති (සංශෝධන) පනත | 22 |
| 12. | 2013 අංක 17 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත | 22 |
| 13. | 2013 අංක 18 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත | 32 |
| 14. | 2013 අංක 19 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු (සංශෝධන) පනත | 43 |
| 15. | 2013 අංක 20 දරන බදු අභියාචනා කොමිෂන් සභාව (සංශෝධන) පනත | 46 |

# 2013 අංක 1 දරන දිවි නැගුම පනත

[සහතිකය සටහන් කළේ 2013 ජනවාරි මස 11 වැනි දින]

**1995 අංක 30 දරන පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය, 1996 අංක 18 දරන පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය සහ 2005 අංක 26 දරන පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරිය යන අධිකාරී ඒකාබද්ධ කිරීම මගින් දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන දෙපාර්තමේන්තුවක් පිහිටුවීම සඳහා ද; ග්‍රාමීය මට්ටමින් දිවි නැගුම ප්‍රජාමූල සංවිධාන පිහිටුවීම සහ දිස්ත්‍රික් මට්ටමින් සහ ජාතික මට්ටමින් සම්බන්ධීකරණ ජාලයක් සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද; දිවි නැගුම ප්‍රජාමූල බැංකු සහ දිවි නැගුම ප්‍රජාමූල බැංකු සමිති පිහිටුවීම සඳහා ද; 1995 අංක 30 දරන ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය පනත, 1996 අංක 18 දරන ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය පනත සහ 2005 අංක 26 දරන ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරිය පනත ඉවත් කිරීම සඳහා ද; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීමෙහි ලා සහ දිළිඳුබව තුරන් කිරීමේ සහ සමාජ සාධාරණත්වය සහතික කිරීමේ ජාතික ප්‍රතිපත්තිය බලාත්මක කිරීමෙහි ලා පුද්ගල, පවුල, කණ්ඩායම් සහ ප්‍රජාව කේන්ද්‍රකරගත් ජීවනෝපාය සංවර්ධන ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම අවශ්‍ය වී ඇති හෙයින් ද:

දිවි නැගුම ප්‍රජාමූල සංවිධාන ස්ථාපිත කොට කලාපීය, දිස්ත්‍රික් සහ ජාතික මට්ටමේ සම්බන්ධීකරණ ජාලයක් ගොඩනැගීම මගින් සහ ක්ෂුද්‍ර මූල්‍ය බැංකු පද්ධතියක් සංවර්ධනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම මගින් ප්‍රජා මට්ටමේ ජාතික සංවර්ධන ක්‍රියාවලියකට ජනතාව ඒකරාශි කිරීම සඳහා දිවි නැගුම අදහස් කරන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:–

1. මේ පනත 2013 අංක 1 දරන දිවි නැගුම පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, මේ වගන්තිය හැර මේ පනතේ විධිවිධාන අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නියම කරනු ලබන (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක සිට බලාත්මක විය යුතු ය. මේ වගන්තියේ විධිවිධාන මේ පනත පාර්ලිමේන්තු පනතක් බවට පත්වන දින සිට බලාත්මක විය යුතු ය.

I වන කොටස

## දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවීම

2. මේ පනතේ කාර්ය සඳහා (මෙහි මින් මතු "දෙපාර්තමේන්තුව" යනුවෙන් සඳහන් කරනු ලබන) දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව යනුවෙන් හඳුන්වනු ලබන රජයේ දෙපාර්තමේන්තුවක් පිහිටුවනු ලැබිය යුතු ය.

3. (1) දෙපාර්තමේන්තුවේ බලතල සහ කාර්ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සඳහා (මේ පනතේ "අධ්‍යක්ෂ-ජනරාල්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ- ජනරාල්වරයකු සහ කලින් කල අවශ්‍ය විය හැකි වෙනත් යම් නිලධරයන් සහ සේවකයන් පත් කරනු ලැබිය යුතු ය.

(2) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කලින් කල අවශ්‍ය යයි සලකනු ලබන පරිදි ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය අතරින් කිසිවක් ලිඛිතව යම් රජයේ නිලධරයකු වෙත පවරනු ලැබිය හැකි ය.

4. දෙපාර්තමේන්තුවේ පරමාර්ථ:–

(අ) දිළිඳුබව තුරන් කිරීම සහ සමාජ සාධාරණත්වය සහතික කරනු ලබන සමාජයක් බිහි කිරීම සඳහා අවශ්‍ය විය හැකි සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම;

(ආ) පුද්ගල, පවුල, කණ්ඩායම් සහ ප්‍රජාව කේන්ද්‍ර කරගත් ජීවනෝපාය ආර්ථික සංවර්ධන ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම;

(ඇ) එක් එක් පුද්ගලයා සහ පවුල වෙනුවෙන් ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම;

(ඈ) ජාතික සංවර්ධනය වේගවත් කිරීම සඳහා ජනතාව ඒකරාශි කිරීම හා සවිබල ගැන්වීම;

(ඉ) ජනතාවගේ ජීවනෝපාය සංවර්ධනය ඉහළ නැංවීමේ කාර්ය සඳහා ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් සැපයීම;

(ඊ) ජනතාවගේ ජීවනෝපාය සංවර්ධනය සඳහා අවශ්‍ය විය හැකි භෞතික සහ සමාජ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම;

(උ) ජනතාවගේ ආර්ථික සහ සමාජ සංවර්ධනයට අවශ්‍ය විය හැකි අධ්‍යයන සහ පර්යේෂණ කටයුතු සිදු කිරීම;

(ඌ) ජනතාවගේ ජීවන තත්ත්වය නඟාසිටුවීම සඳහා මානව ප්‍රාග්ධනය සංවර්ධනය කිරීම; සහ

(එ) සමාජ ආරක්ෂණයක් අවශ්‍ය පුද්ගලයන් සඳහා සමාජ ආරක්ෂණ ජාලයක් නිර්මාණය කිරීම,

විය යුතු ය.

5. ස්වකීය කාර්ය ඉටු කිරීමේ දී දෙපාර්තමේන්තුවට පහත සඳහන් බලතල තිබිය යුතු ය :–

(අ) දිවි නැගුම ප්‍රජාමූල සංවිධාන, දිවි නැගුම ප්‍රාදේශීය සංවිධාන සහ දිස්ත්‍රික් කමිටු පිහිටුවීම, පාලනය සහ කළමනාකරණය අධීක්ෂණය කිරීම සහ පරීක්ෂා කිරීම;

(ආ) කලාප, දිස්ත්‍රික්, ප්‍රාදේශීය, ග්‍රාමීය, ග්‍රාම නිලධාරී කොට්ඨාස සහ ප්‍රජා මට්ටමින් දිවි නැගුම ප්‍රතිලාභීන් සම්බන්ධ කරමින් සංවිධාන ජාලයක් නිර්මාණය කිරීම සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සම්බන්ධයෙන් කටයුතු කිරීම;

(ඇ) දිවි නැගුම ප්‍රතිලාභීන්ගේ නිෂ්පාදන ගබඩා කිරීම, අලෙවිකරණය සහ සැකසීම සඳහා මධ්‍යස්ථාන පිහිටුවීම සහ එකී කාර්යය සඳහා භෞතික සහ මූල්‍ය සම්පත් ලබා දීම;

(ඈ) මේ පනතේ 36 වන සහ 37 වන වගන්ති යටතේ පිහිටුවන ලද දිවි නැගුම සංවර්ධන අරමුදල සහ දිවි නැගුම චක්‍රීය අරමුදල පවත්වාගෙන යාම;

(ඉ) මේ පනතේ කාර්ය සඳහා දිවි නැගුම සංවර්ධන අරමුදලේ සහ දිවි නැගුම චක්‍රීය අරමුදලේ පවතින මුදල් ප්‍රයෝජනයට ගැනීම;

(ඊ) දිවි නැගුම ප්‍රජාමූල සංවිධාන, දිවි නැගුම ප්‍රාදේශීය සංවිධාන, දිවි නැගුම දිස්ත්‍රික් කමිටු, දිවි නැගුම ප්‍රජාමූල බැංකු සහ දිවි නැගුම ප්‍රජාමූල බැංකු සමිති අධීක්ෂණය, කළමනාකරණය, පරීක්ෂා කිරීම සහ විගණනය කිරීම;

(උ) දිවි නැගුම සංවර්ධන අරමුදල සඳහා අරමුදල් රැස් කර ගැනීම පිණිස ජාතික ලොතරැයි මණ්ඩලයේ සහාය ඇතිව ලොතරැයි පැවැත්වීම සඳහා කටයුතු සංවිධානය කිරීම;

(ඌ) දිවි නැගුම සංවර්ධන වැඩසටහන් සැලසුම් කිරීම, අධීක්ෂණය, පරීක්ෂා කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි තොරතුරු එක්රැස් කිරීම;

(එ) රජයේ දෙපාර්තමේන්තුවල, රාජ්‍ය ආයතනවල, පළාත් පාලන ආයතනවල, රාජ්‍ය සංස්ථාවල, පළාත් මට්ටමේ අධිකාරී ආයතනවල සහ වෙනත් පෞද්ගලික හෝ රාජ්‍ය මණ්ඩලවල, ස්වාභාවික හෝ නෛතික පුද්ගලයන්ගේ සහයෝගය ලබා ගැනීම;

(ඒ) දිවි නැගුම සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමෙහි ලා දිවි නැගුම ප්‍රජාමූල සංවිධානවලට සහ දිවි නැගුම ප්‍රාදේශීය සංවිධානවලට සහාය වීම;

(ඔ) ජනතාවගේ ජීවන තත්ත්වය ආර්ථික වශයෙන් සහ සමාජීය වශයෙන් ඉහළ නංවනු ලබන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාම හා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම;

(ඕ) දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලැබිය හැකි පුද්ගලයන් පුහුණු කිරීමේ සහ දැනුවත් කිරීමේ වැඩසටහන්වල කාර්ය සඳහා දෙපාර්තමේන්තුවේ සම්පත් ප්‍රයෝජනයට ගැනීම;

(ක) දිවි නැගුම ප්‍රතිලාභීන්ගේ ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීමේ කාර්ය සඳහා අමුද්‍රව්‍ය, උපකරණ, තාක්ෂණය සහ දිවි නැගුම ප්‍රතිලාභීන්ගේ නිෂ්පාදන මිල දී ගැනීම සහ ගබඩා කිරීම සහ අවශ්‍ය අවස්ථාවල දී ඒවා නිෂ්පාදකයන්ට සැපයීම සඳහා අවශ්‍ය පියවර ගැනීම;

(ග) දිවි නැගුම ප්‍රතිලාභීන් හට ස්වකීය නිෂ්පාදන ජාතික සහ ජාත්‍යන්තර වෙළඳපළ වෙත හඳුන්වා දීමට සහ එම වෙළඳපළවල දී එම නිෂ්පාදන අලෙවි කිරීමට හැකියාව ලැබෙන පරිදි අලෙවිකරණ මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම ඇතුළුව අලෙවිකරණ පහසුකම් සැපයීම සහ ඒ මධ්‍යස්ථාන පවත්වාගෙන යාම, පරීක්ෂා කිරීම සහ අධීක්ෂණය කිරීම;

(ච) රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන සමග සම්බන්ධීකරණය පවත්වා ගෙන යාම;

(ජ) දිවි නැගුම සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ වගකීම, දිවි නැගුම ප්‍රජාමූල සංවිධාන සහ දිවි නැගුම ප්‍රාදේශීය සංවිධාන වෙත පැවරීම;

(ට) යම් මිල දී ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නියාදනයක් ප්‍රකාරව හෝ වෙනත් යම් ආකාරයකින් එයට පවරනු ලැබිය හැකි යම් චංචල හෝ නිශ්චල දේපළවල සන්තකයට ගැනීම හා දැරීම; සහ

(ඩ) මේ පනතේ නිශ්චිතව දක්වනු ලබන පරමාර්ථ සහ කර්තව්‍ය හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික සියලු කරුණු පිළිබඳව කටයුතු කිරීම.

6\. දෙපාර්තමේන්තුවේ කර්තව්‍ය පහත සඳහන් පරිදි විය යුතු ය:–

(අ) පුද්ගලයන්ගේ, පවුල්වල, කණ්ඩායම්වල සහ ප්‍රජාවගේ ආදායම් උත්පාදනය ඉහළ නංවන ව්‍යාපෘති සැලසුම් කිරීම සහ ඒ ව්‍යාපෘති සඳහා පහසුකම් සැලසීම;

(ආ) දිවි නැගුම ප්‍රතිලාභීන්ගේ රැකියා අවස්ථා වැඩි කිරීම සඳහා සහාය වීම;

(ඇ) අලෙවිකරණ කටයුතු වැඩි දියුණු කිරීම;

(ඈ) ජීවනෝපාය සංවර්ධනය පිළිබඳ ප්‍රජාවගේ දැනුම වර්ධනය කිරීම;

(ඉ) පරිසර හිතකාමී ජීවන රටාවක් සඳහා මහජනතාව උනන්දු කරවීම;

(ඊ) පුද්ගල, පවුල, කණ්ඩායම් සහ ප්‍රජාව කේන්ද්‍රකරගත් සංවර්ධන ව්‍යාපෘති ප්‍රවර්ධනය සඳහා අවශ්‍යවන සම්පත් සහ සේවා සපයනු ලබන ආයතන සමඟ සම්බන්ධීකරණය පවත්වා ගෙන යාම;

(උ) ජනතාව අතර ඉතිරි කිරීමේ පුරුදු වර්ධනය කිරීම;

(ඌ) සම්පත් සහ සේවා වෙත ප්‍රවේශ වීමේ දී දිවි නැගුම ප්‍රතිලාභීන් මුහුණ දෙන බාධක ඉවත් කිරීම;

(එ) ප්‍රජාවගේ ශුභසිද්ධිය සඳහා හිතකර වන, යුක්තිගරුක සමාජීය පරිසරයක් ඇති කරන්නා වූ වැඩසටහන් දියත් කිරීම;

(ඒ) දිවි නැගුම ප්‍රතිලාභීන්ගේ ආර්ථික දියුණුව සඳහා වන ව්‍යාපෘති සහ වැඩසටහන් සැලසුම් කිරීමේ දී සහ කළමනාකරණය කිරීමේ දී දිවි නැගුම ප්‍රතිලාභීන්ගේ සහභාගිත්වය ලබා ගැනීම;

(ඔ) යම් රජයේ දෙපාර්තමේන්තුවක්, සංස්ථාවක්, පළාත් පාලන ආයතනයක්, පෞද්ගලික අංශයේ සංවිධානයක් හෝ රාජ්‍ය නොවන සංවිධානයක් විසින් දිවි නැගුම ප්‍රතිලාභීන්හට සපයන සේවා සඳහා පහසුකම් සැලැස්වීම; සහ

(ඕ) දිවි නැගුම ප්‍රතිලාභීන්ගේ ඉතිරි කිරීමේ පුරුදු වර්ධනය කිරීම සහ ණය ප්‍රදානය කිරීම සඳහා ආයතනික රාමුවක් නිර්මාණය කිරීමට සහාය වීම.

7. (1) දිවි නැගුම සංවර්ධන වැඩසටහන්වල ප්‍රතිපත්තිය සහ කළමනාකරණයට අදාළ කරුණු සම්බන්ධයෙන්, අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ මෙහෙයවීමට යටත්ව, දෙපාර්තමේන්තුවට සහායවීම සඳහා දිවි නැගුම ජාතික සභාවක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) අමාත්‍ය මණ්ඩලය විසින් විධිවිධාන සලස්වනු ලබන සහ තීරණය කරනු ලබන ආණ්ඩුවේ ප්‍රතිපත්තිවලට අනුකූලව අමාත්‍යවරයා විසින් නිකුත් කරනු ලැබිය හැකි යම් විධානවලට අනුව දිවිනැගුම ජාතික සභාව කටයුතු කළ යුතු ය.

(3) දිවි නැගුම ජාතික සභාව පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය:–

(අ) සභාවේ සභාපතිවරයා විය යුතු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ-ජනරාල්වරයා;

(ආ) දෙපාර්තමේන්තුවේ ක්ෂුද්‍ර මූල්‍ය විෂයය භාර අධ්‍යක්ෂවරයා;

(ඇ) දෙපාර්තමේන්තුවේ දිවි නැගුම ප්‍රජාමූල සංවිධාන විෂයය භාර අධ්‍යක්ෂවරයා;

(ඈ) දෙපාර්තමේන්තුවේ ජීවනෝපාය විෂයය භාර අධ්‍යක්ෂවරයා;

(ඉ) මුදල් විෂයය පවරා ඇත්තා වූ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ අනුයෝජිතයකු;

(ඊ) අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ අනුයෝජිතයකු; සහ

(උ) අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන තැනැත්තන් පස්දෙනකු.

8. (1) මේ පනතේ විධිවිධාන කාර්යක්ෂම ලෙස සහ නිසි පරිදි ක්‍රියාත්මක වීම සහතික කිරීමේ කාර්ය සඳහා ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින්, සමස්ත දිවයිනම ආවරණය කරමින් දිස්ත්‍රික්ක දෙකක් හෝ වැඩි ගණනක පරිපාලන ක්‍රියාකාරකම් ඒකාබද්ධ කරනු ලබන පරිපාලන කලාප පිහිටුවනු ලැබිය හැකි ය.

(2) එසේ පිහිටුවනු ලබන එක් එක් කලාපයක් සඳහා කලාපය භාරව කටයුතු කිරීම සඳහා ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක ප්‍රධානියකුට සමාන තත්වයක් ඇති කලාප ප්‍රධානියකු අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරනු ලැබිය යුතු ය.

II වන කොටස

## දිවි නැගුම ප්‍රජාමූල සංවිධාන

9. දිවි නැගුම ප්‍රතිලාභීන්ගේ ස්වේච්ඡා සහභාගිත්වයෙන් යුතුව, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියෝගයක් මගින් අමාත්‍යවරයා විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි පරිදි එක් එක් ග්‍රාම නිලධාරී කොට්ඨාසයක් සඳහා හෝ ග්‍රාම නිලධාරී කොට්ඨාසයක යම් කොටසක් සඳහා හෝ ග්‍රාම නිලධාරී කොට්ඨාස කිහිපයක් සඳහා දිවි නැගුම ප්‍රජාමූල සංවිධාන පිහිටුවනු ලැබිය යුතු ය.

10. දිවි නැගුම ප්‍රජාමූල සංවිධානවල පරමාර්ථ විය යුත්තේ :–

(අ) ස්වකීය බල ප්‍රදේශය තුළ පදිංචිව සිටින දිවි නැගුම ප්‍රතිලාභීන්ගේ සමාජයීය සහ ආර්ථික තත්ත්වය වැඩිදියුණු කිරීම;

(ආ) ජීවනෝපාය සංවර්ධන අවස්ථා සහ ඒවායේ ශක්‍යතාවයන් හඳුනාගැනීම;

(ඇ) දෙපාර්තමේන්තුවේ මඟපෙන්වීම යටතේ ජීවනෝපාය සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය වන උපකාර සහ ආධාර සැපයීම;

(ඈ) ජීවනෝපාය කටයුතු ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය වන භෞතික සහ මානව සම්පත් සංවර්ධනය කිරීම;

(ඉ) දිවි නැගුම ප්‍රතිලාභීන්ගේ ඉතිරි කිරීමේ පුරුදු වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය විය හැකි අවස්ථා සලසා දීම;

(ඊ) ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් ලබා ගැනීම සඳහා පවතින අවස්ථා පුළුල් කිරීම සහ ආයෝජන හැකියාවන් වැඩිදියුණු කිරීම;

(උ) දිවි නැගුම ප්‍රතිලාභීන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල අධ්‍යාපන මට්ටම සහ කුසලතා නගාසිටුවීම;

(ඌ) නිෂ්පාදනය සහ ඵලදායීතාවය ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය විය හැකි අමුද්‍රව්‍ය, උපදේශන සේවා සහ තාක්ෂණික පහසුකම් සැපයීම;

(එ) දිවි නැගුම ප්‍රතිලාභීන්ගේ නිෂ්පාදන ගබඩා කිරීම සහ සකස් කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සහ එම නිෂ්පාදන අලෙවිකරණය ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම; සහ

(ඒ) දිවි නැගුම ප්‍රතිලාභීන්ගේ ආත්ම විශ්වාසය, සමාජය කෙරෙහි සාමූහික වගකීම, යහපත් ගුණාංග සහ ගුණධර්ම ප්‍රවර්ධනය කිරීම.

11. දෙපාර්තමේන්තුවේ විධානයට සහ අධීක්ෂණයට යටත්ව දිවි නැගුම ප්‍රජාමූල සංවිධානවල බලතල විය යුත්තේ :–

(අ) දිවි නැගුම ප්‍රතිලාභීන් කුඩා කණ්ඩායම් වශයෙන් සංවිධානය කිරීම;

(ආ) එම කුඩා කණ්ඩායම්වලට දිවි නැගුම ප්‍රජා මූල සංවිධානය තුළ පිළිගැනීමක් ලබා දීම;

(ඇ) දිවි නැගුම ප්‍රතිලාභීන් සඳහා සමාජ ආරක්ෂණ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම;

(ඈ) මේ පනතේ 25 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ දිවි නැගුම ප්‍රජා මූල බැංකුවලින් ණය මුදල් ලබා ගැනීම සඳහා දිවි නැගුම ප්‍රතිලාභීන්ට අවශ්‍ය සහාය ලබා දීම;

(ඉ) ජීවනෝපාය කටයුතු සඳහා දිවි නැගුම ප්‍රතිලාභීන් විසින් ලබා ගනු ලබන ණය මුදල් අධීක්ෂණය කිරීම සහ නියාමනය කිරීම;

(ඊ) ස්වකීය සාමාජිකයන්ගේ කුසලතා සහ දැනුම දියුණු කිරීම සඳහා ක්‍රියාත්මක කරනු ලැබිය හැකි වැඩසටහන් සඳහා සම්පත් සහ පහසුකම් සැපයීම;

(උ) දිවි නැගුම ප්‍රතිලාභීන්ගේ සාමාජිකත්ව ගාස්තු සහ ඉතිරිකිරීම් එකතු කිරීම සහ කළමනාකරණය කිරීම;

(ඌ) දිවි නැගුම ප්‍රතිලාභීන්ගේ ශුභසිද්ධිය උදෙසා දෙපාර්තමේන්තුව සහ වෙනත් පිළිගත් ආයතන විසින් ආරම්භ කරන ලද වැඩ සටහන් භාරගෙන ක්‍රියාත්මක කිරීම;

(එ) ආණ්ඩුව, රාජ්‍ය නොවන ආයතන සහ පෞද්ගලික ආයතන විසින් සපයනු ලබන ප්‍රදාන සහ ණය මුදල් වැනි සහයෝගයන් භාර ගැනීම;

(ඒ) අරමුදල් ප්‍රවර්ධනය කර ගැනීම සඳහා රජය සහ වෙනත් පිළිගත් ආයතන විසින් දිවි නැගුම ප්‍රජා මූල සංවිධාන වෙත ලබාදෙන කොන්ත්‍රාත්තු භාරගෙන ක්‍රියාත්මක කිරීම;

(ඔ) ප්‍රජා ශ්‍රම දායකත්වයෙන් යුතුව දියත් කරනු ලබන සංවර්ධන වැඩ සටහන් භාරගෙන ක්‍රියාත්මක කිරීම;

(ඕ) නිෂ්පාදන මිල දී ගැනීම, ඒවා නැවත සකස් කිරීම සහ ඒවාට වටිනාකම එකතු කිරීමට අදාළ පහසුකම්, සේවා සහ තාක්ෂණික සේවා සැපයීම;

(ක) අලෙවි මධ්‍යස්ථාන සහ ගබඩා පවත්වාගෙන යාම සහ අලෙවිකරණය ප්‍රවර්ධනය සඳහා වෙළඳසැල් සහ වෙළඳපොළ සංවිධානය කිරීම;

(ග) සමාජ ආරක්ෂණ වැඩ සටහන් සඳහා දිවි නැගුම ප්‍රජා මූල සංවිධානවල මානව සහ භෞතික සම්පත් ප්‍රයෝජනයට ගැනීම;

(ච) දිවි නැගුම ප්‍රජා මූල සංවිධානවල කාර්යාලයක් පවත්වාගෙන යාම; සහ

(ඡ) යම් මිල දී ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නීයාදනයක් මගින් හෝ අන්‍යාකාරයකින් එයට පවරනු ලැබිය හැකි යම් චංචල හෝ නිශ්චල දේපළක් සන්තකයට ගැනීම සහ දැරීම.

12. දිවි නැගුම ප්‍රජා මූල සංවිධානවල කර්තව්‍ය විය යුත්තේ :–

(අ) අන්‍යෝන්‍ය සහයෝගයෙන් ක්‍රියාත්මක වන්නා වූ කුඩා කණ්ඩායම්වලට සංවිධානය වීම සඳහා ස්වකීය සාමාජිකයන්ව උනන්දු කරවීම සහ ඔවුන්ට මාර්ගෝපදේශ සැපයීම;

(ආ) ස්වකීය සාමාජිකයන්ගේ ඉතිරි කිරීමේ පුරුදු වැඩි දියුණු කර ගැනීම සඳහා උනන්දු කරවීම, ජීවනෝපාය ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම සහ එවැනි කටයුතු සඳහා සහාය ලබාදීම;

(ඇ) ස්වකීය සාමාජිකයන්ගේ වෘත්තීය කුසලතා සහ දැනුම වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය විය හැකි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම;

(ඈ) ස්වකීය සාමාජිකයන්ගේ සහභාගිත්වයෙන් යුතුව ශ්‍රමදාන ක්‍රියාකාරකම් සංවිධානය කිරීම; සහ

(ඉ) නිෂ්පාදන සහ අලෙවිකරණ කටයුතු සඳහා පහසුකම් සැපයීම.

13. දිවි නැගුම ප්‍රජාමූල සංවිධානවල අරමුදල් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන නියෝගවලට අනුකූලව දිවි නැගුම ප්‍රජා මූල බැංකුවක තැන්පත් කර පවත්වාගෙන යා යුතු ය.

14. යම් දිවි නැගුම ප්‍රජා මූල සංවිධානයක් එහි පරමාර්ථ ඉෂ්ට වන ආකාරයට ක්‍රියාත්මක නොවන අවස්ථාවක දී, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඒ අක්‍රීය දිවි නැගුම ප්‍රජාමූල සංවිධානය අයත්වන දිවි නැගුම ප්‍රාදේශීය සංවිධානය විමසා, ඒ අක්‍රීය දිවි නැගුම ප්‍රජාමූල සංවිධානය ඊට ආසන්නතම ක්‍රියාකාරී දිවි නැගුම ප්‍රජාමූල සංවිධානය සමඟ බද්ධ කිරීමට සැලැස්වීම හෝ ඒ අක්‍රීය දිවි නැගුම ප්‍රජාමූල සංවිධානයේ කර්තව්‍ය බාධාවකින් තොරව ඉටුකිරීම සඳහා දෙපාර්තමේන්තුවේ නිලධරයකු පත්කිරීම හෝ කරනු ලැබිය යුතු ය.

III වන කොටස

## දිවි නැගුම ප්‍රාදේශීය සංවිධාන

15. (1) දිවි නැගුම ප්‍රජා මූල සංවිධානවල කර්තව්‍ය ප්‍රාදේශීය මට්ටමින් අධීක්ෂණය කිරීම, පරීක්ෂා කිරීම සහ ඇගැයීමේ කාර්ය සඳහා පහකට අඩු නොවන දිවි නැගුම ප්‍රජා මූල සංවිධාන සංඛ්‍යාවකින් සමන්විත වන දිවි නැගුම ප්‍රාදේශීය සංවිධාන අවශ්‍ය විය හැකි සංඛ්‍යාවක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) සෑම දිවි නැගුම ප්‍රාදේශීය සංවිධානයක්ම පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය:–

(අ) එක් එක් දිවි නැගුම ප්‍රජා මූල සංවිධානයේ සභාපතිවරයා;

(ආ) ප්‍රදේශයක් භාර දෙපාර්තමේන්තුවේ නිලධරයා;

(ඇ) මේ පනතේ 29 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ දිවි නැගුම ප්‍රජා මූල බැංකු සමිතියේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරවරයා; සහ

(ඈ) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නම් කරනු ලබන, ප්‍රදේශයේ සංවර්ධන කටයුතුවල යෙදී සිටින තැනැත්තන් තුන්දෙනකු.

(3) ඒ එක් එක් දිවි නැගුම ප්‍රාදේශීය සංවිධානවල සභාපතිවරයා සහ ලේකම්වරයා (2) වන උපවගන්තියේ සඳහන් සාමාජිකයන් අතරින් තෝරා පත් කර ගත යුතු ය.

(4) ඒ එක් එක් දිවි නැගුම ප්‍රාදේශීය සංවිධානය පිහිටුවනු ලැබ ඇත්තේ යම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් තුළ ද ඒ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්වරයා ඒ එක් එක් දිවි නැගුම ප්‍රාදේශීය සංවිධානයේ උපදේශකවරයකු ලෙස ක්‍රියාකළ යුතු ය.

16. සෑම ප්‍රාදේශීය සංවිධානයකම පරමාර්ථ විය යුත්තේ දෙපාර්තමේන්තුවේ මගපෙන්වීම සහ අධීක්ෂණය යටතේ :–

(අ) යම් ප්‍රජාමූල සංවිධානයක ජීවනෝපාය සංවර්ධන ක්‍රියාකාරකම් පවත්වාගෙන යාම සඳහා එම සංවිධානයට අවශ්‍ය සහාය ලබාදීම;

(ආ) ස්වකීය සාමාජිකයන්ගේ ජීවනෝපාය නංවාලීම සම්බන්ධයෙන් වූ සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය විය හැකි ඇතැම් මානව සම්පත් වර්ධනය කිරීම;

(ඇ) ස්වකීය බල ප්‍රදේශය තුළ ක්ෂුද්‍ර මූල්‍ය කටයුතු ප්‍රවර්ධනය සහ අධීක්ෂණය කිරීමට දෙපාර්තමේන්තුවට සහාය ලබා දීම;

(ඈ) නිෂ්පාදන මිල දී ගැනීමට, ප්‍රති සැකසීමට සහ ඒවාට අගය එකතු කිරීමට සහ ප්‍රාදේශීය මට්ටමින් ඒ නිෂ්පාදන ගබඩා කිරීමට, සැකසීමට සහ අලෙවිකරණයට පහසුකම් සැලසීම; සහ

(ඉ) දිවි නැගුම ප්‍රතිලාභීන්ගේ මානව පෞරුෂය, සාමූහික ක්‍රියාකාරකම්, දැහැමි සහ අධ්‍යාත්මික ගුණාංග වැඩිදියුණු කිරීම.

17. සෑම දිවි නැගුම ප්‍රාදේශීය සංවිධානයකම කර්තව්‍ය විය යුත්තේ දෙපාර්තමේන්තුවේ මඟ පෙන්වීම සහ අධීක්ෂණය යටතේ :–

(අ) ස්වකීය බල ප්‍රදේශ තුළ ආර්ථික සහ සමාජ සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් අවශ්‍ය විය හැකි යම් අධ්‍යයන කටයුතු කරගෙන යාම සහ තොරතුරු රැස් කිරීම;

(ආ) යම් දිවි නැගුම ප්‍රජා මූල සංවිධානයක් විසින් ක්‍රියාත්මක කරන්නා වූ ජීවනෝපාය සංවර්ධන කටයුතු පිළිබඳ සමාලෝචනය කිරීම;

(ඇ) ස්වකීය බල ප්‍රදේශ තුළ ක්ෂුද්‍ර මූල්‍ය කටයුතු ප්‍රවර්ධනය කිරීමේ දී අවශ්‍ය විය හැකි යම් සහාය ලබාදීම;

(ඈ) වෘත්තීය නිපුණතා සහ ප්‍රායෝගික දැනුම වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය වන වැඩසටහන් සංවිධානය කිරීමේ දී සහ ක්‍රියාත්මක කිරීමේදී යම් දිවි නැගුම ප්‍රජා මූල සංවිධානයකට අවශ්‍ය විය හැකි යම් සහාය ලබාදීම;

(ඉ) ප්‍රදේශය තුළ ස්වකීය ප්‍රතිලාභීන්ගේ කෘෂිකාර්මික හෝ වෙනත් යම් නිෂ්පාදන වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය විය හැකි යම් තාක්ෂණික සහාය සහ වෙනත් සේවාවන් සැපයීම;

(ඊ) නිෂ්පාදන සහ අමුද්‍රව්‍ය මිල දී ගැනීම, ගබඩා කිරීම, අලෙවි කිරීම සඳහා මධ්‍යස්ථාන පවත්වාගෙන යාම සහ අලෙවි මධ්‍යස්ථාන සහ සාප්පු සංකීර්ණ සංවිධානය කිරීම;

(උ) දිවි නැගුම ප්‍රජා මූල සංවිධානවල සියලු ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම සහ නියාමනය කිරීම;

(ඌ) අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි යම් නියෝගවලට යටත්ව එවැනි සංවිධානවල අරමුදලක් පිහිටුවා පවත්වාගෙන යාම;

(එ) දෙපාර්තමේන්තුව සහ වෙනත් යම් පිළිගත් ආයතනයක් විසින් දියත් කරන ලද යම් ව්‍යාපෘති භාර ගැනීම සහ ක්‍රියාත්මක කිරීම;

(ඒ) අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි යම් නියෝගවලට යටත්ව රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධානවලින් පිරිනමනු ලබන ආධාර, ප්‍රදාන සහ ණය පිළිගැනීම;

(ඔ) දෙපාර්තමේන්තුව විසින් නියම කරනු ලැබිය හැකි යම් විධානවලට යටත්ව දෙපාර්තමේන්තුව විසින් හෝ වෙනත් පිළිගත් ආයතනයක් විසින් ඉදිරිපත් කරනු ලබන යම් කොන්ත්‍රාත්තුවක් භාර ගැනීම සහ ක්‍රියාත්මක කිරීම;

(ඕ) දිවි නැගුම ප්‍රාදේශීය සංවිධානයේ කාර්යාලයක් පිහිටුවීම සහ පවත්වාගෙන යාම;

(ක) දිවි නැගුම ප්‍රාදේශීය සංවිධානයේ මුදල් දිවි නැගුම ප්‍රජා මූල බැංකු සමිතියක තැන්පත් කිරීම සහ ඒ තැන්පතු සම්බන්ධයෙන් ගිණුම් පවත්වාගෙන යාම;

(ග) සමාජ ආරක්ෂණ වැඩසටහන් සඳහා සංවිධානයේ මානව සහ භෞතික සම්පත් ප්‍රායෝගිකව භාවිත කිරීම; සහ

(ච) යම් මිල දී ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නීයාදනයක් හෝ අන්‍යාකාරයකින් එයට පවරනු ලැබිය හැකි යම් චංචල හෝ නිශ්චල දේපළක් සන්තකයට ගැනීම සහ දැරීම.

18. දිවි නැගුම ප්‍රාදේශීය සංවිධානයේ කර්තව්‍ය විය යුත්තේ දෙපාර්තමේන්තුවේ මඟපෙන්වීම සහ අධීක්ෂණය යටතේ :–

(අ) දිවි නැගුම ප්‍රජා මූල සංවිධානය මගින් මෙහෙයවනු ලබන කුඩා කණ්ඩායම් වැඩසටහන් සම්බන්ධයෙන් උපදේශකත්වය සහ අනුබලය සැපයීම;

(ආ) දිවි නැගුම ප්‍රජාමූල සංවිධානයන්හි ඉතිරි කිරීම් අධීක්ෂණය කිරීම සහ පරීක්ෂා කිරීම;

(ඇ) ජීවනෝපාය සංවර්ධනය කිරීමේ කටයුතු උසස් කිරීම සඳහා එවැනි සංවිධාන මගින් කරගෙන යනු ලබන කාර්ය වෙනුවෙන් සහ එම කාර්ය අධීක්ෂණය සහ පරීක්ෂා කිරීම වෙනුවෙන් ස්වකීය අධිකාරි බල ප්‍රදේශය තුළ පිහිටා ඇති යම් දිවි නැගුම ප්‍රජා මූල සංවිධානවලට අවශ්‍ය වන යම් සහාය සැපයීම;

(ඈ) එහි සාමාජිකයන්ගේ වෘත්තීය නිපුණතා සහ ප්‍රායෝගික දැනීම වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය වන ප්‍රාදේශීය මට්ටමේ වැඩසටහන් සංවිධානය කිරීම සහ ක්‍රියාත්මක කිරීම;

(ඉ) ප්‍රාදේශීය මට්ටමින් නිෂ්පාදන වැඩි දියුණු කිරීම සඳහා අමු ද්‍රව්‍ය, තාක්ෂණය සහ වෙනත් ආශ්‍රිත සේවාවන් සැපයීම සහ එම නිෂ්පාදන අලෙවි කිරීම සඳහා පහසුකම් සැලසීම;

(ඊ) දිවි නැගුම ප්‍රජා මූල සංවිධාන මගින් ක්‍රියාත්මක කරන්නා වූ සමාජ ආරක්ෂණ වැඩසටහන් සඳහා සහාය සැපයීම;

(උ) අදාළ ප්‍රදේශය සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ වාර්තා සැකසීමට සහාය වීම; සහ

(ඌ) දිවි නැගුම ප්‍රාදේශීය සංවිධානවල පරමාර්ථ ඉටු කර ගැනීමේ කාර්යය සඳහා ප්‍රාදේශීය මට්ටමින් වෙනත් රාජ්‍ය සහ රාජ්‍ය නොවන සහ පෞද්ගලික සංවිධාන අතර සම්බන්ධීකරණය ඇති කිරීම.

## IV වන කොටස
## දිවි නැගුම දිස්ත්‍රික් කමිටු

19. (1) දිස්ත්‍රික්කයක් ඇතුළත ක්‍රියාත්මක වන සියලු දිවි නැගුම ප්‍රාදේශීය සංවිධාන නියෝජනය කරන දිවි නැගුම දිස්ත්‍රික් කමිටු මේ පනතේ කාර්ය සඳහා පිහිටුවනු ලැබිය යුතු ය.

(2) එක් එක් දිස්ත්‍රික් කමිටු පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය :–

(අ) එක් එක් දිස්ත්‍රික්කය තුළ තිබෙන සියලු දිවි නැගුම ප්‍රාදේශීය සංවිධානවල සියලු සභාපතිවරු සහ ලේකම්වරු;

(ආ) එක් එක් දිස්ත්‍රික්කය තුළ තිබෙන මේ පනතේ 29 වන වගන්තිය යටතේ පිහිටුවන ලද සියලු දිවි නැගුම ප්‍රජා මූල බැංකු සමිතිවල ජ්‍යෙෂ්ඨ කළමණාකාරවරු; සහ

(ඇ) අදාළ දිස්ත්‍රික්කය භාරව සිටින දෙපාර්තමේන්තුවේ නිලධරයා; සහ

(ඈ) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නම් කරනු ලබන, දිස්ත්‍රික්කයේ සංවර්ධන කටයුතුවල යෙදී සිටින තැනැත්තන් තුන්දෙනකු.

(3) එවැනි එක් එක් දිවි නැගුම දිස්ත්‍රික් කමිටුව පිහිටා ඇත්තේ යම් දිස්ත්‍රික් ලේකම්වරයකුගේ බල ප්‍රදේශය තුළ ද ඔහු එවැනි එක් එක් දිස්ත්‍රික් කමිටුවේ උපදේශකවරයකු ලෙස ක්‍රියා කළ යුතු ය.

20. දිවි නැගුම දිස්ත්‍රික් කමිටුවල පරමාර්ථ විය යුත්තේ, දෙපාර්තමේන්තුවේ මඟපෙන්වීම සහ අධීක්ෂණය යටතේ :–

(අ) දිවි නැගුම ප්‍රාදේශීය සංවිධාන සහ දිවි නැගුම ප්‍රජා මූල සංවිධාන මාර්ගයෙන් මේ පනතේ නිශ්චිතව සඳහන් වන යම් පරමාර්ථ ඉටු කර ගැනීමට අවශ්‍ය විය හැකි යම් පියවර ගැනීම;

(ආ) අදාළ දිස්ත්‍රික්කය තුළ දිවි නැගුම ප්‍රජා මූල සංවිධානවල සහ දිවි නැගුම ප්‍රාදේශීය සංවිධානවල වැඩ සටහන් අධීක්ෂණය කිරීම, නියාමනය කිරීම සහ ඇගයීම;

(ඇ) දිවි නැගුම ප්‍රාදේශීය සංවිධානවලට සහ දිවි නැගුම ප්‍රජා මූල සංවිධානවලට සම්බන්ධ දිස්ත්‍රික් මට්ටමේ වෙනත් රාජ්‍ය සංවිධානවල සහයෝගීතාව සහතික කිරීම; සහ

(ඈ) අදාළ දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වන දිවි නැගුම ප්‍රජා මූල සංවිධානවල සහ දිවි නැගුම ප්‍රාදේශීය සංවිධානවල වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම.

21. එක් එක් දිවි නැගුම දිස්ත්‍රික් කමිටුවේ බලතල විය යුත්තේ:–

(අ) සෑම තුන් මසකට වරක් කමිටුවේ රැස්වීම් කැඳවීම සහ පැවැත්වීම;

(ආ) අදාළ දිස්ත්‍රික්කය තුළ දිවි නැගුම ප්‍රාදේශීය සහ ප්‍රජා මූල සංවිධානවලින් වාර්තා ලබා ගැනීම;

(ඇ) දිවි නැගුම ප්‍රජා මූල සංවිධාන අධීක්ෂණය, පාලනය සහ ඇගැයීම සඳහා දෙපාර්තමේන්තුවට සහාය වීම; සහ

(ඈ) දෙපාර්තමේන්තුව වෙනුවෙන් සහ දෙපාර්තමේන්තුව උදෙසා දිවි නැගුම සංවර්ධන වැඩසටහන පිළිබඳ අධ්‍යයනයක් සිදුකිරීම සහ දෙපාර්තමේන්තුව වෙත අවශ්‍ය විය හැකි යම් සංවර්ධන යෝජනා ඉදිරිපත් කිරීම.

22. එක් එක් දිවි නැගුම දිස්ත්‍රික් කමිටුවේ කර්තව්‍ය විය යුත්තේ :–

(අ) අදාළ දිස්ත්‍රික්කය තුළ දිවි නැගුම සංවර්ධන වැඩසටහන සහ ව්‍යාපෘති පිළිබඳ අධ්‍යයන පැවැත්වීම;

(ආ) දිවි නැගුම සංවර්ධන වැඩසටහන් කිසිවක් ක්‍රියාවට නැගීමේ දී අවශ්‍ය කරනු ලැබිය හැකි පරිදි වෙනත් යම් දිස්ත්‍රික් මට්ටමේ රාජ්‍ය, රාජ්‍ය නොවන සහ පෞද්ගලික ආයතන සමග සම්බන්ධීකරණය පැවැත්වීම;

(ඇ) අදාළ දිස්ත්‍රික්කය තුළ දිවි නැගුම සංවර්ධන වැඩසටහන් කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා වූ යෝජනා සහ මත සලකා බැලීම සහ ඒවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම; සහ

(ඈ) අදාළ දිස්ත්‍රික්කය සම්බන්ධයෙන් මාසික ප්‍රගති සමාලෝචන වාර්තාවක් සකස් කිරීම සහ ප්‍රගති සමාලෝචන රැස්වීම් කැඳවීම.

## V වන කොටස
## **දිවි නැගුම ජාතික සම්මේලනය**

23. සියලු දිවි නැගුම ප්‍රජා මූල සංවිධානවල අනුයෝජිතයන්ගෙන් සමන්විත වන දිවි නැගුම ජාතික සම්මේලනයක් පිහිටුවනු ලැබිය යුතු ය. අමාත්‍යවරයා දිවි නැගුම ජාතික සම්මේලනයේ සෑම රැස්වීමකම මුලසුන දැරිය යුතු ය.

24. ජාතික මට්ටමින් දිවි නැගුම සංවර්ධන වැඩසටහන් සම්බන්ධීකරණය කිරීමේ ජාතික ප්‍රතිපත්තියක් සැලසුම් කිරීම සඳහා අවශ්‍ය වන යෝජනා සහ මත සමාලෝචනය කිරීම සහ දිවි නැගුම සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා නායකත්වය සැපයීම දිවි නැගුම ජාතික සම්මේලනයේ පරමාර්ථය විය යුතු ය.

## VI වන කොටස
## **දිවි නැගුම ප්‍රජා මූල බැංකු**

25. (1) ස්වකීය ප්‍රතිලාභීන් අතර ක්ෂුද්‍ර මූල්‍ය කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා දිවි නැගුම ප්‍රජා මූල සංවිධාන එකක් හෝ ඊට වැඩි ගණනක බල ප්‍රදේශය ආවරණය කරමින් එවැනි එක් එක් ප්‍රදේශ සඳහා දිවි නැගුම ප්‍රජා මූල බැංකු පිහිටුවිය යුතු ය.

(2) එම බැංකුවල ලියාපදිංචි කිරීමේ ක්‍රියාපටිපාටිය සහ ඒ ක්‍රියාපටිපාටියට අදාළ වෙනත් යම් කාරණා අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය යුතු ය.

(3) එවැනි සෑම බැංකුවක්ම එයට පවරා දී ඇති නාමයෙන් සංස්ථාපිත මණ්ඩලයක් විය යුතු අතර අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් තිබිය යුතු අතර එකී නාමයෙන් නඩු පැවරීම සහ එයට එරෙහිව නඩු පවරනු ලැබීම කළ හැකි ය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලැබිය හැකි යම් නියෝගවලට අනුකූලවීම එවැනි සෑම බැංකුවකම වගකීම විය යුතු ය.

26. දිවි නැගුම ප්‍රජා මූල බැංකුවල පරමාර්ථ විය යුත්තේ :–

(අ) දිවි නැගුම ප්‍රතිලාභීන්ගේ ඉතිරි කිරීමේ පුරුද්ද ප්‍රවර්ධනය කිරීම;

(ආ) ආයෝජන හැකියාව වැඩි දියුණු කිරීම;

(ඇ) නිෂ්පාදන හැකියාව වැඩි දියුණු කිරීම මගින් ආදායම වර්ධනය කිරීම; සහ

(ඈ) දිවි නැගුම ප්‍රතිලාභීන්ට ණය පහසුකම් සැපයීම.

27. සෑම දිවි නැගුම ප්‍රජා මූල බැංකුවකම බලතල විය යුත්තේ :–

(අ) සාමාජික ගිණුම් ආරම්භ කිරීම සහ පවත්වාගෙන යාම සහ ගිණුම් වසා දැමීම, තැන්පතු භාරගැනීම සහ දිවි නැගුම ප්‍රතිලාභීන් සහ එවැනි බැංකුවල සාමාජිකයන් වෙත බැංකු පාස් පොත් නිකුත් කිරීම;

(ආ) ඇප ඇතිව හෝ නැතිව ණය පහසුකම් ලබා දීම, ණය අයකර ගැනීම, එම කටයුතු කළමනාකරණය කිරීම සහ මෙහෙයවීම;

(ඇ) දිවි නැගුම ප්‍රජා මූල සංවිධානවල අරමුදල් භාර ගැනීම සහ ඒවා කළමනාකරණය කිරීම;

(ඈ) රජය විසින් සපයනු ලැබිය හැකි යම් සහනාධාර සහ මුදල් වෙනුවෙන් ගිණුම් පවත්වාගෙන යාම;

(ඉ) දිවි නැගුම ප්‍රජා මූල බැංකුවල අරමුදල්, දිවි නැගුම බැංකු සමිති තුළ ආයෝජනය කිරීම; සහ

(ඊ) යම් මිල දී ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නීයාදනයක් මගින් හෝ අන්‍යාකාරයකින් එයට පවරනු ලැබිය හැකි යම් චංචල හෝ නිශ්චල දේපළක් සන්තකයට ගැනීම සහ දැරීම.

28. දිවි නැගුම ප්‍රජා මූල බැංකුවල කර්තව්‍ය විය යුත්තේ:–

(අ) දිවි නැගුම ප්‍රතිලාභීන් ඉතිරි කිරීම සඳහා උනන්දු කිරීම;

(ආ) පුද්ගල සහ කණ්ඩායම් මට්ටමින් දිවි නැගුම ප්‍රතිලාභීන්ට ණය ලබාදීම;

(ඇ) මූල්‍ය කළමනාකරණය පිළිබඳ දිවි නැගුම ප්‍රතිලාභීන් දැනුවත් කිරීම;

(ඈ) තැන්පතුකරුවන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ ශුභසාධනය තහවුරු කිරීම;

(ඉ) එහි ගනුදෙනුකරුවන් අතර බැංකු සංස්කෘතියක් වර්ධනය කිරීම; සහ

(ඊ) රජය විසින් සපයනු ලැබිය හැකි යම් සහනාධාර බෙදා හැරීම.

## VII වන කොටස
## **දිවි නැගුම ප්‍රජාමූල බැංකු සමිති**

29. (1) ප්‍රාදේශීය මට්ටමින් ජීව්‍ය ක්ෂුද්‍ර මූල්‍ය බැංකු ජාලයක් පිහිටුවීම සඳහා, එක් එක් දිවි නැගුම ප්‍රාදේශීය සංවිධානවල බල ප්‍රදේශ තුළ පිහිටා ඇති දිවි නැගුම ප්‍රජා මූල බැංකු සියල්ල ඇතුළත් කරමින් දිවි නැගුම ප්‍රජා මූල බැංකු සමිති මේ පනතේ කාර්ය සඳහා පිහිටුවනු ලැබිය යුතු ය.

(2) එම බැංකු සමිති ලියාපදිංචි කිරීමේ ක්‍රියා පටිපාටිය සහ ඒ ක්‍රියාපටිපාටියට අදාළ වෙනත් යම් කාරණා අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය යුතු ය.

(3) එවැනි සෑම බැංකු සමිතියක්ම එයට පවරා දී ඇති නාමයෙන් සංස්ථාපිත මණ්ඩලයක් විය යුතු අතර අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් තිබිය යුතු අතර එකී නාමයෙන් නඩු පැවරීම හෝ එයට එරෙහිව නඩු පවරනු ලැබීම කළ හැකි ය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලැබිය හැකි යම් නියෝගවලට අනුකූලවීම එවැනි සෑම බැංකු සමිතියකම වගකීම විය යුතු ය.

30. දිවි නැගුම ප්‍රජා මූල බැංකු සමිතිවල පරමාර්ථ විය යුත්තේ :–

(අ) දිවි නැගුම ප්‍රජා මූල බැංකු සම්බන්ධීකරණය කරමින් ජීව්‍ය ප්‍රාදේශීය බැංකු ජාලයක් පිහිටු වීම;

(ආ) දිවි පෙවෙත වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය යම් මූල්‍යමය සහයක් සැපයීම; සහ

(ඇ) විධිමත් ක්ෂුද්‍ර මූල්‍ය බැංකු කටයුතුවලට සම්බන්ධවීමට දිවි නැගුම ප්‍රතිලාභීන් පෙළඹවීම.

31. දිවි නැගුම ප්‍රජා මූල බැංකු සමිතිවල බලතල විය යුත්තේ :–

(අ) දිවි නැගුම ප්‍රජා මූල බැංකුවල තැන්පතු භාර ගැනීම;

(ආ) එහි අරමුදල් ආයෝජනය කිරීම, ණය පහසුකම් ප්‍රදානය කිරීම සහ ලාභ ගෙවීම;

(ඇ) දිවි නැගුම ප්‍රජා මූල බැංකුවල ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය වන්නා වූ ඇතැම් පහසුකම් සහ පුහුණුවීම් සැපයීම;

(ඈ) දිවි නැගුම ප්‍රජා මූල බැංකුවල ගිණුම් පවත්වාගෙන යාම සහ රජය විසින් සපයනු ලැබිය හැකි යම් සහනාධාර කළමනාකරණය කිරීම;

(ඉ) කළමනාකරණ මණ්ඩලයක් විසින් නිකුත් කරනු ලැබිය හැකි යම් නියමවලට යටත්ව දිවි නැගුම ප්‍රජා මූල බැංකු කටයුතු අධීක්ෂණය කිරීම සහ නියාමනය කිරීම; සහ

(ඊ) යම් මිලදී ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නීයාදනයක් හෝ අන්‍යාකාරයකින් එයට පවරනු ලැබිය හැකි යම් චංචල හෝ නිශ්චල දේපළක් සන්තකයට ගැනීම සහ දැරීම.

32. දිවි නැගුම ප්‍රජා මූල බැංකු සමිතිවල කර්තව්‍ය විය යුත්තේ :–

(අ) දිවි නැගුම ප්‍රජා මූල බැංකු විසින් පවත්වාගෙන යනු ලබන යම් තැන්පතු එකතු කිරීම සහ ඒවා කළමනාකරණය කිරීම;

(ආ) දිවි නැගුම ප්‍රතිලාභීන් අතර ක්ෂුද්‍ර මූල්‍ය සංස්කෘතියක් වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය විය හැකි යම් පියවර ගැනීම; සහ

(ඇ) දිවි නැගුම ප්‍රජා මූල බැංකු කටයුතු සාර්ථක ලෙස මෙහෙයවීම සඳහා ප්‍රාදේශීය ආයතනයක් ලෙස ක්‍රියාකිරීම.

33. (1) දිවි නැගුම ප්‍රජා මූල බැංකුවල සහ දිවි නැගුම ප්‍රජා මූල බැංකු සමිතිවල මූල්‍ය කටයුතු අධීක්ෂණය සහ නියාමනය කිරීමේ කාර්යය සඳහා අමාත්‍යවරයා විසින් (මේ පනතේ "කළමනාකරණ මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) දිවි නැගුම ප්‍රජා මූල බැංකු සහ දිවි නැගුම ප්‍රජා මූල බැංකු සමිති කළමනාකරණ මණ්ඩලයක් පත් කරනු ලැබිය යුතු ය.

(2) කළමනාකරණ මණ්ඩලය,

(i) පහත දැක්වෙන නිල බලයෙන් පත්වන සාමාජිකයන්ගෙන්:–

(අ) සභාපතිවරයා විය යුතු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ - ජනරාල්වරයා;

(ආ) මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුයෝජිතයකු;

(ඇ) දෙපාර්තමේන්තුවේ බැංකු කටයුතු භාර අධ්‍යක්ෂවරයා;

(ඈ) ශ්‍රී ලංකා මහ බැංකු අධිපති විසින් පත් කළ යුතු අනුයෝජිතයකු;

(ඉ) අමාත්‍යවරයාගේ ලේකම්වරයා හෝ ඔහුගේ අනුයෝජිතයකු; සහ

(ii) (මෙහි මින් මතු "පත් කළ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) අමාත්‍යවරයා විසින් පත් කළ යුතු තැනැත්තන් තුන්දෙනෙකුගෙන්

සමන්විත විය යුතු ය.

(3) සෑම පත් කළ සාමාජිකයකුගේම ධූර කාලය අවුරුදු තුනක් විය යුතු ය.

(4) යම් පත්කළ සාමාජිකයකුට අමාත්‍යවරයා අමතන ලිපියක් මගින් ස්වකීය ධූරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, ඒ ඉල්ලා අස්වීම අමාත්‍යවරයා විසින් පිළිගනු ලබන දින සිට බලාත්මක විය යුතු ය.

(5) අමාත්‍යවරයා විසින් ඒ සඳහා හේතු දක්වමින් යම් පත්කළ සාමාජිකයකු ධූරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(6) මිය යාම, ධූරයෙන් ඉල්ලා අස්වීම, අශක්නුතාවය හෝ ධූරයෙන් ඉවත් කිරීම හේතුවෙන් යම් පත්කළ සාමාජිකයකුගේ ධූරයෙහි පුරප්පාඩුවක් ඇති වන අවස්ථාවක දී, අමාත්‍යවරයා විසින් (1) වන උපවගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගෙන ඒ සාමාජිකයා වෙනුවට වෙනත් සාමාජිකයකු පත් කරනු ලැබිය යුතු ය.

(7) (6) වන උප වගන්තිය යටතේ පත් කරනු ලබන යම් සාමාජිකයකු, තමා අනුප්‍රාප්ත වනුයේ යම් සාමාජිකයකු වෙනුවෙන්ද ඒ සාමාජිකයාගේ ඉතිරි ධූර කාලය සඳහා ධූරය දැරිය යුතු ය.

(8) පත් කළ සාමාජිකයන්ට, අමාත්‍යවරයා විසින් මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා, නිශ්චය කරනු ලබන යම් පාරිශ්‍රමිකයක් ගෙවනු ලැබිය හැකි ය.

(9) කළමනාකරණ මණ්ඩලය විසින් එවැනි බැංකු සහ බැංකු සමිතිවල මූල්‍යමය කටයුතු අධීක්ෂණය සහ නියාමනය කිරීමේ කාර්යය සඳහා එවැනි බැංකු සහ බැංකු සමිති වෙත කලින් කල විධාන නිකුත් කරනු ලැබිය යුතු ය.

(10) කළමනාකරණ මණ්ඩලය ස්වකීය කාර්ය ඉටු කිරීමේ දී අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි යම් නියෝගවලට යටත් විය යුතු ය.

34. මේ පනතේ කාර්ය සඳහා සියලුම දිවි නැගුම ප්‍රජා මූල බැංකුවලින් සහ සියලුම දිවි නැගුම ප්‍රජා මූල බැංකු සමිතිවලින් සමන්විත දිවි නැගුම ප්‍රජා මූල බැංකු මහා සංගමයක් පිහිටුවනු ලැබිය යුතු ය.

35. 1988 අංක 30 දරන බැංකු පනතේ විධිවිධාන සහ 2011 අංක 42 දරන මූල්‍ය ව්‍යාපාර පනතේ විධිවිධාන මේ පනතේ විධිවිධාන යටතේ පිහිටුවනු ලැබූ බැංකු සහ බැංකු සමිති සම්බන්ධයෙන් අදාළ කරගනු නොලැබිය යුතු ය.

## VIII වන කොටස
## දෙපාර්තමේන්තුවේ අරමුදල්

36. (1) මේ පනතේ කාර්ය සඳහා "දිවි නැගුම සංවර්ධන අරමුදල" යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු ය. ඒ අරමුදලට ආණ්ඩුව විසින් කලින් කල සපයනු ලැබිය හැකි සියලු මුදල් ප්‍රමාණ බැර කරනු ලැබිය යුතු ය.

(2) (අ) දෙපාර්තමේන්තුවට ලැබෙන සියලු ප්‍රදානයන් සහ ත්‍යාග;

(ආ) මේ පනත යටතේ පිහිටුවන ලද බැංකු සහ බැංකු සමිති විසින් ලබා දෙන සියලු ත්‍යාග සහ වෙනත් දායක මුදල්;

(ඇ) මේ පනත යටතේ පිහිටුවන ලද බැංකු සහ බැංකු සමිතිවල ලාභයෙන් අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් මුදල් ප්‍රතිශතයක්; සහ

(ඈ) මේ පනත යටතේ ලැබිය හැකි වෙනත් මුදල්,

ඒකාබද්ධ අරමුදලට බැරකරනු ලැබිය යුතු අතර, ඉන්පසුව, පාර්ලිමේන්තුවේ අනුමතය ඇතිව දිවි නැගුම සංවර්ධන අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(3) ඉහත අරමුදලෙහි බැරට පවතින මුදල් අමාත්‍යවරයා විසින් කලින් කල නියම කරනු ලැබිය හැකි පරිදි යම් කාර්ය සඳහා සහ යම් ආකාරයකට භාවිත කරනු ලැබිය හැකි ය.

37. (1) මේ පනතේ කාර්ය සඳහා "දිවිනැගුම චක්‍රීය අරමුදල" යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) 1995 අංක 30 දරන සමෘද්ධි සංවර්ධන අධිකාරිය පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය, 1996 අංක 18 දරන දක්ෂිණ සංවර්ධන අධිකාරිය පනත යටතේ පිහිටුවන ලද දක්ෂිණ සංවර්ධන අධිකාරිය සහ 2005 අංක 26 දරන උඩරට සංවර්ධන අධිකාරිය පනත යටතේ පිහිටුවන ලද උඩරට සංවර්ධන අධිකාරිය යන අධිකාරිවල චක්‍රීය අරමුදල්වල මේ පනත බලාත්මක

වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී බැරට පැවති සියලු මුදල් නියමිත දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි මෙම පනත යටතේ පිහිටුවන ලද දිවි නැගුම චක්‍රීය අරමුදලට බැරවූ ලෙස සලකනු ලැබිය යුතු ය.

IX වන කොටස

**සාමාන්‍ය**

38. එක් එක් දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්වරයා අදාළ දිස්ත්‍රික්කය සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරයකු වශයෙන් ක්‍රියා කළ යුතු ය.

39. දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා, අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරු, සියලු අධ්‍යක්ෂවරු, නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා, සහකාර අධ්‍යක්ෂවරයා සහ නිලධරයන් මෙන්ම සේවකයන් ද ස්වකීය කාර්ය ඉටු කිරීමට පෙරාතුව දෙපාර්තමේන්තුවේ කටයුතු පිළිබඳ වූ සියලු කාරණා සම්බන්ධයෙන් පූර්ණ රහස්‍යභාවය තමා විසින් සුරකින බවට පොරොන්දු වෙමින් ප්‍රකාශයක් අත්සන් කළ යුතු අතර ඒ ප්‍රකාශය මගින්:–

(අ) එසේ කිරීමට අධිකරණය විසින් නියම කර ඇති අවස්ථාවක දී; හෝ

(ආ) මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන කිසිවකට අනුකූලවීම පිණිස වූ අවස්ථාවක දී,

හැර, ස්වකීය කර්තව්‍ය ඉටු කිරීමේ දී තමාට දැන ගැනීමට ලැබෙන කිසිදු කාරණයක් තමා විසින් හෙළිදරව් නොකරන බවට ප්‍රතිඥා දිය යුතු ය.

40. (1) මේ පනත යටතේ දෙපාර්තමේන්තුවේ බලතල සහ කර්තව්‍ය කිසිවක් ක්‍රියාත්මක කිරීමට සහ ඉටුකිරීමට දෙපාර්තමේන්තුවට හැකි කරවීමේ කාර්යය සඳහා, දෙපාර්තමේන්තුව විසින් හෝ දෙපාර්තමේන්තුව විසින් තත් කාර්යය සඳහා බලය දෙන ලද යම් තැනැත්තකු විසින්, ලිඛිත දැන්වීමක් මගින්, දැන්වීමේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතු යම් කාලසීමාවක් තුළ දී ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතු පරිදි යම් වාර්තා සහ තොරතුරු දෙපාර්තමේන්තුව වෙත හෝ දෙපාර්තමේන්තුව විසින් බලය දුන් තැනැත්තා වෙත ඉදිරිපත් කිරීමට යම් තැනැත්තකුට නියම කළ හැකි අතර දෙපාර්තමේන්තුව ඉදිරියේ පෙනී සිටිය යුතු යයි යම් තැනැත්තකුට නියම කළ හැකි ය.

(2) වාර්තා හෝ තොරතුරු කිසිවක් ඉදිරිපත් කිරීමට හෝ දෙපාර්තමේන්තුව ඉදිරියේ පෙනී සිටිය යුතු යයි (1) වන උපවගන්තිය යටතේ වූ දැන්වීමක් මගින් නියම කර ඇත්තේ යම් තැනැත්තකුට ද, ඒ තැනැත්තා වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන යටතේ ඒ වාර්තා හෝ තොරතුරු සැපයීමෙන් වළක්වා ඇති අවස්ථාවක දී හැර ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් කර ඇති කාල සීමාව ඇතුළත ඒ දැන්වීමේ නියමවලට අනුකූලව කටයුතු කිරීම ඔහුගේ කාර්යය විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද දැන්වීමකට අනුකූලව ඉදිරිපත් කරන ලද වාර්තාවක ඇතුළත් කිසිදු තොරතුරක්, ඒ වාර්තා හෝ තොරතුරු ඉදිරිපත් කිරීමේ දී හෝ දෙපාර්තමේන්තුවේ කර්තව්‍ය ඉටු කරන අවස්ථාවේ දී ඒ තැනැත්තාගේ එකඟත්වය ඇතුව මිස දෙපාර්තමේන්තුව විසින් හෝ එහි යම් නිලධරයකු, සේවකයකු හෝ නියෝජිතයකු විසින් වෙනත් යම් තැනැත්තකු වෙත ප්‍රකාශ කිරීම හෝ සන්නිවේදනය කිරීම නොකළ යුතු ය.

(4) දෙපාර්තමේන්තුව ඉදිරිපිට දී කිසියම් ප්‍රකාශයක් ඉදිරිපත් කරන සෑම තැනැත්තකු ම, ඒ ප්‍රකාශය සම්බන්ධයෙන්, අධිකරණයක් ඉදිරිපිට දී සාක්ෂි දෙන්නා වූ සාක්ෂිකරුවකු, ඒ අධිකරණය ඉදිරිපිට දී ඔහු විසින් දෙන ලද සාක්ෂි සම්බන්ධයෙන් හිමිකම් කියනු ලබන සියලු වරප්‍රසාදවලට, හිමිකම් ලැබිය යුතු ය.

41. මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද හෝ නිකුත් කරන ලද යම් නියෝගයක්, රීතියක් හෝ විධානයක් උල්ලංඝනය වන සේ ක්‍රියා කරන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට දී පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබීමේ දී රුපියල් දෙදහස් පන්සියයකට නොවැඩි දඩයකට හෝ වසර දෙකකට නොවැඩි කාලසීමාවක් සඳහා වූ බන්ධනාගාරගත කිරීමකට යටත් විය යුතු ය.

42. (1) නියම කළ යුතු කාරණා වශයෙන් මේ පනතින් නියමිත සහ නියෝග සෑදීමට මේ පනතින් බලය දී ඇති කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය මගින් පවරන ලද බලතලවල ව්‍යාප්තියට අගතියක් නොමැතිව, අමාත්‍යවරයා විසින් පහත දැක්වෙන කාරණා සියල්ල හෝ ඉන් කිසිවක් සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය :–

(අ) දිවි නැගුම ප්‍රජා මූල සංවිධානවල ව්‍යවස්ථාව සහ පරිපාලන ව්‍යුහය මෙන්ම ඒ ව්‍යවස්ථාව සහ පරිපාලන ව්‍යුහය හා සම්බන්ධ කාරණා;

(ආ) දිවි නැගුම ප්‍රාදේශීය සංවිධානවල ව්‍යවස්ථාව සහ පරිපාලන ව්‍යුහය මෙන්ම ඒ ව්‍යවස්ථාව සහ පරිපාලන ව්‍යුහය හා සම්බන්ධ කාරණා;

(ඇ) දිවි නැගුම ප්‍රජාමූල බැංකු මහා සංගමයේ ව්‍යවස්ථාව සහ පරිපාලන ව්‍යුහය මෙන්ම ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා;

(ඈ) දිවි නැගුම ප්‍රජාමූල බැංකු ලියාපදිංචි කිරීම, ඒ ලියාපදිංචි කිරීම හෝ ඒ ලියාපදිංචි කිරීම අවලංගු කිරීම සම්බන්ධයෙන් සම්පූර්ණ කළ යුතු අවශ්‍යතා සහ දිවිනැගුම ප්‍රජා මූල බැංකුවල බැංකු කටයුතු සහ ඒ හා සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා;

(ඉ) දිවි නැගුම ප්‍රජා මූල බැංකු සමිති ලියාපදිංචි කිරීම, ඒ ලියාපදිංචි කිරීම සහ ඒ ලියාපදිංචි කිරීම අවලංගු කිරීම සම්බන්ධයෙන් සම්පූර්ණ කළ යුතු අවශ්‍යතා සහ දිවිනැගුම ප්‍රජා මූල බැංකු සමිතිවල කටයුතු සහ ඒ හා සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා;

(ඊ) දිවි නැගුම ප්‍රතිලාභීන් තෝරා ගැනීම සම්බන්ධයෙන් වන්නා වූ නිර්ණායක;

(ඌ) දිවි නැගුම ප්‍රජා මූල සංවිධානවල සහ දිවි නැගුම ප්‍රජා මූල බැංකුවල සාමාජිකයන් වීම සම්බන්ධයෙන් වන්නා වූ නිර්ණායක;

(ඌෟ) දිවි නැගුම ප්‍රජා මූල සංවිධාන, දිවි නැගුම ප්‍රජා මූල බැංකු සහ දිවි නැගුම ප්‍රජා මූල බැංකු සමිති අධීක්ෂණය, නියාමනය, ඇගයීම සම්බන්ධයෙන් වන්නා වූ නිර්ණායක;

(එ) දිවි නැගුම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ සහ පරිපාලනය කිරීමේ බල ප්‍රදේශ ග්‍රාමීය, ප්‍රාදේශීය හෝ දිස්ත්‍රික් මට්ටමින් නිර්ණය කිරීම;

(ඒ) දිවි නැගුම සංවර්ධන අරමුදල සහ දිවි නැගුම චක්‍රීය අරමුදල හා සම්බන්ධ සියලු කාරණා;

(ඔ) දිවි නැගුම ප්‍රජා මූල සංවිධාන, දිවි නැගුම ප්‍රාදේශීය සංවිධාන, දිවි නැගුම ප්‍රජා මූල බැංකු සහ දිවි නැගුම ප්‍රජා මූල බැංකු සමිති විසින් පවත්වාගෙන යනු ලබන අරමුදල් සම්බන්ධ සියලු කාරණා;

(ඕ) මේ පනතේ විධිවිධාන හා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ දී පැන නැගිය හැකි යම් ආරවුල් විසඳීම සඳහා වන ක්‍රියාපටිපාටිය සහ ඊට සම්බන්ධිත හෝ ආනුෂංගික කාරණා; සහ

(ක) දිවි නැගුම වැඩසටහන සඳහා පොදු ලාංඡනයක් භාවිත කිරීම.

(3) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු අතර එය පළකරන ලද දිනයේ සිට හෝ නියෝගයේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි පරිදි යම් පසු දිනයක දී ක්‍රියාත්මක විය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම එය ගැසට් පත්‍රයේ පළකරනු ලැබීමෙන් පසු මාස තුනක කාලයක් නොඉක්මවන කාලසීමාවක දී අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත නොකළ ඕනෑම නියෝගයක් ඒ අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු නමුත් ඒ යටතේ කලින් සිදු කරන ලද කිසිවකට ඉන් හානියක් නොවිය යුතු ය.

(5) එම අනනුමත දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු ය.

43. (1) දෙපාර්තමේන්තුවේ ප්‍රතිපත්ති සහ කළමනාකරණ කටයුතු සම්බන්ධයෙන් දිවි නැගුම ජාතික සභාව විමසා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් රීති සාදනු ලැබිය හැකිය.

(2) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සාදනු ලබන සෑම රීතියක්ම අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරනු ලබන තෙක් ක්‍රියාත්මක නොවිය යුතු ය.

(3) එසේ අනුමත කළ සෑම රීතියක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

## X වන කොටස
## ඉවත් කිරීම් සහ ඉතිරිකිරීම්

44. 1995 අංක 30 දරන සමෘද්ධි සංවර්ධන අධිකාරිය පනත, 1996 අංක 18 දරන දක්ෂිණ සංවර්ධන අධිකාරිය පනත සහ 2005 අංක 26 දරන උඩරට සංවර්ධන අධිකාරිය පනත මෙයින් ඉවත් කරනු ලැබේ. ඉහත කී ඉවත් කරන ලද පනත්වල කුමක් සඳහන් වුව ද:–

(අ) දිළිඳුභාවය තුරන්කිරීමේ වැඩසටහන් සහ වෙනත් රජයේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී, ඉවත් කරන ලද 1995 අංක 30 දරන සමෘද්ධි සංවර්ධන අධිකාරිය පනත යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් කරගෙන යන ලද සියලු කාර්ය මේ පනත යටතේ කරනු ලැබූ හා කරගෙන යනු ලැබිය යුතු කාර්ය ලෙස සලකනු ලැබිය යුතු ය;

(ආ) නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී (මෙහි මින්මතු "එකී අධිකාරි" යනුවෙන් සඳහන් කරනු ලබන) ඉවත් කරන ලද පනත් යටතේ පිහිටුවන ලද සමෘද්ධි සංවර්ධන අධිකාරිය, දක්ෂිණ සංවර්ධන අධිකාරිය සහ උඩරට සංවර්ධන අධිකාරිය යන අධිකාරීවලට අයත් වන්නා වූ සියලු චංචල හා නිශ්චල දේපළ නියමිත දින සිට බලපැවැත්විය යුතු පරිදි රජයට පවරා දිය යුතු අතර එය රජයේ දේපළක් ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඇ) එකී අධිකාරි විසින් හෝ ඒවාට එරෙහිව පවරනු ලැබ ඇති සහ නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ ඇසෙමින් පවතින්නා වූ සියලු නඩු, පැමිණිලි, නඩු පැවරීම්, නීති කෘත්‍ය, කාරණා හෝ දේ නියමිත දින සිට බලාත්මක වන පරිදි රජය විසින් හෝ රජයට එරෙහිව පවරනු ලැබ ඇති නඩු, පැමිණිලි, නඩු පැවරීම්, නීති කෘත්‍ය, කාරණා හෝ දේ ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඈ) යම් අධිකරණයක් හෝ විනිශ්චය සභාවක් හෝ වෙනත් මණ්ඩලයක් විසින් යම් නඩුවක දී, කාරණයක දී, නීති කෘත්‍යයක දී හෝ ක්‍රියාවක දී එකී අධිකාරි වෙනුවෙන් හෝ ඒවාට එරෙහිව ඇතුළත් කරන ලද හෝ සිදුකරන ලද යම් තීන්දු ප්‍රකාශයක්, නියෝග යක් හෝ ප්‍රදානයක් නියමිත දින සිට බලාත්මක වන පරිදි රජය වෙනුවෙන් හෝ රජයට එරෙහිව ඇතුළත් කරන ලද හෝ සිදු කරන ලද තීන්දු ප්‍රකාශයක්, නියෝගයක් හෝ ප්‍රදානයක් ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ අනුව බලාත්මක විය යුතු ය;

(ඉ) නියමිත දිනට පෙරාතුවම වූ දිනයේ, එකී අධිකාරිවල සේවයේ නියුතු නිලධරයන් හෝ සේවකයන් අතරින් යම් නිලධරයකු හෝ සේවකයකු-

(i) දෙපාර්තමේන්තුවේ සේවයට බැඳීමට කැමැත්ත පළ නොකර ස්වකැමැත්තෙන් සේවයෙන් ඉවත්ව යෑමට කැමැත්ත පළ කරන අවස්ථාවක දී අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය යුතු ස්ව කැමැත්තෙන් සේවයෙන් ඉවත්ව යෑමේ වන්දි සැලැස්මේ නියම ප්‍රකාර යම් වන්දි මුදලක් ඒ නිලධරයා හෝ සේවකයා වෙත ගෙවනු ලැබිය යුතු ය;

(ii) දෙපාර්තමේන්තුවේ සේවයට එක්වීමට කැමැත්ත පළ කරනු ලබන අවස්ථාවක දී, අදාළ අධිකාරිය තුළ යම් තනතුරකට පත් කරන ලද දින සිට බලාත්මක වන පරිදි දෙපාර්තමේන්තුවේ සේවයට බැඳීමට ඒ නිලධරයා හෝ සේවකයා කැමැත්ත පල කරන අවස්ථාවක දී, ඒ නිලධරයා හෝ සේවකයා අදාළ අධිකාරිය තුළ ඒ තනතුරට පත්කරන ලද දින සිට බලාත්මක වන පරිදි සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමතයට යටත්ව දෙපාර්තමේන්තුවේ නිලධරයකු හෝ සේවකයකු ලෙස සලකනු ලැබිය යුතු අතර, අදාළ අධිකාරිය විසින් සේවක අර්ථ සාධක අරමුදලට ලබාදෙන ලද දායකත්වය සැලකිල්ලට

ගෙන විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන යටතේ විශ්‍රාම වැටුපක් සඳහා ඒ නිලධරයා හෝ සේවකයා හිමිකම් ලැබිය යුතු ය;

(iii) දෙපාර්තමේන්තුවේ සේවයට එක් වීමට කැමැත්ත පළ කරනු ලබන අවස්ථාවක දී-

(අඅ) ඒ නිලධරයා හෝ සේවකයා 1958 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල් පනත යටතේ යම් මුදලක් ලැබීම සඳහා සුදුසුකම් ලබයි නම්; සහ

(ආආ) ඒ නිලධරයා හෝ සේවකයා 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල පනත යටතේ යම් මුදලක් ලැබීම සඳහා සුදුසුකම් ලබයි නම්,

ඒ මුදල අපසු ලබාගෙන රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමතයට යටත්ව, ඒ නිලධරයාට හෝ සේවකයාට දෙපාර්තමේන්තුවේ සේවයට බැඳිය හැකි ය. දෙපාර්තමේන්තුවේ සේවයට බැඳුනු දින සිට ඒ නිලධරයා හෝ සේවකයා දෙපාර්තමේන්තුවේ නිලධරයකු හෝ සේවකයකු ලෙස සලකනු ලැබිය යුතු ය. එසේම විශ්‍රාම වැටුප් ගණනය කිරීම සඳහා වන දිනය ලෙස ඒ නිලධරයා හෝ සේවකයා දෙපාර්තමේන්තුවේ සේවයට බැඳුනු දිනය සලකනු ලැබිය යුතු ය:

(iv) සේවානියුක්තයන්ගේ අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට අඛණ්ඩව දායකවීමට කැමැත්ත පළ කරන අවස්ථාවක දී, ඒ නිලධරයා හෝ සේවකයා නියමිත දින සිට බලාත්මකවන පරිදි, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමතයට යටත්ව දෙපාර්තමේන්තුවේ නිලධරයකු හෝ සේවකයකු ලෙස සලකනු ලැබිය යුතු අතර, එකී අරමුදල් සඳහා අඛණ්ඩව දායක මුදල් ගෙවිය යුතු ය:

එසේ වුව ද, ඒ නිලධරයා හෝ සේවකයා විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුපක් සඳහා හිමිකම් නොලැබිය යුතු ය.

(ඊ) නියමිත දිනයට පෙරාතුව ම දිනයේ එකී අධිකාරී සමග හෝ අධිකාරී වෙනුවෙන් දරන ලද සියලුම ණය, බැඳීම්, වත්කම් සහ වගකීම්, ක්‍රියාවේ යොදවන ලද හෝ බලාත්මක කරන ලද සියලු කොන්ත්‍රාත් සහ ගිවිසුම් සහ එකී අධිකාරි විසින් සිදුකිරීමට සම්බන්ධ වූ හෝ ගිවිසගත් කාරණා සහ දේවල් සහ එකී අධිකාරී සඳහා සහ එකී අධිකාරී වෙනුවෙන් නිකුත් කරන ලද සියලු බලපත්‍ර, නියමිත දින සිට බලාත්මකවන පරිදි ආණ්ඩුව විසින් දරන ලද ණය, බැඳීම්, වත්කම් සහ වගකීම්, ක්‍රියාවේ යොදවන ලද හෝ බලාත්මක කරන ලද සියලු කොන්ත්‍රාත් සහ ගිවිසුම් සහ ආණ්ඩුව විසින් සිදුකිරීමට සම්බන්ධව වූ හෝ ගිවිසගත් කාරණා සහ දේවල් සහ ආණ්ඩුවේ බලපත්‍ර ලෙස සලකනු ලැබිය යුතු ය.

(උ) නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී බලාත්මකව පැවැති සියලු සමෘද්ධි බැංකු සමිති සහ සමෘද්ධි බැංකු සම්මේලන නියමිත දිනයේ සිට පිළිවෙලින් දිවි නැගුම ප්‍රජා මූල බැංකු සහ දිවි නැගුම ප්‍රජා මූල බැංකු සමිති ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඌ) යම් ලිඛිත නීතියක් ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් සමෘද්ධි අධිකාරිය මගින් හෝ සමෘද්ධි කොමසාරිස් ජනරාල්වරයාගෙන් යම් ශුභසාධන ප්‍රතිලාභයක් සඳහා ඉල්ලුම්කර ඇති හෝ යම් ශුභසාධන ප්‍රතිලාභයක් ලබමින් සිටින සෑම තැනැත්තකුම, මේ පනතේ පටහැනිව කුමක් සඳහන් වුවද, මේ පනතේ නියමවලට අනුව ප්‍රතිලාභ ලබාගැනීම සඳහා ඉල්ලුම් කිරීමට හෝ අඛණ්ඩව ප්‍රතිලාභ ලැබීමට සුදුසුකම් ලැබිය යුතු ය.

45. ඉවත් කරන ලද 1995 අංක 30 දරන පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා සමෘද්ධි සංවර්ධන අධිකාරිය, ඉවත් කරන ලද 1996 අංක 18 දරන පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය, ඉවත් කරන ලද 2005 අංක 26 දරන පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරිය විසින් හෝ ඒ යටතේ යම් පරමාර්ථයක් සඳහා පිහිටුවන ලද අරමුදල් සහ භාර, ඒ අරමුදල් සහ භාර පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාර්ය වෙනුවෙන් ද ඒ පරමාර්ථ, කාර්ය සහ ඒ ප්‍රතිලාභීන් සම්බන්ධයෙන් කිසිදු වෙනස්කිරීමක් සිදුනොවන බවට සහතික කරමින් දෙපාර්තමේන්තුව විසින් පාලනය කරනු ලැබිය යුතු ය.

46. මේ පනතේ විධිවිධාන සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන අතර යම් පරස්පර විරෝධතාවයක් හෝ අනනුකූලතාවයක් පවතින අවස්ථාවක දී මේ පනතේ විධිවිධාන බලපවත්වනු ලැබිය යුතු ය.

47. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතේ –

"මහ බැංකුව" යන්නෙන්, (422 වන අධිකාරය වූ) මුදල් නීති පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා මහ බැංකුව අදහස් වේ;

"ප්‍රජාව" යන්නෙන් වතු, නාගරික හෝ කර්මාන්ත ක්ෂේත්‍ර ආශ්‍රිත ජනකොටස් අදහස් වේ;

"දිවි නැගුම ප්‍රතිලාභීන්" යන්නෙන්, යම් දිවි නැගුම ප්‍රජා මූල සංවිධානයක් හෝ දිවි නැගුම ප්‍රාදේශීය සංවිධානයක් විසින් කරගෙන යන යම් වැඩසටහනක්, ව්‍යාපෘතියක් හෝ ක්‍රියාකාරකමක් යටතේ යම් ආකාරයක වරප්‍රසාදයක් හෝ උපකාරයක් ලබාගන්නා වූ යම් තැනැත්තකු අදහස් වේ;

"ක්ෂුද්‍ර මූල්‍ය" යන්නෙන්, අන්‍යාකාරයකින් මූල්‍ය සේවා උපයා ගැනීමේ කිසිදු මාර්ගයක් නොමැති සේවයේ යෙදෙන්නන්ට හෝ අඩු ආදායම් පුද්ගලයන්ට හෝ කණ්ඩායම්වලට සපයන්නා වූ මූල්‍ය සේවා වර්ගයක් අදහස් වේ;

"අමාත්‍යවරයා" යන්නෙන්, දිවිනැගුම විෂයය පවරා ඇත්තේ යම් අමාත්‍යවරයෙකුට ද ඒ අමාත්‍යවරයා අදහස් වේ; සහ

"ජාතික ලොතරැයි මණ්ඩලය" යන්නෙන්, 1963 අංක 11 දරන ජාතික ලොතරැයි මණ්ඩලය පනත යටතේ පිහිටුවන ලද ජාතික ලොතරැයි මණ්ඩලය අදහස් වේ.

48. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

# 2013 අංක 3 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2013 පෙබරවාරි මස 12 වැනි දින]

**2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:–

1. මේ පනත 2013 අංක 3 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනතේ 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:–

(1) එහි (2අ) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:–

"(2අ) යම් ත්‍රස්තවාදියකුට, ත්‍රස්තවාදීන්ට හෝ ත්‍රස්තවාදී සංවිධානයකට යම් ද්‍රව්‍යමය ආධාර හෝ සම්පත් නීති විරෝධී ලෙස සහ සිතා මතා ඍජුව හෝ වක්‍ර ආකාරයකින් සපයන හෝ සැපයීමට කුමන්ත්‍රණය කරන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේ ය.";

(2) එහි (3) වන උපවගන්තියේ "(1) වන උපවගන්තියේ හෝ (2) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති" යන වචන හා ඉලක්කම් වෙනුවට "මේ වගන්තියේ (1) වන උපවගන්තියේ, (2) වන උපවගන්තියේ හෝ (2අ) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(3) එහි (4) වන උපවගන්තියේ "මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ හෝ (2) වන උපවගන්තිය යටතේ" යන වචන හා ඉලක්කම් වෙනුවට "මේ වගන්තියේ (1) වන උපවගන්තිය, (2) වන උපවගන්තිය හෝ (2අ) වන උපවගන්තිය යටතේ" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 4ඊ වන වගන්තියේ (3) වන උපවගන්තියේ "එම වටිනාකම දඩයක් වශයෙන් අධිකරණය විසින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම්කිසි කාලසීමාවක් තුළ ගෙවන ලෙස ඔහුට ආඥා කරනු ලැබිය යුතු ය." යන වචන වෙනුවට "එම වටිනාකම දඩයක් වශයෙන් අධිකරණය විසින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම්කිසි කාලසීමාවක් තුළ ගෙවන ලෙස ඔහුට ආඥා කරනු ලැබිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියේ (3) වන උපවගන්තියේ "3 වන වගන්තියේ (1) වන උපවගන්තිය හෝ (2) වන උපවගන්තිය යටතේ යම් වරදක් සම්බන්ධයෙන්" යන වචන හා ඉලක්කම් වෙනුවට "3 වන වගන්තියේ (1) වන උපවගන්තිය, (2) වන උපවගන්තිය හෝ (2අ) වන උපවගන්තිය යටතේ යම් වරදක් සම්බන්ධයෙන්" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 16අ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:–

(1) "තැනැත්තා" යන යෙදුමේ අර්ථනිරූපණයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් අර්ථනිරූපණය ඇතුළත් කිරීමෙන්:–

" "ත්‍රස්තවාදියා" යන්නෙන්–

(අ) ඍජුව හෝ වක්‍රව හා සිතාමතාම ත්‍රස්තවාදී ක්‍රියාවක් සිදු කරන හෝ සිදු කිරීමට තැත් කරන;

(ආ) ත්‍රස්තවාදී ක්‍රියාවක් සිදුකිරීමේ දී අපසහායකයකු ලෙස සහභාගිවන;

(ඇ) ත්‍රස්තවාදී ක්‍රියාවක් සිදු කිරීමට සංවිධානය කරන, මඟපෙන්වන හෝ ආධාර හෝ අනුබලදෙන; හෝ

(ඈ) පොදු අරමුණක් ඇතිව ක්‍රියාකරන පුද්ගල කණ්ඩායමක් විසින් සිදු කරන ත්‍රස්තවාදී ක්‍රියාවකට, සිතාමතාම සහ ඒ ත්‍රස්තවාදී ක්‍රියාව තවදුරටත් කරගෙන යාමේ අරමුණ ඇතිව හෝ යම් ත්‍රස්තවාදී ක්‍රියාවක් සිදු කිරීම සඳහා වන ඒ කණ්ඩායමේ අදහස පිළිබඳ දැනුම ඇතිව දායකත්වය සපයන,

තැනැත්තකු අදහස් වේ.";

(2) "ත්‍රස්තවාදී ක්‍රියාව" යන යෙදුමේ අර්ථනිරූපණය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථනිරූපණය ආදේශ කිරීමෙන්:–

" "ත්‍රස්තවාදී ක්‍රියාව" යන්නෙන්–

(අ) මේ පනතේ 1 වන උපලේඛනයේ නිශ්චිතවම දක්වා ඇති සම්මුතිවලින් කිසියම් සම්මුතියක විෂයය පථය තුළට ගැනෙන හෝ අර්ථනිරූපණය තුළට ගැනෙන වරදක් සංස්ථාපනය වන යම් ක්‍රියාවක්;

(ආ) සන්නද්ධ ගැටුම් පවතින තත්ත්වයක දී හෝ වෙනත් අවස්ථාවක දී, ඒ එදිරිවාදිකම්වල දී ක්‍රියාකාරීව සහභාගි නොවන සිවිල් වැසියන්ට හෝ වෙනත් යම් තැනැත්තකුට මරණය සිදු කිරීමේ හෝ බරපතල ශාරීරික පීඩා ඇති කිරීමේ අදහසින් කරන ලද සහ එහි ස්වභාවය හෝ අන්තර්ගතය මගින් යම් ක්‍රියාවක් කිරීමට හෝ යම් ක්‍රියාවක් කිරීමෙන් වැළකී සිටීමට ජනතාවට තර්ජනය කිරීම හෝ ආණ්ඩුවකට හෝ ජාත්‍යන්තර ආයතනයකට බලපෑම් කිරීම හෝ අරමුණු කරන ලද වෙනත් යම් ක්‍රියාවක්; හෝ

(ඇ) (i) රජයට බලපෑම් කිරීමට හෝ මහජනතාව හෝ මහජනතාවගෙන් කොටසක් බියවැද්දීමට සැළසුම් කරන ලද ක්‍රියාවක් භාවිත කිරීම හෝ කිරීමට තර්ජනය කිරීම; සහ

(ii) යම් දේශපාලන, ආගමික හෝ මතවාදමය අරමුණක් ප්‍රවර්ධනය කිරීමේ පරමාර්ථය ඇතිව සිදුකරනු ලබන ක්‍රියාවක් භාවිත කිරීම හෝ කිරීමට තර්ජනය කිරීම,

අදහස් වන අතර, එවැනි ක්‍රියාවකට,

(අඅ) යම් තැනැත්තකුට එරෙහිව බරපතල හිංසනයක් සිදු කිරීම;

(ආආ) යම් දේපලකට සිදු කරන බරපතල හානියක්;

(ඇඇ) එම ක්‍රියාව සිදු කරන තැනැත්තා හැර වෙනත් යම් තැනැත්තකුගේ ජීවිතය අනතුරට භාජනය කිරීමක්;

(ඈඈ) මහජනතාවගේ හෝ මහජනතාවගෙන් යම් කොටසකගේ සෞඛ්‍යයට හෝ ආරක්ෂාවට බරපතල අවදානමක් ඇති කිරීම; හෝ

(ඉඉ) යම් විද්‍යුත් පද්ධතියකට බරපතල ලෙස බාධා කිරීමට හෝ එම විද්‍යුත් පද්ධතිය බරපතල ලෙස බිඳ දැමීමට සැළසුම් කිරීමක්,

ඇතුළත් වේ.".

6. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

## 2013 අංක 5 දරන වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2013 මාර්තු මස 22 වන දින]

**2011 අංක 18 දරන වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :–

1. මේ පනත 2013 අංක 5 දරන වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2011 අංක 18 දරන වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු පනතේ 3 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) සහ (ආ) යන ඡේද ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේද ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :–

"(අ) පිරිසැකසුම් කොට ප්‍රති අපනයනය කිරීමේ කාර්යය සඳහා ;

(ආ) අපනයනය කිරීම සඳහා භාණ්ඩ නිෂ්පාදනය කිරීම සම්බන්ධයෙන් අමු ද්‍රව්‍යයක් වශයෙන් භාවිත කිරීම සඳහා ; හෝ

(ඇ) ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත සිදු කරනු ලබන ඛනිජ තෙල් මෙහෙයුම්වල දී භාවිත කිරීම සඳහා බන්ධිත පහසුකමක ඇති උපකරණ, මෙවලම්, ද්‍රව්‍ය, පාරිභෝගික ද්‍රව්‍ය වන අවස්ථාවෝචිත පරිදි, ගබඩා කිරීම, සකස් කිරීම, අලුත්වැඩියා කිරීම, සේවා කිරීම හෝ අපනයනය කිරීම සඳහා,

ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන යම් භාණ්ඩයක පිරිවැය, රක්ෂණය සහ නැව් ගාස්තු සම්බන්ධයෙන් කිසිදු බද්දක් අය කරනු නොලැබිය යුතුය.

(ඇ) ඡේදයේ කාර්ය සඳහා "ඛනිජතෙල් මෙහෙයුම්" යන්නට 2003 අංක 26 දරන ඛනිජතෙල් සම්පත් පනත යටතේ ඊට ලබා දී ඇති අර්ථය ම තිබිය යුතු ය.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :–

16. (1) වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බද්ද ගෙවීමට අදාළව 2002 අංක 11 දරන මුදල් පනතේ 1 වන කොටසේ විධිවිධාන 2011 ජනවාරි මස 1 වන දින හෝ ඉන් පසුව, ශ්‍රී ලංකාවෙන් පිටත දී ආරම්භ වන සහ ශ්‍රී ලංකාවට ආනයනය කරන කිසිදු භාණ්ඩයකට අදාළ නොවිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද–

(අ) වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු ගෙවීමෙන් යම් නිශ්චිතව සඳහන් කර ඇති භාණ්ඩ නිදහස් කරමින් ; සහ

(ආ) අනුග්‍රාහක අනුප්‍රමාණයක් අය කල යුතු බවට සහ පැනවිය යුතු බවට නිශ්චිතව දක්වමින්,

2002 අංක 11 දරන මුදල් පනතේ 1 වන කොටසේ 2 වන වගන්තිය යටතේ සාදනු ලැබූ සහ 2011 ජනවාරි මස 1 වන දිනට පෙර ගැසට් පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, සෑම නියමයක් ම, 2011 අංක 18 දරන වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු පනතේ 3 වන වගන්තිය යටතේ කරනු ලැබූ නියමයක් ලෙස සලකනු ලැබිය යුතු අතර එම නියමය අඛණ්ඩව බලපවත්වනු ලැබිය යුතු ය.".

4. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

## 2013 අංක 6 දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2013 මාර්තු මස 22 වැනි දින]

**2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:–

1. මේ පනත 2013 අංක 6 දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර 2013 අප්‍රේල් මස 1 වන දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

2. 2012 අංක 11 දරන පනත මගින් අවසන්වරට සංශෝධිත (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනතේ 2 වන වගන්තියේ (3) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:–

(1) එකී උපවගන්තියේ (අ) ඡේදයෙහි අතුරු විධානයේ "එම කාර්තුව සඳහා අදාළ පිරිවැටුම" යන වචන වෙනුවට "යම් පිරිවැටුමකින් ලැබෙන ලාභය ආදායම් බද්දෙන් නිදහස් කර ඇද්ද, එකී පිරිවැටුම හැර එම කාර්තුව සඳහා අදාළ පිරිවැටුම" යන වචන ආදේශ කිරීමෙන්;

(2) (ආ) ඡේදයේ (අ) අනුඡේදයේ (ix) අයිතමයේ "භාණ්ඩ විකිණීමෙන් උපචිත මුදල්; සහ" යන වචන වෙනුවට "භාණ්ඩ විකිණීමෙන් උපචිත මුදල්;" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(3) (ආ) ඡේදයේ (අ) අනුඡේදයේ (ix) වන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අයිතමයන් එකතු කිරීමෙන් :–

"(x) ආණ්ඩුව වෙනුවෙන් යම් රාජ්‍ය සංස්ථාවක් විසින් නොමිලයේ යම් සේවාවක් සැපයීම සඳහා ඒකාබද්ධ අරමුදලින් පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලබන අරමුදල් හෝ ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් සලස්වා දෙනු ලබන යම් ණය මුදලක්; සහ

(xi) යම් කාබනික පොහොර නිෂ්පාදකයකු විසින් එම නිශ්පාදනය විකිණීමෙන් ලැබෙන මුදල්; සහ".

3. 2011 අංක 11 දරන පනත මගින් අවසන්වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තියේ "තැනැත්තා" යන යෙදුමේ අර්ථ නිරූපණය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:–

(1) එහි (ඊ) ඡේදයේ "ඒකක භාරයක් හෝ අන්‍යෝන්‍ය අරමුදලක්;" යන වචන වෙනුවට "ඒකක භාරයක් හෝ අන්‍යෝන්‍ය අරමුදලක්; සහ" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) එහි (ඊ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්:–

"(උ) ශ්‍රී ලංකා මහ බැංකුව;".

4. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

## 2013 අංක 7 දරන සුරාබදු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2013 මාර්තු මස 22 වැනි දින]

**(52 වන අධිකාරය වූ) සුරාබදු ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:–

1. මේ පනත 2013 අංක 7 දරන සුරාබදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර එය 2012 නොවැම්බර් මස 08 වන දින සිට ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

2. 2011 අංක 20 දරන පනත මගින් අවසන්වරට සංශෝධිත (52 වන අධිකාරය වූ) සුරාබදු ආඥා පනතේ 15 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:–

(1) එහි (ආ) ඡේදයේ "කිතුල් ගස් සහ" යන වචන වෙනුවට "කිතුල් ගස්, පොල් ගස් සහ" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) එහි (ඇ) ඡේදයේ "කිතුල් ගස් සහ" යන වචන වෙනුවට "කිතුල් ගස්, පොල් ගස් සහ" යන වචන ආදේශ කිරීමෙන්.

3. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

## 2013 අංක 8 දරන විදුලි සංදේශ බදු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2013 මාර්තු මස 22 වන දින]

**2011 අංක 21 දරන විදුලි සංදේශ බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:–

1. මේ පනත 2013 අංක 8 දරන විදුලි සංදේශ බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, සියලු කාර්ය සඳහා 2013 ජනවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක වන ලෙස සලකනු ලැබිය යුතුය.

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2011 අංක 21 දරන විදුලි සංදේශ බදු පනතේ 2 වන වගන්තියේ " 2011 ජනවාරි මස 1 වන දින හෝ ඉන් පසුව" යන වචන සහ ඉලක්කම්වල සිට " බද්දක් පනවා අයකරනු ලැබිය යුතුය" යන වචන සහ ඉලක්කම් දක්වා වූ කොටස ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:–

"(මෙහි මින්මතු "ග්‍රාහකයා" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් විදුලි සංදේශ සේවාවක් ග්‍රහණය කරන සෑම තැනැත්තකුගෙන් ම-

(අ) 2011 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වන එහෙත් 2013 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව වූ කාලය සඳහා සියයට විස්සක් වූ අනුප්‍රමාණයකින් ද;

(ආ) 2013 ජනවාරි මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් කාල සීමාවක් සඳහා -

(i) අන්තර්ජාල සේවා සැපයුම් අගය මත සියයට දහයක් වූ අනුප්‍රමාණයකින් ද ; සහ

(ii) අන්තර්ජාල සේවා සැපයීම නොවන විදුලි සංදේශ සේවා සැපයුම් අගය මත සියයට විස්සක් වූ අනුප්‍රමාණයකින් ද වූ,

විදුලි සංදේශ බද්ද යනුවෙන් හඳුන්වනු ලබන බද්දක් එක් එක් මාසය සම්බන්ධයෙන් එම විදුලි සංදේශ සේවා ලැබීමේ දී ක්‍රියාකරු විසින් සපයනු ලබන විදුලි සංදේශ සේවා සැපයුමේ අගය මත පනවා අයකරගනු ලැබිය යුතු ය.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:–

(1) "විදුලි සංදේශ සේවාව" යන අර්ථනිරූපණය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථනිරූපණය ආදේශ කිරීමෙන්:–

"විදුලි සංදේශ සේවාව" යන්නෙන් 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 17 වන වගන්තිය යටතේ බලපත්‍ර ලැබූ විදුලි සංදේශ හා වෙනත් ක්‍රියාකරුවන් විසින් අවසාන ග්‍රාහකයන්ට සපයනු ලබන සේවා අදහස් වන අතර, එයට අන්තර්ජාල සේවා ඇතුළත් වන නමුත් 2004 අංක 11 දරන මුදල් පනතේ III වන කොටසේ 21 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ආවරණය වූ දේශීය ක්‍රියාකරුවන්, ජාත්‍යන්තර සංවිධාන අතර සලසනු ලබන සහ දේශීය ක්‍රියාකරුවන් සහ විදේශීය විදුලි සංදේශ සමාගම් අතර සහ දේශීය ක්‍රියාකරුවන් සහ විදේශීය විදුලි සංදේශ සේවා සපයන්නන් අතර සහ ජාත්‍යන්තර විදුලි සංදේශ සේවා අතර ඇති කර ගත් අන්තර් සම්බන්ධතා සේවාවන් සහ ප්‍රවේශ සේවාවන් ඇතුළත් නොවේ.

(2) "අන්තර් සම්බන්ධතා සේවා" යන අර්ථනිරූපණයට ඉක්බිතිවම පහත දැක්වෙන අර්ථනිරූපණය ඇතුළත් කිරීමෙන්:–

"අන්තර්ජාල සේවා" යන්නෙන් නැරෝබෑන්ඩ්, බ්‍රෝඩ්බෑන්ඩ් හෝ පිළිගත් අන්තර්ජාල ප්‍රවේශයන් වශයෙන් වූ අන්තර්ජාල සැපයීම් අදහස් වේ.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය යටතේ බලය දෙන ලද යම් ක්‍රියාකරුවකු විසින් යම් ග්‍රාහකයකුගෙන් 2013 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වී 2013 මාර්තු මස 31 වන දිනයෙන් අවසන්වන කාලසීමාව තුළ දී මෙම පනතේ විධිවිධාන සලස්වා ඇති පරිදි විදුලි සංදේශ බද්ද අයකර එකතු කරන අවස්ථාවක දී, එම බද්ද සියලු කාර්ය සඳහා වලංගු ලෙස අය කර, එකතු කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය:

එසේ වුව ද, මේ වගන්තියේ ඉහත කී විධිවිධාන එකී කාල සීමාව තුළ දී අයකර එකතු කරනු ලැබූ එම බදු මුදල් සම්බන්ධයෙන් යම් අධිකරණයක් විසින් නිකුත් කරන ලද යම් තීරණයකට හෝ ආඥාවකට හෝ යම් අධිකරණයක විභාග වෙමින් පවතින නීති කෘත්‍යයකට බල නොපෑ යුතු ය.

5. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

## 2013 අංක 9 දරන රේගු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2013 මාර්තු මස 22 වන දින]

**(235 වන අධිකාරය වූ) රේගු ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:–

1. මේ පනත 2013 අංක 9 දරන රේගු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ:–

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (235 වන අධිකාරය වූ) රේගු ආඥා පනතේ 10 වන වගන්තියේ (1) වන උප වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උප වගන්ති ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:–

"(1අ) ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද හෝ ශ්‍රී ලංකාවෙන් අපනයනය කරන ලද භාණ්ඩයක් මත රේගු බදු පැනවීමට අදාළව හෝ එකී භාණ්ඩ රේගු බද්දෙන් නිදහස් කිරීමට අදාළව හෝ එකී භාණ්ඩ මත හෝ භාණ්ඩ පිළිබඳ පැහැදිලි කිරීම් හෝ විස්තර මත රේගු බදු ගෙවීම හා සම්බන්ධ කොන්දේසියකට හෝ ව්‍යතිරේකයකට අදාළව යම් ආරවුලක් ඇති වන අවස්ථාවක දී අවස්ථාවෝචිත පරිදි එම භාණ්ඩවල ආනයනකරු විසින් හෝ අපනයනකරු විසින් වහාම තීරණය කිරීම සඳහා රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කළ හැකි ය.

(1ආ) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එකී ඉල්ලීම ලැබුණු දින සිට දින අනූවක් ඇතුළත (1අ) වගන්තිය යටතේ තමා වෙත යොමු කරන ලද ආරවුල පිළිබඳ තීරණය කළ යුතු ය.

(1ඇ) (අ) අවස්ථාවෝචිත පරිදි ආනයනකරු හෝ අපනයනකරු වෙත (1ආ) වගන්තියේ නිශ්චිතව දැක්වෙන කාලසීමාව ඇතුළත තීරණය දැනුම් දීමට අධ්‍යක්ෂ ජනරාල්වරයා අපොහොසත් වන අවස්ථාවක; හෝ

(ආ) එවැනි තීරණයකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්"

අවස්ථාවෝචිත පරිදි 1 (ආ) උප වගන්තියේ නිශ්චිතව දැක්වෙන කාලසීමාව අවසන් වීමේ දින සිට හෝ එකී තීරණය ලැබීමේ දින සිට දින තිහක් ඇතුළත 2011 අංක 23 දරන බදු අභියාචනා කොමිෂන් සභාව පනතේ විධිවිධාන යටතේ පිහිටුවනු ලැබූ බදු අභියාචනා කොමිෂන් සභාව වෙත අභියාචනය කරනු ලැබිය හැකි ය.".

3. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

# 2013 අංක 11 දරන ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2013 අප්‍රේල් මස 23 වන දින]

**2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:–

1. මේ පනත 2013 අංක 11 දරන ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර එම පනතේ අදාළ වගන්තිවල ක්‍රියාත්මක වීමේ වෙනත් දිනයන් නිශ්චිතව සඳහන් කර ඇත්නම් මිස, මේ පනත 2013 ජනවාරි මස 1 දින සිට ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

2. 2012 අංක 9 දරන පනත මගින් අවසන්වරට සංශෝධිත (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනතේ 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තව දුරටත් සංශෝධනය කරනු ලැබේ:–

(1) එම වගන්තියේ (3) වන උපවගන්තියේ (iii) ඡේදයේ "එම කාර්තුවේ දී ගෙවන ලද" යන වචන වෙනුවට "2009 පෙබරවාරි මස 1 දින සිට බලපවත්වන පරිදි ආනයනය මත ගෙවන ලද නිෂ්පාදන බදු හැර එම කාර්තුවේ දී ගෙවන ලද" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ; සහ

(2) එම වගන්තියේ (4) වන උපවගන්තියේ -

(අ) එහි (iii) වන ඡේදය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :–

"(iii) (iv) ඡේදයේ සඳහන් සේවා හැර, අදාළ කාර්තුව සඳහා භාණ්ඩ හෝ සේවා සැපයීමෙන් ඒ තැනැත්තාගේ බද්දට යටත්වන පිරිවැටුම-

(අ) අදාළ කාර්තුව 2011 ජනවාරි මස 1 දින සිට හෝ එදිනට පසුව ආරම්භ වී 2013 ජනවාරි මස 1 දිනට පෙර වූ යම් කාර්තුවක් වන විට, රුපියල් පන් ලක්ෂයක් නොඉක්මවන්නේ නම් ; සහ

(ආ) අදාළ කාර්තුව 2013 ජනවාරි මස 1 දින හෝ එදිනට පසුව ආරම්භවන කාර්තුවක් වනවිට රුපියල් මිලියන තුනක් නොඉක්මවන්නේ නම් ;";

(ආ) එහි (iv) වන ඡේදයේ "නොඉක්මවන විට." යන වචන වෙනුවට "නොඉක්මවන විට;" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ඇ) එහි (iv) වන ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන් :–

(v) ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන යම් පුද්ගලයකු-

(i) 2013 ජනවාරි මස 1 දින හෝ ඉන් පසුව විදේශ සේවා නියුක්තියක යෙදී සිට ආපසු පැමිණ ඇත්නම් ; සහ

(ii) එම ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා තමා ඉපැයූ විදේශ මුදල් ආයෝජනය කරන්නේ නම් ;

එම කාර්තුව 2013 ජනවාරි මස 1 දින හෝ ඉන් පසුව ආරම්භ වන කාර්තුවක් නම් එම පුද්ගලයාගේ බද්දට යටත් වන පිරිවැටුම වනුයේ එම පුද්ගලයා විසින් මත්පැන් හෝ දුම්කොළ නිෂ්පාදනය හැර යම් භාණ්ඩයක් නිෂ්පාදනය කිරීමේ නව ව්‍යාපාරයකින් ලැබෙන පිරිවැටුම හෝ එම පුද්ගලයා විසින් සපයනු ලබන සේවාවකින් ලැබෙන පිරිවැටුම වන විට එම පුද්ගලයා වාණිජ මෙහෙයුම් ආරම්භ කළ තක්සේරු වර්ෂය ආරම්භයේ සිට ගණන් බලනු ලබන අවුරුදු පහක කාලයක් සඳහා,".

3. 2012 අංක 9 දරන පනත මගින් අවසන්වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :–

(1) එම උපලේඛනයේ (I) වන කොටසෙහි -

(අ) (i) අයිතමයේ "නිෂ්පාදකයා" යන වචනය වෙනුවට "නිෂ්පාදකයා" යන වචනය ආදේශ කිරීමෙන් ;

(ආ) එහි (iv) වන අයිතමයේ (iv) ඡේදයේ "එම ද්‍රව්‍යය ශ්‍රී ලංකාවට ආනයනය කිරීමේ දින සිට අවුරුදු එකක කාලයක් ඇතුළත" යන වචන වෙනුවට "එම ද්‍රව්‍යය ශ්‍රී ලංකාවට ආනයනය කිරීමේ දින සිට අවුරුදු එකක කාලයක් ඇතුළත හෝ එම ව්‍යාපෘතිය අවසන් කිරීමෙන් පසුව දින අනුවක කාලයක් ඇතුළත" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඇ) එහි (xxxvi) අයිතමයේ "කිලෝ ග්‍රෑම් එකකට රුපියල් 75 බැගින් වූ සෙස් බද්දකට" යන වචන හා ඉලක්කම් වෙනුවට "1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නිකුත් කරන ලද ගැසට් නිවේදනයේ නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණය අනුව වූ සෙස් බද්දකට" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(ඈ) එහි (xxxviii) වන අයිතමයෙහි "කරනු ලබන සිත්තම්." යන වචන වෙනුවට "කරනු ලබන සිත්තම් ;" යන වචන ආදේශ කිරීමෙන්;

(ඉ) එහි (xxxviii) අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අයිතම ඇතුළත් කිරීමෙන් -

"(XXXIX) ආනයනය කරනු ලබන අවස්ථාවේ දී රේගු කාර්ය සඳහා නිශ්චිතව සඳහන් කරන ලද ශීර්ෂ අංක යටතේ වර්ගීකරණය කරන ලද සූර්ය බලශක්තිය උත්පාදනය කිරීම සඳහා වූ සූර්ය බලශක්ති ඒකක, උපාංග හෝ සූර්ය බලශක්ති ගෘහස්ථ පද්ධති ;

(XL) ගල් අඟුරු ;

(XLI) මුදල් අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද යම් ජාත්‍යන්තර කටයුත්තක් සඳහා ආනයනය කරන ලද ද්‍රව්‍ය ;

(XLII) (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනතේ 6අ වගන්තියේ (අ) ඡේදය යටතේ නිශ්චිතව දක්වා ඇති

අනුප්‍රමාණ අනුව විශේෂ සේවා ගාස්තුවකට යටත් වන ආනයනය කරන ලද මැණික් සහ එම මැණික් පසුව පිරිසැකසුම් කල මැණික් වශයෙන් විකිණීම ;

(XLIII) අදාළ රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් අනුමත කරනු ලැබුවා වූ ද, මහජනතාව වෙත සේවය ලබා දීමේ කාර්ය සඳහා යම් පළාත් පාලන ආයතනයක් විසින් සිදු කරනු ලබන කැලි කසල බැහැර කිරීමේ කටයුතු සඳහා භාවිත කිරීමට ආනයනය කරනු ලබන ගලි බවුසර්, යන්ත්‍රෝපකරණ හෝ උපකරණ ;

(XLIV) යම් ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියකට හෝ මුදල් අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද විශේෂිත ව්‍යාපෘතියකට හෝ ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ආයෝජන මණ්ඩල පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙත ලියාපදිංචි වී ඇති සමාගමකට විකුණනු ලබන්නා වූ ද, 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 වන වගන්තියේ (4) වන උපවගන්තිය ප්‍රකාරව ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස හඳුනාගනු ලැබූ සමාගමක් විසින් නිෂ්පාදනය කරනු ලැබුවා වූ ද, ද්‍රව්‍යයක් ආනයන ප්‍රතියෝජනයක් ලෙස සලකනු ලබන තාක් දුරට සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කාලය තුළ දී එකී ද්‍රව්‍ය සපයන තාක් දුරට එකී ද්‍රව්‍ය ; සහ

(XLV) 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩලය පනත යටතේ පිහිටුවනු ලැබූ ලංකා විදුලිබල මණ්ඩලය විසින් හෝ එකී මණ්ඩලය සමඟ විදුලි බලය සැපයීම සඳහා ගිවිසුමකට ඇතුළත් වී ඇති යම් ආයතනයක් විසින් විදුලි බලය උත්පාදනය කිරීමේ කාර්ය සඳහා ආනයනය කරනු ලබන්නා වූ ද රේගු කාර්ය සඳහා නිශ්චිතව සඳහන් කරන ලද ශීර්ෂ අංක යටතේ වර්ගීකරණය කරනු ලැබුවා වූ ද, මුදල් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබුවා වූ ද, යන්ත්‍රෝපකරණ හෝ උපකරණ.".

(2) එම උපලේඛනයේ (II) වන කොටසෙහි -

(අ) (xxvi) වන අයිතමයෙහි "වරායන් සඳහා හෝ ගුවන් යානා සඳහා" යන වචන වෙනුවට "වරායන් සඳහා හෝ ගුවන් තොටුපල සඳහා" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) එහි (xxxiv) වන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අයිතම ඇතුළත් කිරීමෙන් :–

"(xxxv) (422 වන අධිකාරය වූ) මුදල් නීති පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සපයනු ලබන යම් සේවාවක් ; සහ

(xxxvi) පාර්ලිමේන්තුව විසින් ඒකාබද්ධ අරමුදලින් සම්මත කර ගනු ලබන අරමුදල්වලින් හෝ ආණ්ඩුව විසින් සලස්වා දෙනු ලබන යම් ණය මුදලකින් යම් රාජ්‍ය සංස්ථාවක් විසින් ආණ්ඩුව වෙනුවෙන් නොමිලයේ ඉටු කරනු ලබන යම් සේවාවක්.".

4. 2013 ජනවාරි මස 1 දිනයෙන් ආරම්භ වී මෙම පනත සම්බන්ධයෙන් කථානායකවරයාගේ සහතිකය ඔහුගේ අත්සන ඇතිව සටහන් කරනු ලැබූ දිනයෙන් අවසන් වන කාලසීමාව තුළ දී ප්‍රධාන ප්‍රඥප්තියේ පිළිවෙලින් 4 වන හෝ 5 වන වගන්ති වලින් විධිවිධාන සලස්වා ඇති ආකාරයට අවස්ථාවෝචිත පරිදි, දේශීය ආදායම් කොමසාරිස්-ජනරාල්වරයා හෝ රේගු අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් මේ පනතේ විධිවිධාන සැලකිල්ලට ගනිමින් ගණනය කරනු ලැබූ බදු මුදල මේ පනතේ විධිවිධාන අදාළ වන යම් තැනැත්තකුගෙන් එකතු කරනු ලබන අවස්ථාවක දී එම එකතු කිරීම සියලු කාර්ය සඳහා වලංගු ලෙස අය කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය:

එසේ වුව ද, මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන, ඉහත කී කාලසීමාව තුළ අයකරන ලද හෝ එකතු කරන ලද එම බද්ද සම්බන්ධයෙන් අධිකරණයකින් දෙන ලද තීරණයකට හෝ ආඥාවකට හෝ අධිකරණයක අවසන් නොවී පවතින නීති කෘත්‍යයකට බලපානු නොලැබිය යුතු ය.

5. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

## 2013 අංක 12 දරන මුදල් පනත

[සහතිකය සටහන් කළේ 2013 අප්‍රේල් මස 23 වැනි දින]

**1995 අංක 16 දරන මුදල් පනත, 2003 අංක 25 දරන මුදල් පනත සහ 2012 අංක 12 දරන මුදල් පනත සංශෝධනය කිරීම පිණිසද; බෝග රක්ෂණ බද්දක් පැනවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :–

1. මේ පනත 2013 අංක 12 දරන මුදල් පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

I වන කොටස

### 1995 අංක 16 දරන මුදල් පනතේ II වන කොටස සංශෝධනය කිරීම

2. (මේ කොටසේ මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1995 අංක 16 දරන මුදල් පනතේ 5 වන වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:–

"(1අ) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, (203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනත යටතේ ද්විත්ව කාර්යය වාහනයක් වශයෙන් ලියාපදිංචි කරනු ලැබූ සැහැල්ලු ට්‍රක් රථයක් සම්බන්ධයෙන් එම අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්ය මෝටර් වාහන බද්ද 2013 ජනවාරි මස 1 වන දින සිට බලපවත්වන පරිදි, අයකරනු නොලැබිය යුතු ය.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:–

(1) ඒ වගන්තියේ "ඩීසල් මෝටර් වාහනය" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන් :–

" "ද්විත්ව කාර්ය වාහනය" යන්නට (203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනතේ එම යෙදුමට දී ඇති අර්ථය ම තිබිය යුතු ය ; ";

(2) "සුඛෝපභෝගී මෝටර් වාහනය" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන් :–

" "සැහැල්ලු ට්‍රක් රථය" යන්නෙන් භාණ්ඩ ගෙන යාමේ කාර්යය සඳහා සම්පූර්ණයෙන් හෝ ප්‍රධාන ලෙස නිර්මාණය කරනු ලැබූ හෝ සාදනු ලැබුවා වූ ද, රියදුරු සහ මගියා සඳහා එකම හරස් රේඛාවේ තනි පෙළට අසුන් ගැනීමේ පහසුකම් සහිත රියදුරු කුටියක් සහිත ද්විත්ව කාර්ය වාහනයක් අදහස් වේ ;";

(3) "අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්ය මෝටර් වාහනය" යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන් :–

" "අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්ය මෝටර් වාහනය" යන්නෙන් ද්විත්ව කාර්ය වාහනයක් ලෙස (203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනත යටතේ ලියාපදිංචි කර ඇති සුඛෝපභෝගී හෝ අර්ධ සුඛෝපභෝගී මෝටර් වාහනයක් අදහස් වේ ;".

4. 2013 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වී, මෙම පනත සම්බන්ධයෙන් කථානායකවරයාගේ සහතිකය ඔහුගේ අත්සන ඇතිව සටහන් කරනු ලැබූ දිනයෙන් අවසන් වන කාලසීමාව තුළ දී, ප්‍රධාන ප්‍රඥප්තියේ විධිවිධාන සලස්වා ඇති ආකාරයට සැහැල්ලු ට්‍රක් රථයක් සම්බන්ධයෙන් අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්ය මෝටර් වාහන බද්ද අය කරනු ලැබූ හෝ එකතු කරනු ලැබූ යම් තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක්, නිසි බලය ඇතිව ක්‍රියා කර ඇති ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ බදු එකතු කර ගැනීම වලංගු ආකාරයෙන් කරනු ලැබ ඇති හා කරන ලද ලෙස සලකනු ලැබිය යුතු ය:

එසේ වුව ද, ඉහතින් වූ විධිවිධාන, එම කාලසීමාව තුළ අයකරන ලද හෝ එකතු කරන ලද එම බද්ද සම්බන්ධයෙන් අධිකරණයකින් දෙන ලද තීරණයකට හෝ ආඥාවකට හෝ අධිකරණයක අවසන් නොවී පවතින නීති කෘත්‍යයකට බලපානු නොලැබිය යුතු ය.

II වන කොටස

## 2003 අංක 25 දරන මුදල් පනතේ II වන කොටස සංශෝධනය කිරීම

5. 2003 අංක 25 දරන මුදල් පනතේ II වන කොටස (සංචාරක සංවර්ධන බද්ද), ඒ කොටසේ 11 වන වගන්තියේ "කොමිස් මුදලින් එම බදු ද අයකරනු නොලැබිය යුතු ය." යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:–

"කොමිස් මුදලින් එම බද්ද අය කරනු නොලැබිය යුතු ය:

එසේම තව දුරටත්, එම බද්ද රුපියල් මිලියන දොළහක් නොඉක්මවන වාර්ෂික පිරිවැටුමක් හෝ කාර්තුවකට රුපියල් මිලියන තුනක් නොඉක්මවන පිරිවැටුමක් සහිත යම් ආයතනයකින් අය කරනු නොලැබිය යුතු ය.".

III වන කොටස

## 2012 අංක 12 දරන මුදල් පනතේ IV වන කොටස සංශෝධනය කිරීම

6. (මේ කොටසේ මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන ) 2012 අංක 12 දරන මුදල් පනතේ IV වන කොටසේ ශීර්ෂය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ශීර්ෂය ආදේශ කරනු ලැබේ:–

**"ඇතැම් පනත්වල විධිවිධාන අදාළවීමෙන් ඇතැම් ව්‍යවසායන් නිදහස් කිරීම".**

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය, ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:–

"(අ) මේ පනත යටතේ නියෝග මගින් ප්‍රකාශයට පත් කරන ලද නිදහස් වරායක දී හෝ බන්ධිත ප්‍රදේශයක දී එම කටයුතුවල නිරතවිය හැකි ය ; ".

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය, ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:–

"(අ) මේ පනත යටතේ නියෝග මගින් ප්‍රකාශයට පත් කරන ලද නිදහස් වරායක දී හෝ බන්ධිත ප්‍රදේශයක දී එම කටයුතුවල නිරත විය හැකි ය ; ".

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය, ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:–

"(අ) මේ පනත යටතේ නියෝග මගින් ප්‍රකාශයට පත් කරන ලද නිදහස් වරායක දී හෝ බන්ධිත ප්‍රදේශයක දී එම කටයුතුවල නිරත විය හැකි ය ; ".

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 18අ, 18ආ සහ 18ඇ වගන්ති වශයෙන් බලපැවැත්විය යුතු ය:–

18අ. (1) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ඇතිකර ගත් ගිවිසුමක අර්ථානුකූලව පහත දැක්වෙන යම් ව්‍යාපාරයක් හෝ ව්‍යාපාරවල නිරතවන යම් ව්‍යවසායක්, (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති පනත්වල විධිවිධාන අදාළ වීමෙන් නිදහස් වන්නේ ය:–

(අ) ආනයනය, සුළු පිරිසැකසුම් සහ ප්‍රතිඅපනයනය සම්බන්ධ අන්තරාල වෙළෙඳාම;

(ආ) එක් රටකින් සපයනු ලැබිය හැකි හෝ එක් රටක දී නිෂ්පාදනය කරන ලද හෝ භාණ්ඩ ශ්‍රී ලංකාවට ගෙන එනු ලැබීමෙන් තොරව වෙනත් රටකට නැව්ගත කළ හැකි අක්වෙරළ ව්‍යාපාර;

(ඇ) විදේශීය සේවාදායකයන්ට පෙර නිමි සේවා සැපයීම;

(ඈ) මූල්‍ය සැපයුම් දාමය කළමනාකරණය කිරීම සහ බිල්ගත කිරීම් මෙහෙයවීම මගින් ප්‍රධාන පෙළේ ගැනුම්කරුවන්ගේ මූලස්ථාන මෙහෙයුම් කටයුතු සිදු කිරීම;

(ඉ) ශ්‍රී ලංකාව තුළ බන්ධිත ගුදම් හෝ විවිධ රටවල් සංගෘහිත කිරීම වැනි සැපයුම් සේවා සිදු කිරීම.

(2) ප්‍රතිඅපනයනය කිරීම සඳහා භාණ්ඩ, ගුදම් භාණ්ඩ හෝ වෙළෙඳ භාණ්ඩ ආනයනය කිරීමෙහි නිරතව සිටින (1) වන උපවගන්තියේ සඳහන් යම් ව්‍යවසායක්-

(අ) මේ පනතේ නියෝග මගින් ප්‍රකාශයට පත් කරන ලද නිදහස් වරායක දී හෝ බන්ධිත ප්‍රදේශයක දී එම කටයුතුවල නිරතවිය හැකි ය;

(ආ) එවැනි නිදහස් වරායක සිට හෝ එවැන්නක් දක්වා හෝ බන්ධිත ප්‍රදේශයක සිට හෝ එවැන්නක් දක්වා ශ්‍රී ලංකා භූමියෙන් හෝ ශ්‍රී ලංකා භූමියට භාණ්ඩ සංචලනය කිරීමේ දී, (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, එම භාණ්ඩ, අවස්ථාවෝචිත පරිදි, ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද හෝ ශ්‍රී ලංකාවෙන් අපනයනය කරන ලද භාණ්ඩ ලෙස සලකා රේගු ආඥාපනතේ විධිවිධානවලට යටත් විය යුතු ය.

(3) භාණ්ඩ, ගුදම් භාණ්ඩ හෝ වෙළෙඳ භාණ්ඩ සංචලනයෙහි නොයෙදෙන, (1) වන උපවගන්තියේ සඳහන් යම් ව්‍යවසායක් ඉහත සඳහන් නිදහස් වරායකින් හෝ බන්ධිත ප්‍රදේශයකින් පිටත තම ක්‍රියාකාරකම් සිදු කරනු ලැබිය හැකි ය.

18ආ. (1) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ඇති කරගත් ගිවිසුමක අර්ථානුකූලව පහත දැක්වෙන යම් ව්‍යාපාරයක් හෝ ව්‍යාපාරවල නිරතවන, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ දී හෝ එදිනට පසුව පිහිටුවන ලද යම් නව ව්‍යවසායක්, (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, අදාළ වන නිදහස් කිරීම් ප්‍රදානය කරනු ලබන 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ අදාළ වගන්තිවල දක්වා ඇති නියමයන් සපුරා ඇත්නම්, එම අදාළ වගන්තියෙන් ප්‍රදානය කරනු ලබන නිදහස් කිරීම සඳහා සුදුසුකම් ලබන්නේ ය:–

(අ) ආනයනය, සුළු පිරිසැකසුම් සහ ප්‍රතිඅපනයනය සම්බන්ධ අන්තරාල වෙළෙඳාම;

(ආ) එක් රටකින් සපයනු ලැබිය හැකි හෝ එක් රටක දී නිෂ්පාදනය කරන ලද හෝ භාණ්ඩ ශ්‍රී ලංකාවට ගෙන එනු ලැබීමෙන් තොරව වෙනත් රටකට නැව්ගත කළ හැකි අක්වෙරළ ව්‍යාපාර;

(ඇ) විදේශීය සේවාදායකයන්ට පෙර නිමි සේවා සැපයීම;

(ඈ) මූල්‍ය සැපයුම් දාමය කළමනාකරණය කිරීම සහ බිල්ගත කිරීම් මෙහෙයවීම මගින් ප්‍රධාන පෙළේ ගැනුම්කරුවන්ගේ මූලස්ථාන මෙහෙයුම් කටයුතු සිදු කිරීම;

(ඉ) ශ්‍රී ලංකාව තුළ බන්ධිත ගුදම් හෝ විවිධ රටවල් සංගෘහිත කිරීම වැනි සැපයුම් සේවා සිදු කිරීම.

(2) ප්‍රතිඅපනයනය කිරීම සඳහා භාණ්ඩ, ගුදම් භාණ්ඩ හෝ වෙළෙඳ භාණ්ඩ ආනයනය කිරීමෙහි නිරතව සිටින (1) වන උපවගන්තියේ සඳහන් යම් නව ව්‍යවසායක් -

(අ) මේ පනතේ නියෝග මගින් ප්‍රකාශයට පත් කරන ලද නිදහස් වරායක දී හෝ බන්ධිත ප්‍රදේශයක දී එම කටයුතුවල නිරත විය හැකිය;

(ආ) එවැනි නිදහස් වරායක සිට හෝ එවැන්නක් දක්වා හෝ බන්ධිත ප්‍රදේශයක සිට හෝ එවැන්නක් දක්වා ශ්‍රී ලංකා භූමියෙන් හෝ ශ්‍රී ලංකා භූමියට භාණ්ඩ සංචලනය කිරීමේ දී, (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, එම භාණ්ඩ, අවස්ථාවෝචිත පරිදි, ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද හෝ ශ්‍රී ලංකාවෙන් අපනයනය කරන ලද භාණ්ඩ ලෙස සලකා රේගු ආඥාපනතේ විධිවිධානවලට යටත් විය යුතු ය.

(3) භාණ්ඩ, ගුදම් භාණ්ඩ හෝ වෙළෙඳ භාණ්ඩ සංචලනයෙහි නොයෙදෙන, (1) වන උපවගන්තියේ සඳහන් යම් නව ව්‍යවසායක් ඉහත සඳහන් නිදහස් වරායකින් හෝ බන්ධිත ප්‍රදේශයකින් පිටත තම ක්‍රියාකාරකම් සිදු කරනු ලැබිය හැකි ය.

18ඇ. (1) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ඇති කරගත් ගිවිසුමක අර්ථානුකූලව පහත දැක්වෙන යම් ව්‍යාපාරයක් හෝ ව්‍යාපාරවල නිරතවන, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ දී හෝ එදිනට පසුව පිහිටුවනු ලැබුවා වූ ද, 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 වන වගන්තිය ප්‍රකාර ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් වශයෙන් හඳුනාගනු ලැබුවා වූ ද, යම් නව

ව්‍යාවසායක්, (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ ප්‍රදානය කරනු ලබන නිදහස් කිරීම්වලට සුදුසුකම් ලබන්නේ ය :–

(අ) ආනයනය, සුළු පිරිසැකසුම් සහ ප්‍රතිඅපනයනය සම්බන්ධ අන්තරාල වෙළෙඳාම;

(ආ) එක් රටකින් සපයනු ලැබිය හැකි හෝ එක් රටක දී නිෂ්පාදනය කරන ලද හෝ භාණ්ඩ ශ්‍රී ලංකාවට ගෙන එනු ලැබීමෙන් තොරව වෙනත් රටකට නැව්ගත කළ හැකි අක්වෙරළ ව්‍යාපාර;

(ඇ) විදේශීය සේවාදායකයන්ට පෙර නිමි සේවා සැපයීම;

(ඈ) මූල්‍ය සැපයුම් දාමය කළමනාකරණය කිරීම සහ බිල්ගත කිරීම් මෙහෙයවීම මගින් ප්‍රධාන පෙළේ ගැනුම්කරුවන්ගේ මූලස්ථාන මෙහෙයුම් කටයුතු සිදු කිරීම ;

(ඉ) ශ්‍රී ලංකාව තුළ බන්ධිත ගුදම් හෝ විවිධ රටවල් සංගෘහිත කිරීම වැනි සැපයුම් සේවා සිදු කිරීම.

(2) ප්‍රතිඅපනයනය කිරීම සඳහා භාණ්ඩ, ගුදම් භාණ්ඩ හෝ වෙළෙඳ භාණ්ඩ ආනයනය කිරීමෙහි නිරතව සිටින (1) වන උපවගන්තියේ සඳහන් යම් නව ව්‍යවසායක් -

(අ) මේ පනතේ නියෝග මගින් ප්‍රකාශයට පත් කරන ලද නිදහස් වරායක දී හෝ බන්ධිත ප්‍රදේශයක දී එම කටයුතුවල නිරත විය හැකි ය;

(ආ) එවැනි නිදහස් වරායක සිට හෝ එවැන්නක් දක්වා හෝ බන්ධිත ප්‍රදේශයක සිට හෝ එවැන්නක් දක්වා ශ්‍රී ලංකා භූමියෙන් හෝ ශ්‍රී ලංකා භූමියට භාණ්ඩ සංචලනය කිරීමේ දී, (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, එම භාණ්ඩ, අවස්ථාවෝචිත පරිදි, ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද හෝ ශ්‍රී ලංකාවෙන් අපනයනය කරන ලද භාණ්ඩ ලෙස සලකා රේගු ආඥාපනතේ විධිවිධානවලට යටත් විය යුතු ය.

(3) භාණ්ඩ, ගුදම් භාණ්ඩ හෝ වෙළෙඳ භාණ්ඩ සංචලනයෙහි නොයෙදෙන, (1) වන උපවගන්තියේ සඳහන් යම් නව ව්‍යවසායක් ඉහත සඳහන් නිදහස් වරායකින් හෝ බන්ධිත ප්‍රදේශයකින් පිටත තම ක්‍රියාකාරකම් සිදු කරනු ලැබිය හැකි ය.

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තියේ "16 වන, 17 වන සහ 18 වන වගන්ති" යන වචන හා ඉලක්කම් වෙනුවට "16, 17, 18, 18අ, 18ආ සහ 18ඇ වගන්ති" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්ති 19අ සහ 19ආ ලෙස බලපැවැත්විය යුතු ය:–

19අ. (1) මේ පනතින් නියෝග සෑදිය යුතු යයි නියමිත හෝ නියෝග සෑදීමට බලය දී ඇති සියලු කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ ව්‍යාප්තියට අගතියක් නොමැතිව, අමාත්‍යවරයා විසින්, නියෝග මගින්-

(අ) මේ පනතේ මේ කොටසේ කාර්ය සඳහා නිදහස් වරාය සහ බන්ධිත ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම;

(ආ) මේ පනතේ මේ කොටස යටතේ සඳහන් ව්‍යවසායන් සඳහා ආයෝජන සීමා සහ අනෙකුත් නිර්ණායක නිශ්චිතව දැක්වීම;

(ඇ) දේශීය වෙළඳාම් සම්බන්ධයෙන් කොන්දේසි සහ නිදහස් කිරීම් නිශ්චිතව දැක්වීම ;

(ඈ) මේ පනතේ මේ කොටස යටතේ නිදහස් කිරීම් ප්‍රදානය කිරීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය නිශ්චිතව දැක්වීම; සහ

(ඉ) මෙහෙයුම් බලධරයන් සහ මෙහෙයුම් යාන්ත්‍රනය නිශ්චිතව දැක්වීම.

(3) (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු අතර, එසේ පළකරනු ලැබූ දිනයේ දී හෝ නියෝගයේ නිශ්චිතව සඳහන් පසු දිනයක දී ක්‍රියාත්මක විය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළකිරීමෙන් පසු හැකි පහසු ඉක්මනින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලබන සෑම නියෝගයක් ම එම අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු නමුත් එය යටතේ කලින් කරන ලද කිසිවකට හානියක් නොවිය යුතු ය.

(5) යම් නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු ය.

19ආ. මේ පනතේ මේ කොටසේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස-

"ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය" යන්නෙන් ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය අදහස් වේ;

"බන්ධිත ප්‍රදේශය" යන්නෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් හෝ රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ වෙනත් යම් බලධරයකු විසින් අධීක්ෂණය කරනු ලබන සහ මේ පනත යටතේ නියෝග මගින් ප්‍රකාශයට පත්කරන ලද ප්‍රදේශයක් අදහස් වේ;

"විනිමය පාලකවරයා" යන්නෙන් (423 වන අධිකාරය වූ) විනිමය පලන පනත යටතේ පිහිටුවන ලද විනිමය පාලන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා අදහස් වේ;

"ආනයන හා අපනයන පාලකවරයා" යන්නෙන් (236 වන අධිකාරය වූ) ආනයන හා අපනයන (පාලන) පනතේ 2 වන වගන්තිය යටතේ පත්කරන ලද ආනයන හා අපනයන පාලකවරයා අදහස් වේ;

"රේගු ආඥාපනත" යන්නේ (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනත අදහස් වේ;

"රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා" යන්නෙන් රේගු ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ පත්කරන ලද රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා අදහස් වේ;

"අන්තරාල වෙළඳාම" යන්නට මේ පනතේ මේ කොටස යටතේ අනුමත කරන ලද සහ නව ව්‍යවසායක් විසින් මෙම කොටසේ නියෝග යටතේ ප්‍රකාශ කරන ලද නිදහස් වරායක් තුළ දී සියයට දහයක අවම දේශීය එකතු කළ අගයක් සහිතව ප්‍රති අපනයනය කිරීම සඳහා පවත්වාගෙන යන යම් නිෂ්පාදන ක්‍රියාවලියක් ඇතුළත් වේ;

"නිදහස් වරාය" යන්නෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අධීක්ෂණය යටතේ මෙහෙයවනු ලබන සහ මේ පනත යටතේ නියෝග මගින් ප්‍රකාශයට පත්කරනු ලැබූ මුහුදු වරායක් හෝ ගොඩබිම් වරායක් අදහස් වේ;

"සැපයුම් සේවා" යන්නෙන් වෙනත් කරුණු අතර-

(i) ප්‍රති නැව්ගත කිරීමේ කටයුතු ;

(ii) දේශීය අපනයනකරුවන් සඳහා යෙදවුම් සහ සම්පූර්ණ කරන ලද භාණ්ඩ තාවකාලිකව ගබඩා කිරීම සඳහා ගුදම්ගත කිරීම; සහ

(iii) විදේශීය සේවාදායකයන්ට නැව් බඩු ගෙන යාමේ පහසුකම් සැලසීම,

ඇතුළත් වේ;

"ශ්‍රී ලංකා වරාය අධිකාරිය" යන්නෙන් 1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරාය අධිකාරිය පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා වරාය අධිකාරිය අදහස් වේ;

"ශ්‍රී ලංකා භූමිය" යන්නෙන් ශ්‍රී ලංකා ජනරජයේ භූමිය අදහස් වන අතර මේ පනතේ මේ කොටස යටතේ ප්‍රකාශිත යම් නිදහස් වරායක් හෝ බන්ධිත ප්‍රදේශයක් ඊට ඇතුළත් නොවේ.".

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපලේඛනය මෙයින් එකතු කරනු ලැබේ:–

උපලේඛනය (18අ වගන්තිය)

1. 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත ;
2. 2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත ;
3. 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත ;
4. 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත ;
5. 2011 අංක 18 දරන වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු පනත ;
6. 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත".

## IV වන කොටස
## බෝග රක්ෂණ බද්ද පැනවීම

14. (1) ස්වාභාවික ආපදා හේතුවෙන් ශ්‍රී ලංකාවේ ගොවීන් මුහුණ දෙන හානි ආවරණය කිරීමේ අරමුණ ඇතිව, මෙහි උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර ඇති පනත් යටතට ගැනෙන සෑම ආයතනයකින් ම එවැනි ආයතනවල බදු අය කිරීමෙන් පසු ලාභයෙන් සියයට එකක ප්‍රතිශතයක් වූ (මින්මතු මේ කොටසේ 'බද්ද' යනුවෙන් සඳහන් කරනු ලබන) බෝග රක්ෂණ බද්දක් අය කරනු ලැබිය යුතු ය.

(2) මේ කොටස යටතේ පනවනු ලැබූ බද්ද, 2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල පනත මගින් පිහිටුවන ලද ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලය විසින් පවත්වාගෙන යනු ලබන සහ පරිපාලනය කරනු ලබන වෙන් කළ ගිණුමක් වෙත ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය.

(3) මේ පනතේ මේ කොටසේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ දී අවශ්‍ය වන්නා වූ විධිවිධාන මේ පනත යටතේ සාදනු ලබන නියෝග මගින් නියම කරනු ලැබිය යුතු ය.

15. (1) මේ පනතින් නියෝග සෑදිය යුතු යයි නියමිත හෝ නියෝග සෑදීමට බලය දී ඇති සියලු කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු අතර, එසේ පළකරනු ලැබූ දිනයේ දී හෝ නියෝගයේ නිශ්චිතව සඳහන් පසු දිනයක දී ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළකිරීමෙන් පසු හැකි පහසු ඉක්මනින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලබන නියෝගයක් එම අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු නමුත් එය යටතේ කලින් කරන ලද කිසිවකට හානියක් නොවිය යුතු ය.

(4) යම් නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු ය.

16. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

උපලේඛනය (14 වන වගන්තිය)

1. 1988 අංක 30 දරන බැංකු පනත;
2. 1988 අංක 78 දරන මුදල් සමාගම් පනත ;
3. 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත.

## 2013 අංක 15 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම) (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2013 අප්‍රේල් මස 23 වන දින]

**2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :–

1. මේ පනත 2013 අංක 15 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, එකී පනත 2013 ජනවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

2. 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම) පනතේ 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :–

(අ) එම වගන්තියේ (ඉ) ඡේදයේ "4.5%" යන ඉලක්කම් ඉවත් කර ඒ වෙනුවට "7%" යන ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(ආ) එම වගන්තියේ (ඊ) ඡේදයේ "2006 ජනවාරි මස 1 වන දිනයෙන්", "සියයට අසූපහක්"සහ "2013 ජනවාරි මස 1 වන දිනයෙන්" යන ඉලක්කම් සහ වචන ඉවත් කර ඒ වෙනුවට පිළිවෙළින් "2013 ජනවාරි මස 1 වන දිනයෙන්", "සියයට අසූවක්" සහ "2020 ජනවාරි මස 1 වන දිනයෙන්" යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන්.

3. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

## 2013 අංක 16 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2013 අප්‍රේල් මස 23 වන දින]

**2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :–

1. මේ පනත 2013 අංක 16 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය 2013 ජනවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

2. 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ, උපලේඛනයේ 10 වන අයිතමයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් අයිතමයන් එකතු කිරීම මගින්, එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :–

"11. 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත.
12. 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු පනත.".

3. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

## 2013 අංක 17 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2013 අප්‍රේල් මස 24 වන දින]

**2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:–

1. මේ පනත 2013 අංක 17 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය අදාළ වගන්තිවල වෙනස් ක්‍රියාත්මක වීමේ දින නිශ්චිතව දක්වනු ලබන්නේ නම් මිස 2013 ජනවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක වන ලෙස සලකනු ලැබිය යුතු ය.

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2012 අංක 7 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනතෙන් අවසන්වරට සංශෝධිත 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:–

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ පළමුවන අතුරුවිධානයේ (අ) ඡේදයේ සඳහන් "ඇඟළුම්" යන වචනය වෙනුවට "ඇඟළුම් හෝ රෙදි" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියේ –

(අ) එහි (ඇ) ඡේදයේ අතුරු විධානයේ "කොමසාරිස්-ජනරාල්වරයා විසින් පරිපාලනය කරනු ලැබිය යුතු ය." යන වචන වෙනුවට "මෙම වගන්තියේ (ඉ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති ආකාරයට කොමසාරිස්-ජනරාල්වරයා විසින් පරිපාලනය කරනු ලැබිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) එහි (ඈ) ඡේදයේ අතුරු "විධානයේ කොමසාරිස්-ජනරාල්වරයා විසින් පරිපාලනය කරනු ලැබිය යුතු ය." යන වචන වෙනුවට "මෙම උපවගන්තියේ (ඉ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති ආකාරයට කොමසාරිස්-ජනරාල්වරයා විසින් පරිපාලනය කරනු ලැබිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන්;

(ඇ) එම වගන්තියේ (2) වන උපවගන්තියේ (ඉ) ඡේදය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :–

"(ඉ) කොමසාරිස්-ජනරාල්වරයා විසින් පරිපාලනය කරනු ලබන සරල කරන ලද එකතු කළ අගය මත බදු යෝජනා ක්‍රමයේ ලියාපදිංචි වී ඇති යම් ලියාපදිංචි තැනැත්තකු විසින් කරනු ලබන යම් භාණ්ඩ හෝ සේවා සැපයීමේ දී, එම තැනැත්තා විසින්, ගැසට් පත්‍රයේ පළකරනු ලැබ ඇති නියමයේ සහ තත්කාර්යය සඳහා කොමසාරිස්-ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශවල නිශ්චිතව දක්වා ඇති ආකාරයට කොමසාරිස්-ජනරාල්වරයා සෑහීමට පත්වන පරිදි ස්වකීය ක්‍රියාකාරකම් කරගෙන යනු ලබන තාක්කල්–

(i) 7 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති ශුන්‍ය අනුප්‍රමාණගත සේවා අපනයනකරුවකු හෝ සේවා සපයන්නකු වෙත;

(ii) එම අදාළ සැපයුම් ව්‍යාපෘති හා සම්බන්ධිත සැපයුම් වන තාක් දුරට එම ව්‍යාපෘති ක්‍රියාත්මක වන කාලසීමාව තුළ දී, 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ පළමුවන උපලේඛනයේ II වන කොටසේ (ඊ) ඡේදයේ I වන අනුඡේදයේ දක්වා ඇති පරිදි එම පනතේ 3 වන වගන්තියේ (4) වන උපවගන්තිය ප්‍රකාරව යම් ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් සඳහා භාණ්ඩ හෝ සේවා සපයනු ලබන යම් ලියාපදිංචි තැනැත්තකු වෙත;

(iii) පළමුවන උපලේඛනයේ II වන කොටසේ (ඊ) ඡේදයේ (ii) වන අනුඡේදයේ දක්වා ඇති යම් නිශ්චිත ව්‍යාපෘතියක යෙදී සිටින යම් ලියාපදිංචි තැනැත්තකු වෙත (2011 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වන පරිදි);

(iv) යම් අපනයනකරුවකුට ශ්‍රී ලංකාවේ දී නිෂ්පාදිත භාණ්ඩ සපයනු ලබන යම් නිෂ්පාදකයකු වෙත;

(v) අපනයනය සඳහා නිෂ්පාදනය කරනු ලබන යම් භාණ්ඩවල තත්ත්වය, ස්වභාවය හෝ වටිනාකම වැඩි දියුණු කිරීම සඳහා ඉවහල්වන යම් අගය එකතු කළ සේවාවන් යම් අපනයනකරුවකු වෙත සපයනු ලබන යම් සැපයුම්කරුවකු වෙත;

(vi) එකී සැපයුම් ව්‍යාපෘතිය හා සම්බන්ධිත සැපයුම් වන තාක් කල් ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන කාලය තුළ දී 22 වන වගන්තියේ (7) වන උපවගන්තියේ විධිවිධාන යටතේ ලියාපදිංචි වී සිටින යම් තැනැත්තකු වෙත;

(vii) පවත්නා තොරතුරු අනුව, භාණ්ඩ හෝ සේවා සපයනු ලබන යම් ලියාපදිංචි තැනැත්තකුගේ එවැනි සැපයුම්වල වටිනාකම මුළු සැපයුම්වලින් සියයට පනහක ප්‍රතිශතයක් ඉක්මවන බවට කොමසාරිස්-ජනරාල්වරයා සෑහීමට පත්වන්නේ නම්, ඉහත (i), (ii), (iii), (iv), (v) හෝ (vi) වන අනුඡේදවල දක්වා ඇති යම් ලියාපදිංචි තැනැත්තකු වෙත භාණ්ඩ හෝ සේවා සපයනු ලබන යම් ලියාපදිංචි තැනැත්තකු වෙත,

එම තැනැත්තා විසින් කරනු ලබන යම් භාණ්ඩ හෝ සේවා සැපයීම සම්බන්ධයෙන්, බදු ගෙවීම් විලම්භනය කරනු ලැබිය යුතු ය.".

(3) එම වගන්තියේ (3) වන උපවගන්තියේ -

(අ) පළමු අතුරු විධානය පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ:–

(i) (අ) ඡේදයේ, "රේගු බන්ධිත ප්‍රදේශයට" යන වචන වෙනුවට "2012 අංක 12 දරන මුදල් පනතේ (IV) වන කොටසේ දක්වා ඇති රේගු බන්ධිත ප්‍රදේශයට හෝ නිදහස් වරායකට" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ii) (ඊ) ඡේදයේ "1996 අංක 33 දරන රෙදිපිළි පංගු මණ්ඩලය පනත යටතේ පිහිටුවන ලද රෙදිපිළි පංගු මණ්ඩලය යටතේ ලියාපදිංචි යම් තැනැත්තකු විසින්, රෙදිපිළි පංගු මණ්ඩලයේ අනුමතය ඇතිව සහ රේගු අධ්‍යක්ෂ-ජනරාල්වරයාගේ හෝ ආයෝජන මණ්ඩලයේ හෝ අධීක්ෂණය යටතේ" යන වචන සහ ඉලක්කම් වෙනුවට "කොමසාරිස්-ජනරාල්වරයාගේ අනුමතය ඇතිව, කොමසාරිස්-ජනරාල්වරයා විසින් පරිපාලනය කරනු ලබන, සරල කරන ලද එකතු කළ අගය මත බදු යෝජනාක්‍රමය සමග ලියාපදිංචි වී ඇති යම් තැනැත්තකු විසින්" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) එම උපවගන්තියේ දෙවන අතුරු විධානය පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ:–

(i) (අ) ඡේදයේ (vi) වන අයිතමය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:–

"(vi) කොමසාරිස්-ජනරාල්වරයා විසින් පරිපාලනය කරනු ලබන සරල කරන ලද එකතු කළ අගය මත බදු යෝජනාක්‍රමය සමඟ ලියාපදිංචි වී ඇත්තා වූ තැනැත්තකු විසින්, 2 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඉ) ඡේදයේ (i) වන අයිතමයේ දක්වා ඇති භාණ්ඩ නිෂ්පාදනය පිණිස හෝ සේවා සැපයීම පිණිස ආනයනය කරනු ලබන යම් භාණ්ඩ මත;".

(ii) (අ) ඡේදයේ (vii) වන අයිතමය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:–

"(vii) කොමසාරිස්-ජනරාල්වරයා විසින් පරිපාලනය කරනු ලබන සරල කරන ලද එකතු කළ අගය මත බදු යෝජනා ක්‍රමයේ ලියාපදිංචි වී ඇති තැනැත්තකු විසින් රේගු බන්ධිත ප්‍රදේශයකින් ලබන යම් පිරියත හෝ යන්ත්‍රසූත්‍ර ද ඇතුළුව, ආනයනය කරනු ලබන යම් පිරියත හෝ යන්ත්‍රසූත්‍ර සහ 2 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඉ) ඡේදයේ (i) වන අයිතමයේ දක්වා ඇති අපනයනය කිරීම සඳහා වන භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා භාණ්ඩ නිෂ්පාදනය කිරීම හෝ සේවා සැපයීම සඳහා එම තැනැත්තා විසින් පාවිච්චියට ගනු ලබන එවැනි පිරියත හෝ යන්ත්‍ර සූත්‍ර මත;

(iii) (අ) ඡේදයේ (viii) වන සහ (ix) වන අයිතම ඉවත් කිරීමෙන්;

(iv) එම අතුරු විධානයේ අවසානයේ ඇති "බදු මුදල් ගෙවීම් විලම්භනය කිරීම" යන වචනවල සිට එම ඡේදය අවසානය දක්වා වූ වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:–

"එසේ ආනයනය කරන ලද, ලැබුණු හෝ මිලදී ගනු ලැබූ භාණ්ඩ මත බදු ගෙවීම විලම්භනය කිරීම-

(අ) එසේ විලම්භනය කරනු ලබන බදු මුදලේ ප්‍රමාණය රුපියල් දස දහසකට අඩුවන අවස්ථාවක දී, බැංකු ඇපකරයක් ඉදිරිපත් කිරීමට; හෝ

(ආ) එසේ විලම්භනය කරනු ලබන බදු මුදලේ ප්‍රමාණය රුපියල් දස දහසකට අඩු නොවන අවස්ථාවක දී, භාණ්ඩාගාර බිල්පතක් ඉදිරිපත් කිරීමට; හෝ

(ඇ) විලම්භනය සලකා බලනු ලබන්නාවූ ගිවිසුමේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව අයවිය යුතු බදු මුදල් ආවරණය කරනු ලබන්නාවූ සමාගම් ඇපකරයක් ඉදිරිපත් කිරීමට,

යටත්ව සිදුවිය යුතු ය:

එසේ වුව ද, (ආ) ඡේදය යටතේ සිදුකරනු ලබන විලම්භනයක් සම්බන්ධයෙන් වන විට, ආනයනය කරන ලද දින සිට එක් මාසයක කාලයක් ඇතුළත ප්‍රතිඅපනයනය සඳහා රජයේ ආයතනයක් විසින් එම භාණ්ඩ ආනයනය කරනු ලැබ ඇති අවස්ථාවක දී, කිසිම ඇපකරයක් අවශ්‍ය නොවිය යුතු ය.".

3. 2006 අංක 8 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත මගින් අවසන්වරට සංශෝධිත, ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:–

(1) එම වගන්තියේ (ඉ) ඡේදයේ යම් තැනැත්තෙකු විසින් හෝ" යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:–

"යම් තැනැත්තකු විසින්,

(ඊ) එම භාණ්ඩ, මෙම වගන්තියේ ඉහතින්ම වූ ඡේද යටතේ කරනු ලබන සැපයුම් සහ 2 වන වගන්තිය යටතේ ඉවත් කර ඇති සැපයුම් හෝ පළමුවන උපලේඛනයේ II වන කොටස යටතේ නිදහස් කර ඇති සැපයුම් ඇතුළුව කවර හෝ ලිත් වර්ෂයක යම් මාස තුනක කාලසීමාවක් සඳහා රුපියල් මිලියන පන්සියයකට නොඅඩු සමස්ත සැපයුම් ප්‍රමාණයක් සහිත යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින්,'';

(2) එම වගන්තියේ අතුරු විධානය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:–

"එසේ වුව ද,–

(i) යම් ලියාපදිංචි තැනැත්තකු විසින්, 2013 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව තොග වශයෙන් හෝ සිල්ලරට සපයන ලද යම් භාණ්ඩ මත බදු අයකරන ලෙස කොමසාරිස් -ජනරාල්වරයා වෙත ඉල්ලීමක් කරන්නේ නම්;

(ii) වෙනත් යම් තැනැත්තකු විසින් 2013 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව තොග වශයෙන් හෝ සිල්ලරට සපයන ලද යම් භාණ්ඩ මත බදු අයකරන ලෙස කොමසාරිස්-ජනරාල්වරයා වෙත ඉල්ලීමක් කරන්නේ නම්, සහ 10 වන වගන්තියේ හෝ 12 වන වගන්තියේ විධිවිධාන සලසා ඇති පරිදි ලියාපදිංචියක් ලබා ගන්නේ නම් එසේ තොග වශයෙන් හෝ සිල්ලරට භාණ්ඩ සැපයීම සම්බන්ධයෙන් එම බද්ද අය කරනු ලැබිය යුතු ය.''.

(3) එම අතුරු විධානයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අතුරු විධානය එකතු කිරීමෙන්:–

''එසේම තවදුරටත්, (ඊ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති යම් ලියාපදිංචි තැනැත්තකු වෙත යොමු කරන ලද බදු අයකිරීමක් මේ පනතේ පළමු වන උපලේඛනයේ II වන කොටසේ නිශ්චිතව දක්වා ඇති, බද්දෙන් නිදහස් සැපයුම්වලට අතිරේකව විය යුතු ය.".

4. 2007 අංක 14 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත මගින් අවසන්වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය, එහි (12) වන අනුඡේදයේ "ඉහළ වටිනාකම විය යුතු ය.'' යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:–

''ඉහළ වටිනාකම විය යුතු ය;

(13) 2003 අංක 9 දරන පාරිභෝගික සේවා අධිකාරිය පනතේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, බදු අයකිරීමට යටත්වීම මේ පනතේ 3 වන වගන්තියේ (ඊ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති අවස්ථාවක දී, තොග හෝ සිල්ලර වෙළෙඳාමක් සඳහා විකිණිය යුතු භාණ්ඩ සඳහා වූ ලැයිස්තුගත සිල්ලර මිල අවශ්‍ය අවස්ථාවල දී බදු අයකිරීම සඳහා උචිත ලෙස සකස් කරනු ලැබිය හැකි ය.''.

5. 2009 අංක 15 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත මගින් අවසන්වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:–

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ (ii) වන අයිතමයේ "2009 ජනවාරි 1 වන දින හෝ ඉන් පසුව" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2009 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව එහෙත් 2013 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව," යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) එම වගන්තියේ (1) වන උපවගන්තියේ (ii) වන අයිතමයේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අයිතමය ඇතුළත් කිරීමෙන්:–

"(iii) 2013 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසු, ශ්‍රී ලංකාව තුළ යම් බදු අය කළ හැකි ක්‍රියාකාරකම් කරගෙන යන සෑම තැනැත්තකුම-

(අ) අවස්ථාවෝචිත පරිදි, යම් බදු අයකළ හැකි එක් මාසයක හෝ මාස තුනක කාලසීමාවක් අවසානයේ දී ශ්‍රී ලංකාව තුළ, අවස්ථාවෝචිත පරිදි, බදු අය කළ හැකි එක් මාසයක හෝ මාස තුනක කාලසීමාව ඇතුළත එම තැනැත්තා විසින් කරන ලද භාණ්ඩ හෝ සේවා සැපයුම් හෝ භාණ්ඩ සහ සේවා සැපයුම්වල මුළු වටිනාකම රුපියල් මිලියන තුනක් වේ නම්; හෝ

(ආ) එවකට අවසාන වන මාස 12 ක කාලසීමාව තුළ ඔහු ශ්‍රී ලංකාව තුළ කරන ලද බදු අය කළ හැකි භාණ්ඩ හෝ සේවා සැපයුම් හෝ භාණ්ඩ හා සේවා සැපයුම්වල මුළු වටිනාකම රුපියල් මිලියන දොළහක් ඉක්මවා ඇත්නම්; හෝ

(ඇ) අවස්ථාවෝචිත පරිදි, ඊළඟ එක් එක් මාසයක හෝ මාස තුනක බදු අයකළ හැකි කාලසීමාව තුළ එම තැනැත්තාගේ ශ්‍රී ලංකාවේ භාණ්ඩ හෝ සේවා සැපයුම් හෝ භාණ්ඩ හා සේවා සැපයුම්වල මුළු වටිනාකම රුපියල් මිලියන තුනක් ඉක්මවීමට ඉඩ ඇති බව හෝ ඉන් ඉක්බිතිව වූ බදු අය කළ හැකි මාස දොළහ තුළ රුපියල් මිලියන දොළහක් ඉක්මවීමට ඉඩ ඇති බව හෝ විශ්වාස කිරීමට, යම් අවස්ථාවක, යුක්තිසහගත හේතු ඇත්නම්,

මේ පනත යටතේ ලියාපදිංචි කරනු ලැබීමට යටත් විය යුතු ය.

(3) එම වගන්තියේ (2) වන උපවගන්තියේ ''මේ වගන්තියේ කාර්ය සඳහා බදු අයකළ හැකි මුළු සැපයුම්වල වටිනාකමට 3 වන වගන්තිය යටතේ බදු ගෙවීමෙන් බැහැර කරනු ලැබූ යම් තොග හෝ සිල්ලර වෙළෙඳ ක්‍රියාකාරකමක සැපයුම් ඇතුළත් නොවිය යුතු ය.'' යන වචන සහ ඉලක්කම් ඉවත්කොට ඒ වෙනුවට ''පනතේ 2 වන වගන්තිය යටතේ ඉවත් කර ඇති සැපයුම් හෝ පළමුවන උපලේඛනයේ II වන කොටස යටතේ බැහැර කරනු ලැබූ සැපයුම් ද ඇතුළුව, කවර හෝ ලිත් වර්ෂයක යම් මාස තුනක කාලසීමාවක් සඳහා සමස්ත සැපයුම්වල වටිනාකමට රුපියල් මිලියන පන්සියයකට අඩු නොවන්නේ නම් මිස, යම් තොග හෝ සිල්ලර වෙළෙඳ ක්‍රියාකාරකමක දී සැකසීමකින් තොරව දේශීය වශයෙන් මිලදී ගනු ලැබූ භාණ්ඩ සැපයුම්වල වටිනාකම ඇතුළත් නොවිය යුතු ය.'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

6. 2003 අංක 7 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත මගින් අවසන්වරට සංශෝධිත, ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ අතුරු විධානයේ "කොමසාරිස්-ජනරාල්වරයාට දැනුම්දීමට යටත් නොවිය යුතු ය." යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:–

"කොමසාරිස්-ජනරාල්වරයාට දැනුම් දීමට යටත් නොවිය යුතු ය:

එසේම තවදුරටත්, 2013 ජනවාරි මස 1 වන දින සිට බලපැවැත්වෙන පරිදි, අවස්ථාවෝචිත පරිදි, 1996 අංක 34 දරන භාණ්ඩ හා සේවා බදු පනතේ 12 වන වගන්තිය යටතේ හෝ 75 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ හෝ 80 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ ලියාපදිංචි වී ඇති යම් තැනැත්තකු, එම ලියාපදිංචි තැනැත්තා 10 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (iii) වන අයිතමයේ නිශ්චිතව දක්වා ඇති නිර්ණායක සපුරාලන්නේ නම් හෝ එම තැනැත්තා මේ පනතේ 22 වන වගන්තියේ (7) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කාලසීමාව තුළ දී ලියාපදිංචි වී ඇති තැනැත්තකු වන අවස්ථාවක දී, එම තැනැත්තා, භාණ්ඩ නිදහස් කර ගැනීම සඳහා හඳුනා ගැනීමේ අංකයක් ලබාගෙන ඇති තැනැත්තකු ලෙස සලකනු ලැබිය යුතු ය.".

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තියේ "මේ පනත යටතේ ලියාපදිංචි වීම සඳහා, කොමසාරිස්-ජනරාල්වරයා වෙත නියමිත ආකෘති පත්‍රයෙහි ඉල්ලුම්පතක් ඉදිරිපත් කළ හැකි ය:" යන වචන වෙනුවට "මේ පනත යටතේ ලියාපදිංචි වීම සඳහා 2013 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව වූ බදු අයකළ හැකි යම් කාලසීමාවක් සඳහා කොමසාරිස්-ජනරාල්වරයා වෙත නියමිත ආකෘති පත්‍රයෙහි ඉල්ලුම්පතක් ඉදිරිපත් කළ හැකි ය:" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

8. 2003 අංක 7 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත මගින් අවසන්වරට සංශෝධිත, ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය, එහි (2) වන උපවගන්තිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:–

"(2) (අ) මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ලියාපදිංචි වී සිටින යම් තැනැත්තකු; හෝ

(ආ) 2002 අගෝස්තු මස 1 වන දින 1996 අංක 34 දරන භාණ්ඩ හා සේවා බදු පනතේ 75 වන වගන්තිය හෝ 80 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ ලියාපදිංචි වී ඇතැයි සැලකෙන සහ තොග වෙළෙඳාම සහ සිල්ලර වෙළෙඳාම සඳහා ලියාපදිංචි වීම පිණිස 3 වන වගන්තියේ සඳහන් කොන්දේසි වලට යටත්ව යම් බදු අය කළ හැකි ක්‍රියාකාරකමක් කරගෙන යන හෝ කරනු ලබන අවස්ථාවක හෝ මේ පනතේ 10 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (iii) වන අයිතමයේ නිශ්චිතව දක්වා ඇති නියමයන් සපුරාලන අවස්ථාවක, ඒ තැනැත්තා,

මේ පනතේ කාර්යය සඳහා ලියාපදිංචි තැනැත්තකු ලෙස සලකනු ලැබිය යුතු ය.".

9. 2011 අංක 9 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත මගින් අවසන්වරට සංශෝධිත, ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:–

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ "ඉදිරිපත් කළ හැකිය." යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:–

"ඉදිරිපත් කළ හැකි ය:

එසේ වුව ද, 2012 දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන් වන වර්ෂයේ දී මාස තුනක කාලයක් සඳහා රුපියල් මිලියන තුනක් නොඉක්මවන සමස්ත බදු අය කළ හැකි සැපයුම් වටිනාකමක් පැවති යම් ලියාපදිංචි තැනැත්තකු හෝ 2012 දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන් වන වර්ෂයේ දී මාස දොළහක් වූ කාලයක් සඳහා රුපියල් මිලියන දොළහක් නොඉක්මවන සමස්ත සැපයුම් වටිනාකමක් ඇති යම් ලියාපදිංචි තැනැත්තකු විසින්, එම තැනැත්තාගේ බදු අයකළ හැකි සැපයුම් ප්‍රමාණය 10 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ (iii) වන අනුඡේදයේ සඳහන් සැපයුම් වටිනාකම ඉක්මවීමට ඉඩ ඇති බවට විශ්වාස කිරීමට හේතු ඇත්නම් මිස, 2013 ජනවාරි මස 1 වන දින සිට බලපැවැත්වෙන පරිදි එම ලියාපදිංචි තැනැත්තා විසින් ස්වකීය ලියාපදිංචිය අවලංගු කිරීම සඳහා ඉල්ලා සිටිය යුතු ය.";

(2) එම වගන්තියේ (5) වන උපවගන්තියේ "දිනයේ සිට බලාත්මක වන පරිදි සලකනු ලැබිය යුතු ය." යන වචන සහ ඉලක්කම් වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:–

"දිනයේ සිට බලාත්මක වන පරිදි සලකනු ලැබිය යුතු ය:

එසේ වුව ද, (1) වන උපවගන්තියේ අතුරු විධානයේ නිශ්චිතව දක්වා ඇති පරිදි ලියාපදිංචිය අවලංගු වී ඇත්තේ යම් ලියාපදිංචි තැනැත්තකුගේ ද, එම ලියාපදිංචි තැනැත්තා සම්බන්ධයෙන් වන විට,–

(අ) එම අවලංගු වීමේ දිනයට පෙරාතුවම වූ කාලයේ දී එම ලියාපදිංචි තැනැත්තාගේ (වෙළෙඳ භාණ්ඩ තොග හැර) වත්කම් වෙනත් ලියාපදිංචි තැනැත්තකු වෙත පවරා නොමැති අවස්ථාවක දී, අත්කර ගනු ලබන වත්කම්වල වටිනාකම සහ එම වත්කම් පිළිබඳ ආදායම් බදු කාර්යය සඳහා අදාළ වන ක්ෂය වීමේ අනුප්‍රමාණ මත පදනම් වන භාවිතා කිරීමේ කාලසීමාව සහ අදාළ විය හැකි වෙනත් යම් කාරණා පිළිබඳ සැලකිල්ලට ගෙන, එසේ පවරා නොමැති වත්කම්වල වටිනාකම කොමසාරිස්-ජනරාල්වරයා විසින් තීරණය කරනු ලැබිය යුතු ය;

(ආ) එම ලියාපදිංචි තැනැත්තාගේ වෙළෙඳ භාණ්ඩ තොග සඳහා වන බදු බැඳියාව, 2012 දෙසැම්බර් මස 31 වන දින වන විට අන්තර්ග්‍රහණය නොකළ යෙදවුම් බදු ප්‍රමාණය නොඉක්මවිය යුතු ය.".

10. 2007 අංක 14 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත මගින් අවසන්වරට සංශෝධිත, ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය එහි (1) වන උපවගන්තියේ "(1) සෑම ලියාපදිංචි තැනැත්තකු විසින්ම" යන වචන වලින් ආරම්භ වී "එහි ඇතුළත් විය යුතු ය." යන වචන දක්වා වූ සියලු වචන සහ ඉලක්කම් ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:–

"(1) සෑම ලියාපදිංචි තැනැත්තකුම විසින් කොමසාරිස්-ජනරාල්වරයා වෙත-

(අ) 2013 ජනවාරි මස 1 වන දිනයට පෙරාතුව අවසන් වන යම් බදු අයකළ හැකි කාලසීමාවක් සඳහා, එම එක් එක් බදු අයකළ හැකි කාලසීමාව ඉකුත් වීමෙන් පසුව එළඹෙන මාසයේ විසිවන දිනට වඩා පසු නොවී;

(ආ) 2013 ජනවාරි මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් බදු අය කළ හැකි කාලසීමාවක් සඳහා, එම එක් එක් බදු අය කළ හැකි කාලසීමාව ඉකුත් වීමෙන් පසුව එළඹෙන මාසයේ අවසන් දිනට වඩා පසු නොවී,

එම බදු අය කළ හැකි කාලසීමාව තුළ ඔහුගේ සැපයීම පිළිබඳ ලියවිල්ලකින් හෝ විද්‍යුත් මාධ්‍යයකින් වූ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය. එවැනි සෑම වාර්තාවක්ම නිශ්චිත ආකෘතියෙන් විය යුතු අතර, ඒ ආකෘතියේ දැක්වීමට නියමිත සියලු විස්තර එහි ඇතුළත් විය යුතු ය.".

11. 2012 අංක 7 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත මගින් අවසන්වරට සංශෝධිත, ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:–

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ පළමුවන අතුරු විධානය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:–

"එසේ වුව ද,

(අ) 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් හෝ රේගු අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් අනුමත කර ඇති එම පනතේ 17 වන වගන්තිය යටතේ අපනයනය කිරීම සඳහා යම් ඇඟළුම් නිෂ්පාදකයකු සමඟ එළඹ ඇති, යම් ගිවිසුමක් යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් දේශීය වශයෙන් විකිණීම සඳහා අවසර දී ඇති ඇඟළුම් ප්‍රතිශතය ඇතුළත යම් ඇඟළුම් සැපයීම මත අයවිය යුතු බදු මුදල ශ්‍රී ලංකාව ඇතුළත සපයනු ලබන එවැනි එක් එක් ඇඟළුමක් සඳහා රුපියල් විසිපහක් විය යුතුය;

(ආ) 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් හෝ රේගු අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් අනුමත කර ඇති සහ එම පනතේ 17 වන වගන්තිය යටතේ අපනයනය සඳහා යම් රෙදි නිෂ්පාදකයකු සමඟ එළඹ ඇති යම් ගිවිසුමක් යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් දේශීය වශයෙන් විකිණීම සඳහා අවසර දී ඇති පහත අනුඡේදවල නිශ්චිතව දක්වා ඇති රෙදිවලින් කරන ලද නිෂ්පාදන ද ඇතුළු රෙදි ප්‍රතිශතය ඇතුළත යම් රෙදි සැපයීම මත අයවිය යුතු බදු මුදල පහත අනුප්‍රමාණයන්ට අනුව විය යුතු ය:–

(i) ලිනන් රෙදි හෝ තිර රෙදි එක් කිලෝ ග්‍රෑමයක් සඳහා රුපියල් හතළිහයි;

(ii) තුවා සඳහා එක් අයිතමයකට රුපියල් විසිපහයි;

(iii) රෙදිවලින් නිෂ්පාදිත බෑග් සඳහා එක් අයිතමයකට රුපියල් හතළිහයි;

(iv) එක් කැබැල්ලක් දිගින් මීටර් දෙකකට වඩා වැඩි නොවන කැබලි රෙදි වශයෙන් වූ අතිරික්ත රෙදි සඳහා එක් කිලෝ ග්‍රෑමයකට රුපියල් විසිපහයි.

(v) වෙනත් යම් රෙදි සඳහා එක් කිලෝ ග්‍රෑමයකට රුපියල් හතළිහ බැගින්.".

(2) එම වගන්තියේ (5) වන උපවගන්තියේ

(අ) දෙවන අතුරු විධානයේ (ඉ) ඡේදයේ "(ඉ ) 2 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඉ) ඡේදයේ සඳහන්" යන වචන සහ ඉලක්කම්වල සිට "සියයට පනහකට වැඩි වූ අවස්ථාවක" යන වචන සහ ඉලක්කම් දක්වා වූ සියලු වචන සහ ඉලක්කම් ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:–

"(ඉ ) 2011 අප්‍රේල් මස 1 වන දින සිට බලපැවැත්වෙන පරිදි 2 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඉ) ඡේදයේ සඳහන් කොමසාරිස්-ජනරාල්වරයා විසින් පරිපාලනය කරනු ලබන සරල කරන ලද එකතු කළ අගය මත බදු යෝජනා ක්‍රමයෙහි ලියාපදිංචි වී සිටින යම් ලියාපදිංචි තැනැත්තකුගේ යෙදවුම් බද්දෙන් 2 වන වගන්තිය යටතේ විලම්භනය කරන ලද බදු ඇතුළුව යෙදවුම් බද්දේ අතිරික්තයක් පවතින අවස්ථාවක එම ඡේදයේ සඳහන් යම් සැපයුම්කරුවකුට කරන ලද සැපයුම්වල වටිනාකම, ඒ බදු අයකළ හැකි කාලසීමාව තුළ ඔහුගේ බදු අයකළ හැකි මුළු සැපයුම්වලින් සියයට පනහකට වැඩි වූ අවස්ථාවක";

(ආ) තුන්වන අතුරු විධානයේ (2) වන උපවගන්තියේ (ඉ) ඡේදයේ " (i), (ii), (iii) හෝ (iv) යන අයිතම", යන වචන සහ ඉලක්කම් වෙනුවට "(2) වන උපවගන්තියේ (ඉ) ඡේදයේ (i), (ii), (iii); (iv), (v) හෝ (vi ) වන අයිතම" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(3) එම වගන්තියේ (6) වන උපවගන්තියේ (iv) වන අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අනුඡේදය එකතු කිරීමෙන්:–

"(v) බදු ගෙවීමට යටත්වීම ආරම්භවීමට පෙරාතුව නිකුත් කරන ලද යම් බදු ඉන්වොයිස් පත්‍රයක්, මේ වගන්තියේ (7) වන උපවගන්තිය යටතේ අනුමත කරන ලද යම් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් වන්නේ නම් මිස.";

(4) (10) වන උපවගන්තියේ දෙවන අතුරු විධානයේ (ii) වන ඡේදය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන්:–

"(ii) කොමසාරිස්-ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වනු ලබන මාර්ගෝපදේශවල නිශ්චිතව සඳහන් කොන්දේසිවලට යටත්ව 2 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඉ) ඡේදයේ සඳහන් පරිදි කොමසාරිස්-ජනරාල්වරයා විසින් පරිපාලනය කරනු ලබන සරල කරන ලද එකතු කළ අගය මත බදු යෝජනා ක්‍රමයේ ලියාපදිංචි සැපයුම්කරුවන් සහ අපනයනකරුවන් වන්නාවූ යම් සැපයුම් කරුවකු විසින් අපනයනකරුවන් වෙත කරන ලද සැපයුම් වන්නාවූ මේ පනත යටතේ බදු විලම්භනය කර ඇති යම් සැපයුම්;"; සහ

(5) (10) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන්:–

"(11) 16 වන වගන්තියේ (5) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව 2012 ජනවාරි මස 1 වන දින සිට ආරම්භව 2012 දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන්වන වර්ෂයේ දී ස්වකීය සම්පූර්ණ සැපයුම් ප්‍රමාණය මාස තුනක කාලසීමාවක් සඳහා රුපියල් මිලියන තුනක් නොඉක්මවනු ලබන සහ අවුරුදු එකක කාලසීමාවක් සඳහා මිලියන දොළහක් නොඉක්මවනු ලබන යම් ලියාපදිංචි තැනැත්තකුගේ ලියාපදිංචිය අවලංගුවීම හේතුවෙන්, 2013 ජනවාරි මස 1 වන දිනට පසුව හිමිකම් කිව නොහැකි 2012 දෙසැම්බර් මස 31 වන දිනට පවතින මෙම වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ගණනය කරනු ලැබූ ඉඩ දිය හැකි යෙදවුම් බදුවල අන්තර්ග්‍රහණය නොකළ යම් ශේෂයක්, තත්කාර්ය සඳහා කොමසාරිස්-ජනරාල්වරයා වෙත ලිඛිතව කරනු ලබන ඉල්ලීමක් මත කොමසාරිස්-ජනරාල්වරයා විසින් පරිපාලනය කරනු ලබන බදුවලට එරෙහිව හිලව්කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, මෙම වගන්තිය යටතේ බදු හිලව්කිරීම, කොමසාරිස්- ජනරාල්වරයාගේ අනුමතය ඇතිව ලියාපදිංචිය අවලංගු කිරීම මත වූ බදු බැඳියාව අවසන් කිරීමෙන් පසුව සිදු කළ යුතු ය.".

12. 2012 අංක 7 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත මගින් අවසන්වරට සංශෝධිත, ප්‍රධාන ප්‍රඥප්තියේ 25අ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:–

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ (iv) වන "ඡේදයේ 2009 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භවන" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2009 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසු ආරම්භ වන, හෝ (2003 ජූලි මස 1 වන දින සිට බලපැවැත්වෙන පරිදි) (422 වන අධිකාරය වූ) මුදල් පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා මහ බැංකුව විසින්:" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

(2) එම වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:–

"(2) ශ්‍රී ලංකාවේ යම් මූල්‍ය සේවා සැපයීමේ ව්‍යාපාරය කරගෙන යන සෑම නිශ්චිත ආයතනයක්ම හෝ වෙනත් තැනැත්තෙක්ම පහත දැක්වෙන ආකාරයට ලියාපදිංචි විය යුතු බවට නියම කරනු ලැබේ:–

(අ) එම සපයනු ලබන මූල්‍ය සේවාවේ අගය, අවස්ථාවෝචිත පරිදි, මාස තුනක කාල සීමාවක් සඳහා රුපියල් ලක්ෂ පහක් ඉක්මවන අවස්ථාවක හෝ මාස දොළහක කාල සීමාවක් සඳහා රුපියල් ලක්ෂ දහඅටක් ඉක්මවන අවස්ථාවක, එම ලියාපදිංචිය 2013 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව වූ යම් කාල සීමාවක් සඳහා සිදු වූයේ නම්;

(ආ) එම සපයනු ලබන මූල්‍ය සේවාවේ අගය, අවස්ථාවෝචිත පරිදි, මාස තුනක කාලසීමාවක් සඳහා රුපියල් මිලියන තුනක් ඉක්මවන අවස්ථාවක හෝ මාස දොළහක කාලසීමාවක් සඳහා රුපියල් මිලියන දොළහක් ඉක්මවන අවස්ථාවක, එම ලියාපදිංචිය 2013 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව වූ යම් කාලසීමාවක් සඳහා.''.

(3) එම වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:–

"(3) (2) වන උපවගන්තිය යටතේ ලියාපදිංචි වීමට නියමිත සෑම නිශ්චිත ආයතනයක් විසින්ම හෝ වෙනත් තැනැත්තකු විසින්ම, ලියාපදිංචි වීම සඳහා (2) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති නියමයන් සපුරාලන දිනයේ සිට දින තිහකට වැඩි නොවන කාලයක් තුළ කොමසාරිස්-ජනරාල්වරයා වෙත නියමිත ආකෘතියක වූ අයදුම්පතක් ඉදිරිපත් කළ යුතු ය:

එසේ වුව ද, මේ පනත යටතේ ලියාපදිංචි වී ඇති, තව ද, මේ පරිච්ඡේදයේ අර්ථානුකූලව නිශ්චිත ආයතනයක් වන යම් ආයතනයක් සියලු කාර්ය සඳහා මේ පරිච්ඡේදය යටතේ ලියාපදිංචි ආයතනයක් ලෙස සැලකිය යුතු ය:

එසේම තවදුරටත්, මේ පරිච්ඡේදය යටතේ ලියාපදිංචිවීම සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කර නොමැති යම් තැනැත්තකු විසින් සිදු කරනු ලබන බදු අය කළ හැකි ක්‍රියාකාරකම්වල ස්වභාවය සැලකිල්ලට ගැනීමේ දී එම තැනැත්තා මේ පරිච්ඡේදය යටතේ ලියාපදිංචි විය යුතු බව, කොමසාරිස්-ජනරාල්වරයාගේ මතය වන්නේ නම්, කොමසාරිස්-ජනරාල්වරයා විසින්, එම තැනැත්තා ලියාපදිංචි කළ යුතු ය. අවස්ථානුගත කරුණු අනුව එම තැනැත්තා මෙම පරිච්ඡේදය යටතේ ලියාපදිංචි කිරීමට පෙරාතුව එම තැනැත්තාට කරුණු ඉදිරිපත් කිරීමේ අවස්ථාවක් ලබාදිය යුතු අතර, ඉන් පසු එම තැනැත්තා, කොමසාරිස්-ජනරාල්වරයා විසින් තීරණය කරනු ලබන දිනයක සිට බල පැවැත්වෙන පරිදි ලියාපදිංචි කරනු ලැබිය යුතු ය.".

(4) එහි (4) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන්:–

"(5) සෑම ලියාපදිංචි තැනැත්තකු විසින් ම–

(අ) එම තැනැත්තා විසින් පවත්වාගෙන යන බදු අය කළ හැකි ක්‍රියාකාරකම් සිදු කරන ස්ථානයේ නමෙහි සහ ලිපිනයේ යම් වෙනසක් පිළිබඳව;

(ආ) එම තැනැත්තා විසින් සිදු කරනු ලබන බදු අය කළ හැකි ක්‍රියාකාරකම්වල ස්වභාවයේ යම් වෙනසක් පිළිබඳව;

(ඇ) වාර වාර්තා සහ වෙනත් ලේඛන අත්සන් කිරීමට බලය පවරා ඇති තැනැත්තාගේ යම් වෙනස්වීමක් පිළිබඳව; සහ

(ඈ) බදු අය කළ හැකි ක්‍රියාකාරකම්වල අයිතියේ වෙනසක් පිළිබඳව,

එම වෙනස සිදුවීමෙන් පසු දින දාහතරක කාලයක් ගතවීමට පෙර කොමසාරිස්-ජනරාල්වරයා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.''.

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 25ආ වගන්තිය එහි (1) වන උපවගන්තියේ (ආ) ඡේදය ඉවත්කොට, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:–

"(ආ) 2011 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් බදු අය කළ හැකි කාලසීමාවක් සඳහා මාස හයක් විය යුතු ය:

එසේ වුව ද, යම් නිශ්චිත ආයතනයක හෝ වෙනත් තැනැත්තකුගේ ගිණුම් මාර්තු මස 31 වන දිනයෙන් අවසන් වන මාස දොළහක කාලයක් සඳහා සකස් කර ඇති අවස්ථාවක, මාස හයක කාලසීමාව අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ විය හැකි අතර, මාස දොළහක කාලසීමාව සැප්තැම්බර් මස 1 වන දිනයෙන් ආරම්භ විය හැකි ය. එවැනි අවස්ථාවක දී, කොමසාරිස්-ජනරාල්වරයාගේ අනුමතය ඇතිව එම වෙනස සිදු වූ අවස්ථාවේ දී ජනවාරි මස 1 වන දින සිට මාර්තු මස 31 වන දිනය දක්වා වූ කාලය සඳහා වෙනම වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය.".

14. 2011 අංක 9 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත මගින් අවසන්වරට සංශෝධිත, ප්‍රධාන ප්‍රඥප්තියේ 25ඇ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:–

(1) එම වගන්තියේ (1) වන උපවගන්තිය-

(අ) එම උපවගන්තියේ අතුරු විධානයේ "තක්සේරු කරනු ලැබූ ප්‍රමාණය අර්ධ වාර්ෂික පදනමක් මත තථ්‍ය මුදල් ප්‍රමාණ පිළිබිඹු වන පරිදි සකස් කර ගත යුතු ය." යන වචන වෙනුවට "තක්සේරු කරනු ලැබූ ප්‍රමාණය විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශය සමග අර්ධ වාර්ෂික පදනමක් මත තථ්‍ය මුදල් ප්‍රමාණ පිළිබිඹු වන පරිදි සකස් කරගත යුතු අතර, එම සකස් කිරීම අදාළ ගිණුම් කාලසීමාව අවසන් වීමේ දින සිට මාස හයක් ඇතුළත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) එහි (අ) ඡේදය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:–

(අ) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ XIV වන පරිච්ඡේදය යටතේ "නිශ්චිත සේවානියුක්තයන්" සම්බන්ධයෙන් වන විට, ඒ සේවානියුක්තයන්ට ගෙවිය යුතු වූ ද 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 119 වන වගන්තියේ (අ) ඡේදය යටතේ පවත්වාගෙන යන වැටුප් පත්‍රිකාවේ පිළිබිඹු වන්නා වූ ද දළ පඩිනඩි සහ; ;

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියේ "2000 අංක 38 දරන දේශීය ආදායම් පනතේ 110 වන වගන්තිය යටතේ" යන වචන හා ඉලක්කම් වෙනුවට "2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 119 වන වගන්තිය යටතේ" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(3) එම වගන්තියේ (5) වන උපවගන්තියේ -

(අ) (අ) ඡේදයේ "පළමුවන උපලේඛනයේ (xi) වන අයිතමය යටතේ" යන වචන සහ ඉලක්කම් වෙනුවට "පළමුවන උපලේඛනයේ II වන කොටසේ (ආ) ඡේදයේ (x) වන අයිතමය යටතේ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ආ) එහි (ඇ) ඡේදයේ "අන්තර් සමාගම් ගනුදෙනු වලින් පැන නගින හෝ උපචිත වන පොලිය මත ලාභයකට හෝ ආදායමකට" යන වචන වෙනුවට "අන්තර් සමාගම් ගනුදෙනුවලින් පැනනගින හෝ උපචිත වන (ව්‍යාපාරයකින් ලැබෙන ලාභයක් නොවන) ලාභයකට හෝ ආදායමකට" යන වචන ආදේශ කිරීමෙන්;

(ඇ) එහි (ඊ) ඡේදයේ "ආදායමක් හැර යම් තැනැත්තකුට උපදින ලාභාංශ ආදායමට" යන වචන වෙනුවට "ආදායමක් හැර, යම් තැනැත්තකුට ලැබෙන (ව්‍යාපාරයකින් ලැබෙන ලාභයක් නොවන) ලාභාංශ ආදායමට" යන වචන ආදේශ කිරීමෙන්;

(ඇ) එහි (ඌ) ඡේදය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:–

"(ඌ) ව්‍යවහාර මුදල් හුවමාරු කිරීමේ ව්‍යාපාරයෙහි මූලික වශයෙන් යෙදී සිටින තැනැත්තකුට හෝ මේ පරිච්ඡේදයේ අර්ථානුකූලව යම් "නිශ්චිත ආයතනයකට" හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි නොවූ එහෙත් මූල්‍ය සමාගමක් විසින් සපයනු ලබන සේවාවලට සමාන සේවා සපයන යම් තැනැත්තකුට උපදින හෝ උපචිත වන ලාභ හෝ ආදායම් හැර, ව්‍යවහාර මුදල් හුවමාරු කිරීමෙන් ලැබෙන (ව්‍යාපාරයකින් ලැබෙන ලාභයක් නොවන) ලාභවලට හෝ ආදායමට,

ඇතුළත් මේ වගන්තියේ (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති ආකාරයට ගණනය කරන ලද ආදායම ශූන්‍ය ලෙස සලකනු ලැබිය යුතු ය.";

(4) (8) වන උපවගන්තිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:–

"(8) බද්ද ගණනය කිරීම, වාර වාර්තා ඉදිරිපත් කිරීම සහ එම වාර වාර්තාවලට අදාළ තොරතුරු ඉදිරිපත් කිරීම, බදු ගෙවීම,තක්සේරු කිරීම් නිකුත් කිරීම, මේ පරිච්ඡේදයේ කාර්ය සඳහා නියමිත වාර වාර්තා හෝ තොරතුරු ඉදිරිපත් නොකිරීම සඳහා වූ දණ්ඩන පැනවීම යන කාර්ය සඳහා සෑම නිශ්චිත ආයතනයක් හෝ වෙනත් යම් තැනැත්තකු විසින් එම බදු ගණනය කිරීමේ ඒකරූපීය යෙදුම හා මේ පරිච්ඡේදයේ මාර්ගෝපදේශ විධිවිධානයේ නිශ්චිතව දක්වා ඇති වෙනත් යම් කාරණයක් සැලකිල්ලට ගෙන-

(අ) කොමසාරිස්-ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වා ඇති මාර්ගෝපදේශ; සහ

(ආ) ගැසට් පත්‍රයේ පළකර ඇති නියමයේ නිශ්චිතව දක්වා ඇති මාර්ගෝපදේශ,

අනුගමනය කළ යුතු ය;";

15. 2006 අංක 8 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත මගින් අවසන් වරට සංශෝධිත, ප්‍රධාන ප්‍රඥප්තියේ 25ඈ වගන්තියේ "ලියාපදිංචි යම් ආයතනයක්" යන වචන වෙනුවට "යම් ලියාපදිංචි නිශ්චිත ආයතනයක් හෝ වෙනත් තැනැත්තෙක්" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

16. 2011 අංක 9 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත මගින් අවසන්වරට සංශෝධිත, ප්‍රධාන ප්‍රඥප්තියේ (25ඌ) වගන්තිය එහි (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ "2011 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වන" යන වචන හා ඉලක්කම් වෙනුවට "2011 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වී 2012 දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන් වන" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් මෙයින් තව දුරටත් සංශෝධනය කරනු ලැබේ:–

17. 2011 අංක 9 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත මගින් අවසන් වරට සංශෝධිත, ප්‍රධාන ප්‍රඥප්තියේ 25එ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:–

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ -

(අ) "(2) වන උපවගන්තියේ සඳහන් කරන ලද තැනැත්තකුට හෝ හවුල් ව්‍යාපාරයකට" යන වචන වෙනුවට "(2) වන උපවග න්තියේ දක්වා ඇති තැනැත්තකුට හෝ හවුල් ව්‍යාපාරයකට 2012 දෙසැම්බර් මස 31 වන දිනට පෙරාතුව" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ආ) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ "කාර්තුව ආරම්භ වන දිනයෙන් වසර දොළහක කාලයක් සඳහා" යන වචන වෙනුවට "කාර්තුව ආරම්භ වන දිනයේ සිට 2013 ජනවාරි මස 1 වන දිනයෙන් අවසන් වූ යම් කාර්තුවක් සඳහා" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ඇ) එම උපවගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්:–

"(ඇ) මේ පරිච්ඡේදය යටතේ ලබා ගත් යම් ලියාපදිංචියක් 2013 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වන කාලසීමාවේ සිට බලපැවැත්වෙන පරිදි අවලංගු ලෙස සලකනු ලැබිය යුතු ය:

එසේ වුව ද, මේ පරිච්ඡේදය යටතේ ලියාපදිංචි වූ ද ස්වකීය පිරිවැටුම වර්ෂයකට රුපියල් මිලියන දොළහකට වැඩි වූ ද, 10 වන වගන්තිය යටතේ ලියාපදිංචිය සඳහා නිර්නායක සපුරා ඇත්තා වූ ද, යම් තැනැත්තෙක් හෝ හවුල් ව්‍යාපාරයක් විසින් ඒ අනුව ලියාපදිංචිය ලබා ගත යුතු ය.".

18. 2006 අංක 8 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත මගින් අවසන්වරට සංශෝධිත, ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධන කරනු ලැබේ:–

(1) එහි (1) වන උපවගන්තියේ "(1) යම් බදු අයකළ හැකි කාලසීමාවක්" යන වචන වෙනුවට "(1) යම් බදු අය කළ හැකි කාලසීමාවක්" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එම වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන්:–

"(1අ) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, යම් ලියාපදිංචි තැනැත්තකු සම්බන්ධයෙන් වන විට, එම තැනැත්තාගේ බදු අය කළ හැකි සැපයුම්, එම තැනැත්තා විසින්, ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත භාණ්ඩ සැපයුම හැර, වෙනත් යම් භාණ්ඩ සැපයුමකින් සංයුක්ත වන අවස්ථාවක දී 2013 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව වන යම් බදු අය කළ හැකි කාලසීමාවක් සම්බන්ධයෙන් වන බද්ද–

(i) යම් මාසයක 1 වන දිනයේ සිට 15 වන දිනය දක්වා වූ කාලය සඳහා එම මාසය අවසානයේ දී හෝ ඊට පෙර; සහ

(ii) එම මාසයේ 16 වන දින සිට එම මාසයේ අවසානය දක්වා වූ කාලසීමාව සඳහා, ඊළඟ මාසයේ 15 වන දින හෝ එදිනට පෙර,

වාර්තාව ඉදිරිපත් කිරීමත් සමඟ අවසාන සකස් කිරීම් ඇත්නම් ඒවා සිදු කිරීමට යටත්ව ගෙවනු ලැබිය යුතු ය.

ඉහත දක්වා ඇති පරිදි ගෙවනු නොලබන යම් බදු මුදලක් හිඟ තබා ඇති ලෙස සලකනු ලබන අතර, බදු ගෙවිය යුත්තේ යම් තැනැත්තකු විසින් ද එම තැනැත්තා විසින් හෝ යම් බද්දක් එක් අයකුට වඩා වැඩි පිරිසක් විසින් ගෙවිය යුතු අවස්ථාවක, එම එක් එක් තැනැත්තා මේ පනතේ කාර්ය සඳහා ගෙවීම පැහැර හැර ඇති අයකු ලෙස සලකනු ලැබිය යුතු ය.".

19. ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය, එහි (4) වන උපවගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස එකතු කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ:–

"(5) යම් තැනැත්තකු විසින් 2011 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව අවසන් වන යම් මාස 12 ක කාලසීමාවක් සඳහා, කරගෙන යනු ලබන සියලු වෙළෙඳාම් හෝ ව්‍යාපාරවල පිරිවැටුම රුපියල් මිලියන තුන්සියය නොඉක්මවන්නා වූ සහ කොමසාරිස්-ජනරාල්වරයා විසින් පරිපාලනය කරනු ලබන බදුවලට අදාළ යම් නීතියක් සමඟ අනුකූලව කටයුතු නොකරන්නා වූ යම් තැනැත්තකු විසින්, තමා මේ පනතේ 10 වන වගන්තිය යටතේ ලියාපදිංචි කරවන ලෙස ඉල්ලා සිටී නම්, මේ වගන්තියේ (1) වන උපවගන්තියේ සහ 33 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන්ව ඇත ද,-

(අ) එම තැනැත්තා විසින් 2014 මාර්තු මස 31 වන දිනට පෙරාතුව ඔහුගේ එම වෙළෙඳාමේ හෝ ව්‍යාපාරයේ ඉපැයුම් කවර හෝ ව්‍යාපාරයක ආයෝජනය කිරීමට; සහ

(ආ) යම් පසුකාලීන කාලසීමාවක් සඳහා මේ පනතේ නියමයන්ට අනුකූලව ක්‍රියාකිරීමට,

බාරගනු ලබන්නේ නම්, ඉහත දක්වා ඇති කාලසීමාව සඳහා ඒ තැනැත්තාගේ පිරිවැටුම තක්සේරු කරනු නොලැබිය යුතු ය.".

20. ප්‍රධාන ප්‍රඥප්තියේ 64 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 64අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:–

"64අ. යම් තැනැත්තකු විසින් ගෙවිය යුතු බදු මුදල අඩු කරන හෝ අඩු කිරීමේ බලපෑමක් ඇති යම් ගනුදෙනුවක් කෘතිම බව හෝ ප්‍රබන්ධිත බව හෝ යම් බැහැර කිරීමක් ඇත්ත වශයෙන් බලාත්මක වී නොමැති බව තක්සේරුකරුගේ මතය වන අවස්ථාවක, එම තක්සේරුකරු විසින්, එම ගනුදෙනුව හෝ බැහැර කිරීම නොසලකා හැරිය හැකි අතර, ගනුදෙනුවට හෝ බැහැර කිරීමට අදාළ පාර්ශවයන් ඒ අනුව තක්සේරු කරනු ලැබිය යුතු ය.

මේ වගන්තියේ "බැහැර කිරීම" යන්නට යම් භාරයක්, ප්‍රදානයක්, ප්‍රතිඥා භාරයක් හෝ වැඩපිළිවෙළක් ඇතුළත් වේ.".

21. 2011 අංක 9 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 67 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:–

(1) එහි (අ) ඡේදයේ "(අ) 10 වන වගන්තිය යටතේ" යන වචන සහ ඉලක්කම් වෙනුවට "(අ) 10 වන වගන්තිය හෝ 25අ වගන්තිය යටතේ" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) එහි (අඅ) ඡේදය ඉවත් කිරීමෙන්;

(3) එහි (ආ) ඡේදයේ "(ආ) 19 වන වගන්තිය යටතේ" යන වචන හා ඉලක්කම් වෙනුවට "(ආ) 19 වන වගන්තිය හෝ 25අ වගන්තියේ (5) වන උපවගන්තිය යටතේ" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(4) එහි (ඊ) ඡේදයේ "21 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ වූ දැන්වීමකට" යන වචන හා ඉලක්කම් වෙනුවට "21 වන වගන්තිය හෝ 25ආ වගන්තිය යටතේ වූ දැන්වීමකට" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(5) (උ) ඡේදයේ "21 වන වගන්තිය හෝ 34 වන වගන්තිය යටතේ" යන වචන හා ඉලක්කම් වෙනුවට "21 වන වගන්තිය, 25අ වගන්තිය හෝ 34 වන වගන්තිය යටතේ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(6) එම වගන්තියේ (ඕ) ඡේදයේ "බදු ඉන්වොයිස් පත්‍රයක් නිකුත් කරන්නා වූ," යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:–

"බදු ඉන්වොයිස් පත්‍රයක් නිකුත් කරන්නා වූ; හෝ

(ක) ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය මගින් නිශ්චිතව දක්වා ඇති නියමයන්ට අනුකූලව ක්‍රියාකිරීම හෝ අවස්ථාවෝචිත පරිදි, 2 වන හෝ 25ඇ වන වගන්ති යටතේ කොමසාරිස්-ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශවලට අනුකූලව ක්‍රියාකිරීම පැහැර හරින; හෝ

(ග) 25ඇ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ වාර්ෂික සකස් කිරීමක් ඉදිරිපත් කිරීම පැහැර හරින.".

22. ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනයේ II වන කොටස පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:–

"(1) එම කොටසේ (අ) ඡේදයේ-

(i) (viii) වන අයිතමය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන්:–

"(viii) කෘෂිකාර්මික ට්‍රැක්ටර් හෝ අර්ධ ට්‍රේලර් සඳහා මාර්ග ට්‍රැක්ටර්,";

(ii) (xxii) වන අයිතමයේ -

(අ) (i) වන අනු අයිතමයේ ("වානේ, වීදුරු, රබර් හෝ ප්ලාස්ටික්") යන වචන වෙනුවට ("වානේ, වීදුරු, ඛනිජ ද්‍රව්‍ය, රබර් හෝ ප්ලාස්ටික්") යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) එහි (V) වන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන්:–

"(vi) බවුසර්, බුල්ඩෝසර්, ග්‍රේඩර්ස්, ලෙවලර්ස්, එස්කැවේටර්ස් යන්ත්‍ර, ගිනි නිවීමේ රථ;

(vii) බලශක්ති පිරිමැසුම් විදුලි බුබුලු නිෂ්පාදන කිරීම සඳහා අමුද්‍රව්‍ය;'';

(2) එම කොටසේ (ආ) ඡේදයේ-

(i) (අ) අනුඡේදයේ (ආ) ඡේදයේ (ii) වන අයිතමයේ "යම් මෝටර් කෝච් රථයක් සඳහා." යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:–

"යම් මෝටර් කෝච් රථයක් සඳහා;

(iii) 2013 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව ගෙවීමට නියමිතව යෙදී ඇති යම් කුලියක් සම්බන්ධයෙන් නිශ්චිතව සඳහන් කරන ලද සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක යටතේ රේගු කාර්ය සඳහා නිදහස් කරනු ලැබූ බවුසර්, බුල්ඩෝසර්, ග්‍රේඩර්ස්; ලෙවලර්ස්, එස්කැවේටර්ස් යන්ත්‍ර, ගිනි නිවීමේ රථ, අර්ධ ට්‍රේලර්ස් සඳහා වූ මාර්ග ට්‍රැක්ටර් හෝ ප්‍රයිම් මූවර්.

(ii) (xx) වන අයිතමය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:–

"(xx) දේශීය වශයෙන් නිෂ්පාදිත පොල්තෙල් හෝ කොකෝවා, කොහු බත්, කොහු කෙඳි, බීජ තවාන් මලු, කොහුබත් වගා මළු, කොහු කඹ හෝ පොල් ලෙලි."

(iii) (xLiii) වන අයිතමය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:–

"(xLiii) නූල්, රෙදි හෝ ඇඟළුම් අපනයනය කරන්නන්ට හැර යම් නූල්, රෙදි හෝ ඇඟළුම්වල තත්ත්වය, ස්වභාවය හෝ වටිනාකම වැඩි දියුණු කිරීමේ ප්‍රතිඵලය ඇති කරවන සේවාවන් වෙනත් තැනැත්තන්ට සලසනු ලබන තාක් දුරට;";

(iv) (xLiv) වන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන්:–

"(xLV) ඒකක භාර කළමනාකරණ සමාගමක් විසින් එහි සේවා යම් ඒකක භාරයකට සලසන තාක් දුරට එම සේවාවන් ;

(xLvi) ක්‍රීඩා විෂයය භාර අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබිය හැකි යම් ක්‍රීඩා ඉසව්වකට හෝ ක්‍රීඩාවකට අදාළ ක්‍රියාකාරකමකට සහභාගිවීම සඳහා ශ්‍රී ලංකාවට පැමිණෙන ක්‍රීඩකයකුට, යම් ක්‍රීඩා සංවිධායකයකුට හෝ අනුග්‍රාහකයකුට ලබා දෙන හෝටල් නවාතැන් පහසුකම් සැපයීමේ සේවා වන සේවාවන්.".

(3) එම කොටසේ (ඇ) ඡේදයේ:–

(i) (xxvii) වන අයිතමය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:–

"(xxvii) ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරනු නොලබන තාක්දුරට, ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරනු ලබන ඖෂධ හෝ ආයුර්වේද බෙහෙත් ද්‍රව්‍ය ඇසිරීම සඳහා පමණක් පාවිච්චි කරනු ලබන, එම ඖෂධ හෝ ආයුර්වේද බෙහෙත් ද්‍රව්‍ය නිෂ්පාදකයා විසින් ආනයනය කරනු ලබන ඇසුරුම් ද්‍රව්‍ය, තව ද, තත්කාර්ය සඳහා අවස්ථාවෝචිත පරිදි, සෞඛ්‍ය විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ආයුර්වේද කොමසාරිස්-ජනරාල්වරයාගේ අනුමතය ලැබිය යුතු ය.",

(ii) (xxxvi), වන අයිතමයේ "ආනයනය කිරීමේ දී කිලෝ ග්‍රෑම් එකකට රුපියල් හැත්තෑ පහක සෙස් බද්දක් අය කිරීමට යටත්ව" යන වචන වෙනුවට "ආනයනය කිරීමේ දී පළමුවන උපලේඛනයේ (ii) වන කොටසේ (ආ) ඡේදයේ (ii) වන අනු අයිතමයේ (xxxvii) වන අයිතමයේ නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණය අනුව සෙස් බද්දක් අය කිරීමට යටත්ව" යන වචන ආදේශ කිරීමෙන්.

(iii) එම ඡේදයේ (xxxvi) වන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අයිතමය එකතු කිරීමෙන්:–

"(xxxvii) අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් අනුමත කරනු ලැබූ මහජනතාව වෙත කැලි කසල බැහැර කිරීමේ සේවා සැපයීමේ කාර්ය සඳහා යම් පළාත් පාලන ආයතනයක් විසින් සිදු කරනු ලබන කැලි කසල බැහැර කිරීමේ කටයුතු සඳහා භාවිතා කරනු ලබන ගලි බවුසර්, මාර්ග ට්‍රැක්ටර් සඳහා වූ අර්ධ ට්‍රේලර් සහ යන්ත්‍රෝපකරණ හෝ උපකරණ."

(4) එම කොටසේ (ඌ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේද එකතු කිරීමෙන්:–

"(එ) (422 වන අධිකාරය වූ) මුදල් නීති පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා මහ බැංකුව විසින් භාණ්ඩ හෝ සේවා සැපයීම;

(ඒ) පාර්ලිමේන්තුව විසින් ඒකාබද්ධ අරමුදලින් සම්මත කරනු ලබන මුදල්වලින් හෝ ආණ්ඩුව හරහා සකස් කරන ලද යම් ණය මුදලකින් ශ්‍රී ලංකාවේ ආණ්ඩුව වෙනුවෙන් යම් රාජ්‍ය සංස්ථාවක් විසින් නොමිලයේ සේවය සපයන තාක් දුරට එසේ සපයනු ලබන එම සේවාවන්;

(ඔ) මත්පැන් හෝ දුම්කොළ නිෂ්පාදන හැර වෙනත් යම් ද්‍රව්‍යයක් නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයක් කරගෙන යනු ලබන ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන යම් පුද්ගලයකු විසින් හෝ යම් විදේශ රැකියාවක නියුක්තව සිට මෙරටට පැමිණ, එම ව්‍යාපාරය ආරම්භ කළ තක්සේරු වර්ෂයේ සිට අවුරුදු පහක කාල සීමාවක් තුළ සේවාවන් සපයන යම් තැනැත්තකු–

(i) 2013 ජනවාරි මස 1 වන දින හෝ ඉන් පසුව විදේශ රැකියාවක නියුක්තව සිට ආපසු පැමිණ ඇත්නම්; සහ

(ii) එම ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා ස්වකීය විදේශ රැකියාවෙන් ලද ඉපැයීම් ආයෝජනය කරන්නේ නම්;

එම පුද්ගලයා විසින් සපයනු ලබන භාණ්ඩ හෝ සේවා.".

23. 2013 ජනවාරි මස 1 වන දිනෙන් ආරම්භව, මෙම පනත සම්බන්ධයෙන් කථානායකවරයාගේ සහතිකය ඔහුගේ අත්සන ඇතිව සටහන් කරනු ලැබූ දිනයෙන් අවසන් වන යම් කාලසීමාවක් ඇතුළත, මේ පනතේ විධිවිධාන සලසා ඇති පරිදි එකතු කළ අගය මත

බදු එකතු කරන යම් තැනැත්තකු, නිසි බලය ඇතිව ක්‍රියාකර ඇති බවට සලකනු ලැබිය යුතු අතර, එවැනි බදු එකතු කිරීමක් සියලු කාර්ය සඳහා වලංගු ලෙස සිදු කර ඇති බවට සලකනු ලැබිය යුතු යː

එසේ වුව ද, ඉහත කී විධිවිධාන, යම් අධිකරණයක් විසින් ඉහත කී කාලසීමාව තුළ දී, ඉහත කී පනතෙන් විධිවිධාන සලසා ඇති පරිදි එකතු කරන ලද යම් බද්දක් සම්බන්ධයෙන් දෙන ලද යම් තීරණයක් හෝ නියමයක් කෙරෙහි හෝ යම් අධිකරණයක් ඉදිරියේ අවසන් නොවී පවතින යම් නඩු කටයුත්තක් සම්බන්ධයෙන් බල නොපෑ යුතු ය.

24. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

## 2013 අංක 18 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2013 අප්‍රේල් මස 24 වන දින]

**2006 අංක 10 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:–

1. (1) මේ පනත 2013 අංක 18 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) මේ පනතේ විධිවිධාන 2013 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක විය යුතු යː

එසේ වුව ද –

(අ) මේ පනතේ 7 (2) වගන්තිය මගින් (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 16ඇ වගන්තියට කරන ලද සංශෝධන;

(ආ) මේ පනතේ 8 වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 16ඈ වගන්තියට කරන ලද සංශෝධන; සහ

(ඇ) මේ පනතේ 10 (4) වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 17අ වගන්තියට කරන ලද සංශෝධන,

2012 අප්‍රේල් මස 1 වන දින සිට සියලු කාර්යයන් සඳහා බලාත්මක විය යුතු බවට සලකනු ලැබිය යුතු ය.

2. 2012 අංක 8 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:–

(1) ඒ වගන්තියේ (ආ) ඡේදයේ–

(අ) (lxii) වන අනුඡේදයේ "ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ; සහ" යන වචන වෙනුවට "ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ;" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) (lxiii) වන අනුඡේදයේ "ළමා ආරක්ෂක අධිකාරිය පනත මගින් පිහිටුවන ලද අරමුදලේ; " යන වචන වෙනුවට "ළමා ආරක්ෂක අධිකාරිය පනත මගින් පිහිටුවන ලද අරමුදලේ; " යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ඇ) (lxiii) වන අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අනුඡේද එකතු කිරීමෙන්:–

"(lxiv) ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 26 දරන ශ්‍රී ලංකාවේ සාමාන්‍ය වෛද්‍යවරුන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකාවේ සාමාන්‍ය වෛද්‍යවරුන්ගේ ආයතනයේ;

(lxv) 1996 අංක 17 දරන ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ;

(lxvi) පාර්ලිමේන්තුව විසින් ඒකාබද්ධ අරමුදලින් සම්මත කරනු ලබන මුදල්වලින් හෝ ආණ්ඩුව විසින් සලස්වා දෙනු ලබන යම් ණය මුදලකින් යම් රාජ්‍ය සංස්ථාවක් විසින් ආණ්ඩුව වෙනුවෙන් නොමිලයේ සේවා සපයන තාක් දුරට ඒ රාජ්‍ය සංස්ථාවේ;

(lxvii) ජාතික සංවර්ධන භාරකාර අරමුදල සමග ඒකාබද්ධ කර ඇත්තා වූ, 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කරන ලද සීමාසහිත ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුවේ;

(lxviii) 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කරන ලද සීමාසහිත ලංකාපුත්‍ර සංවර්ධන බැංකුවේ; සහ

(lxix) 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කරනු ලැබූ පෞද්ගලික පාසල් හැර, අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලියාපදිංචි වී ඇත්තා වූ ද, අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සකස් කරනු ලබන රජයේ විෂයමාලා සහ ඒ අමාත්‍යාංශය විසින් නිකුත් කරනු ලබන චක්‍රලේඛ අනුගමනය කිරීමට බැඳී ඇත්තා වූ ද යම් රජයේ ආධාර ලබන පෞද්ගලික පාසලක," ;

(2) ඒ වගන්තියේ (ඔ) ඡේදයේ "ලාභ සහ ආදායම." යන වචන වෙනුවට "ලාභ සහ ආදායම;" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(3) ඒ වගන්තියේ (ඔ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්:–

"(ඕ) 2013 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා (422 වන අධිකාරය වූ) මුදල් නීති පනත යටතේ සාදන ලද නියෝග මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයේ ලාභ සහ ආදායම,".

3. 2011 අංක 22 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:–

(1) ඒ උපවගන්තියේ (ඇඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:–

"(ඇඇඇ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුමකට එළඹ ඇත්තා වූ ද, අවස්ථාවෝචිත පරිදි 17අ හෝ 16ඈ වගන්ති යටතේ වූ බදු නිදහස් කාලසීමාව තුළ 2013 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව සෘජු විදේශ ආයෝජන වශයෙන් ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන පනහකට වැඩි මුදලක් ආයෝජන කර ඇත්තා වූ ද, යම් ව්‍යවසායක් විසින් ඒ ව්‍යවසායේ කාර්ය සඳහා ශ්‍රී ලංකාවට ගෙන්වා සේවයෙහි නියුක්ත කරනු ලැබුවා වූ විශේෂඥයකු වන සහ ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන යම් පුද්ගලයකු විසින්, ශ්‍රී ලංකාවේ ඒ ව්‍යවසායේ කටයුතු ඉටු කිරීමේ දී ඔහු විසින් සපයනු ලබන සේවාව අත්‍යවශ්‍ය වන බවට සහ එම සේවාව ශ්‍රී ලංකාවෙන් ලබා ගත නොහැකි බවට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් තහවුරු කරන්නේ නම්, ඒ පුද්ගලයාට ශ්‍රී ලංකාවේ දී උද්ගත වන පඩිනඩි:

එසේ වුව ද, එක් ව්‍යවසායක සිටිය හැකි මෙම විධිවිධානය අදාළ වන විශේෂඥයන් සංඛ්‍යාව පස් දෙනෙකු නො ඉක්මවිය යුතු ය.

මේ ඡේදයේ කාර්ය සඳහා "විශේෂඥයක" යන්නෙන්, ශ්‍රී ලංකාවේ පුරවැසියන් අතර අවශ්‍ය විශේෂඥ දැනුම ඇති විශේෂඥයන් නොමැති ක්ෂේත්‍රයක් ලෙස ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් කරනු ලබන නිර්දේශය මත, කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චය කරනු ලබන ක්ෂේත්‍රයක විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයකු අදහස් වේ;";

(2) ඒ උපවගන්තියේ (ත) ඡේදයේ "ලාභ නොවන සේවා නියුක්තියෙන් ලැබෙන ලාභ" යන වචන වෙනුවට "ලාභ නොවන සේවා නියුක්තියෙන් 2013 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ලැබෙන ලාභ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(3) ඒ උපවගන්තියේ (ප) ඡේදයේ "යම් පුද්ගලයකුට ශ්‍රී ලංකාවෙහි උද්ගත වන" යන වචන වෙනුවට "යම් පුද්ගලයකුට 2013 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ශ්‍රී ලංකාවෙහි උද්ගත වන" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

4. 2012 අංක 8 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:–

(1) ඒ වගන්තියේ (අ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:–

"(අඅ) ශ්‍රී ලංකාවේ යම් තැනැත්තකු විසින් නිකුත් කරන ලද යම් සුරැකුම්පතක හෝ බැඳුම්කරයක, 2012 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ශ්‍රී ලංකාවට රැගෙන එන ලද විදේශ විනිමය යොදා කරන ලද ආයෝජනයකින් ශ්‍රී ලංකාවෙන් පිටත යම් තැනැත්තකුට හෝ හවුල් ව්‍යාපාරයකට හෝ පුද්ගල මණ්ඩලයකට උපචිත වන පොලිය;"; සහ

(2) ඒ වගන්තියේ (ග) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:–

"(ච) (i) ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් බලපත්‍ර දී ඇති යම් කොටස් හුවමාරුවක නිල ලැයිස්තුගත යම් සාංගමික ණය සුරැකුම්පතක; සහ

(ii) මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමතය ඇතිව යම් මහ නගර සභාවක් විසින් නිකුත් කරන ලද නාගරික බැඳුම්කරයක,

2013 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව කරන ලද යම් ආයෝජනයකින් යම් තැනැත්තකුට උපචිත වන හෝ උද්ගත වන පොලිය හෝ වට්ටම,".

5. 2012 අංක 8 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:–

(1) ඒ වගන්තියේ (ආආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:–

"(ආආආ) ශ්‍රී ලංකාව හැර වෙනත් යම් රටකින් භාණ්ඩ ප්‍රසම්පාදනය කර හෝ ශ්‍රී ලංකාව හැර වෙනත් යම් රටක භාණ්ඩ නිෂ්පාදනය කර ශ්‍රී ලංකාව හැර වෙනත් යම් රටකට භාණ්ඩ අපනයනය කිරීමේ යම් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් 2012 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් තැනැත්තකු විසින් විදේශ ව්‍යවහාර මුදලින් උපයන ලද ලාභ සහ ආදායම;";

(2) ඒ වගන්තියේ (ඇඇඇඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:–

"(ඇඇඇඇඇ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන යම් වාසික පුද්ගලයකු විසින් ශ්‍රී ලංකාවෙන් පිටත දී විදේශ ව්‍යවහාර මුදලින් උපයන ලද යම් ලාභ සහ ආදායම (ශ්‍රී ලංකාවෙන් පිටත දී දරන ලද සාධාරණ වියදම් වශයෙන් කොමසාරිස් ජනරාල්වරයා විසින් සලකනු ලබන යම් මුදලක් අඩු කිරීමෙන් පසුව) බැංකුවක් මගින් ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කරනු ලබයි නම් ඒ ලාභ සහ ආදායම;";

(3) ඒ වගන්තියේ (බබබබබ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේද ඇතුළත් කිරීමෙන්:–

"(බබබබබබ) (i) ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් බලපත්‍ර දී ඇති යම් කොටස් හුවමාරුවක නිල ලැයිස්තුගත යම් සාංගමික ණය සුරැකුම්පතක;

(ii) මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමතය ඇතිව යම් මහ නගර සභාවක් විසින් නිකුත් කරන ලද නාගරික බැඳුම්කරයක,

2013 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව කරන ලද යම් ආයෝජනයකින් උපයන ලද ලාභ සහ ආදායම;

(බබබබබබබ) 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථා පනත මගින් පිහිටුවන ලද ඩීඑෆ්සීසී බැංකුව විසින් සහ 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කරන ලද ජාතික සංවර්ධන බැංකුව පීඑල්සී

විසින් ශ්‍රී ලංකාවෙන් පිටත දී උපයන ලද අරමුදල්වලින් සුළු හා මධ්‍යම පරිමාණයේ ව්‍යවසායයන්ට, වැවිලි කර්මාන්තයට, ඉදිකිරීම් කර්මාන්තයට හෝ වෙනත් නිෂ්පාදන කර්මාන්තවලට ණයට දෙන ලද මුදල්වලින් උපයන ලද පොලිය;";

(4) ඒ වගන්තියේ (මමමමමම) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:–

"(මමමමමමම) ශ්‍රී ලංකාවෙන් පිටත දී උද්ගත වූ ඍජු විදේශීය ආයෝජනයකින් ශ්‍රී ලංකාව තුළ කරන ලද ආයෝජනය ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන පනහක් ඉක්මවන අවස්ථාවක සහ අදාළ සේවාව ශ්‍රී ලංකාවේ දී කටයුතු කරගෙන යාම සඳහා අත්‍යවශ්‍ය බවට සහ ශ්‍රී ලංකාව තුළ ලබා ගත නොහැකි බවට ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සලකනු ලබන්නේ නම්, අවස්ථාවෝචිත පරිදි 17 අ වගන්තිය යටතේ හෝ 16ඈ වගන්තිය යටතේ වන බදු නිදහස් කාලසීමාව තුළ, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙත ලියාපදිංචි වී ඇති සමාගමකින් යම් විදේශීය සමාගමකට ලැබෙන යම් රාජ්‍ය භාගයක්, නියෝජිත ගාස්තුවක් හෝ යම් සැලැස්මක් සඳහා වන ගෙවීමක්;"; සහ

(5) ඒ වගන්තියේ (යයයයයය) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:–

"(යයයයයයය) ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන සහ විදේශීය රටක සේවා නියුක්තව සිටි පුද්ගලයකු 2013 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව මෙරටට පැමිණ ඒ විදේශීය රටෙහි සේවා නියුක්තියෙන් ඔහු උපයන ලද මුදල් මත්පැන් හෝ දුම්කොළ නිෂ්පාදන හැර, වෙනත් යම් භාණ්ඩයක් නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයක් හෝ යම් සේවාවක් සැපයීමේ ව්‍යාපාරයක් ආරම්භ කිරීම සඳහා ආයෝජනය කරන අවස්ථාවක දී, එම ව්‍යාපාරයේ වාණිජ කටයුතු ආරම්භ කරන ලද තක්සේරු වර්ෂයේ ආරම්භයේ සිට අවුරුදු පහක කාල සීමාවක් සඳහා ඒ ව්‍යාපාරයෙන් ඒ තැනැත්තාට ලැබෙන ලාභ සහ ආදායම.".

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තියේ "යම් පුද්ගලයකු විසින්" යන වචනවල සිට "රටවල් දෙකේම පුරවැසියකු නම්" යන වචන දක්වා ඇති සියලු වචන ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:–

"යම් පුද්ගලයකු-

(i) එම පුද්ගලයා ශ්‍රී ලංකාවේ ද සහ වෙනත් යම් රටක ද පුරවැසියකු නම්, 2013 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා;

(ii) එම පුද්ගලයා ශ්‍රී ලංකාවේ පුරවැසියකු නම් සහ –

(අ) ඔහු වෙනත් යම් රටක ද පුරවැසියකු නම්; හෝ

(ආ) ඔහු වෙනත් යම් රටක ස්ථිර වාසික තත්ත්වය හෝ වෙනත් සමාන තත්ත්වයක් ලබාගෙන ඇත්නම් හා ඒ යටතේ ඒ පුද්ගලයාට ඒ රටේ පුරවැසිභාවය ලබාගත හැකි නම්,

ඒ පුද්ගලයා එසේ පැමිණි අවස්ථාවේ දී සහ එසේ නැවතී සිටින සම්පූර්ණ කාලය තුළ, 2013 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා".

7. 2012 අංක 8 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 16ඈ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:–

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ දැක්වෙන උපලේඛනයේ I වන තීරයේ "කෘෂිකර්මාන්තයට සම්බන්ධ සේවාවක් ඇතුළත් නොවන, (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ සඳහන් යම් ක්‍රියාකාරකමක් (නිෂ්පාදනයෙන් 50% කට වැඩි ප්‍රමාණයක් දේශීය වෙළෙඳපොළෙහි විකිණීමට අපේක්ෂිත නම්, අවම වශයෙන් 35% ක එකතු කළ අගයක් නිෂ්පාදනවල තිබිය යුතු ය.)" යන වචන සහ ඉලක්කම් වෙනුවට "(2) වන උපවගන්තියේ (අ) ඡේදයේ සඳහන් යම් ක්‍රියාකාරකමක්,

යම් භාණ්ඩයක් නිෂ්පාදනය කිරීම සම්බන්ධයෙන් වන විට, නිෂ්පාදනයෙන් 50% කට වැඩි ප්‍රමාණයක් දේශීය වෙළෙඳපොළෙහි විකිණීමට අපේක්ෂිත නම්, අවම වශයෙන් 35% ක එකතු කළ අගයක් නිෂ්පාදනවල තිබිය යුතු ය." යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ –

(i) ඒ උපවගන්තියේ (ආ) ඡේදයේ "ආයෝජනය කරන; සහ" යන වචන වෙනුවට "ආයෝජනය කරන;" යන වචන ආදේශ කිරීමෙන්;

(ii) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයේ "වාණිජ කටයුතු ආරම්භ කරන," යන වචන වෙනුවට "වාණිජ කටයුතු ආරම්භ කරන; සහ" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(iii) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:–

"(ඈ) කලින් පැවති යම් ව්‍යාපාරයක් කැඩීම හෝ ප්‍රතිනිර්මාණය කිරීම හෝ අත්කර ගැනීම මගින් පිහිටුවනු නො ලැබුවා වූ,".

8. 2012 අංක 8 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 16ඈ වගන්තියේ "එම ව්‍යාවසාය විසින් එම තක්සේරු වර්ෂය තුළ දී" යන වචනවල සිට "නිදහස් කරනු ලැබිය යුතු ය." යන වචන දක්වා ඇති සියලු වචන ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:–

"එම ව්‍යවසාය කලින් පැවැති යම් ව්‍යාපාරයක් කැඩීම හෝ ප්‍රතිනිර්මාණය කිරීම හෝ අත්කර ගැනීම මගින් පිහිටුවනු නොලැබුවා වූ අවස්ථාවක දී, එම ව්‍යවසාය විසින් එම තක්සේරු වර්ෂය තුළ දී සිදු කරන ලද ගනුදෙනුවලින් ලාභ ඉපයීම ආරම්භ කළේ යම් තක්සේරු වර්ෂයක ද, එම තක්සේරු වර්ෂය ආරම්භයේ සිට හෝ එම ව්‍යවසාය විසින් වාණිජ කටයුතු කරගෙන යාම ආරම්භ කළ

දින සිට වසර දෙකක කාලසීමාවක් සම්පූර්ණ වන තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන තක්සේරු වර්ෂය ආරම්භයේ සිට, යන මෙයින් කලින් එළඹෙන වර්ෂයේ සිට ගණන් බලනු ලබන වසර පහක කාලසීමාවක් සඳහා ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

මේ වගන්තියේ කාර්ය සඳහා "ආයෝජනය" යන්නෙන් යම් ඉඩමක, පිරියතවල, යන්ත්‍රෝපකරණවල, උපකරණවල සහ වෙනත් ස්ථාවර වත්කම්වල පිරිවැය අදහස් වේ.".

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 16ඈ වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තිය එම ප්‍රඥප්තියේ 16ඉ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය:–

16ඉ. යම් තැනැත්තකුට හෝ හවුල් ව්‍යාපාරයකට (යම් ප්‍රාග්ධන වත්කමක් බැහැර කිරීමෙන් ලැබෙන ලාභ සහ ආදායම හැර) 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූලව–

(i) ශ්‍රී ලංකාව තුළ යම් පුනර්ජනනීය බලශක්ති උත්පාදක බෝග වගා කිරීමේ ව්‍යවසායකින් ලැබෙන ලාභ සහ ආදායම අවුරුදු දහයක කාලයක් සඳහා;

(ii) කාබනික පොහොර නිෂ්පාදනය කිරීම, බෙදා හැරීම සහ අලෙවි කිරීම හා සම්බන්ධ සියලු ගනුදෙනුවලින් ලැබෙන ලාභ සහ ආදායම;

2013 අප්‍රේල් මස 1 වන දින සිට සහ ඉන් පසුව ආදායම් බද්දෙන් නිදහස් විය යුතු ය.''.

10. 2012 අංක 8 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 17අ වගන්තියේ (2) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:–

(1) ඒ උපවගන්තියේ (අ) ඡේදයේ (ii) වන අනුඡේදයේ ''ඇඟලුම්'' යන වචන වෙනුවට '' ඇඟලුම් සහ රෙදිපිළි'' යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ උපවගන්තියේ (අ) ඡේදයේ (xxvii) වන අනුඡේදයේ ''නිරතව සිටින; සහ'' යන වචන වෙනුවට ''නිරතව සිටින;'' යන වචන ආදේශ කිරීමෙන්;

(3) ඒ උපවගන්තියේ (ආ) ඡේදයේ ''වාණිජ කටයුතු'' යන වචනවල සිට ''ව්‍යවසායක් අදහස් වේ.'' යන වචන දක්වා ඇති සියලුම වචන ඉවත් කොට ඒ වෙනුවට ''වාණිජ කටයුතු ආරම්භ කරන; සහ'' යන වචන ආදේශ කිරීමෙන්; සහ

(4) ඒ උපවගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:–

"(ඇ) කලින් පැවති යම් ව්‍යාපාරයක් කැඩීම හෝ ප්‍රතිනිර්මාණය කිරීම හෝ අත්කර ගැනීම මගින් පිහිටුවනු නොලැබුවා වූ, යම් ව්‍යවසායක් අදහස් වේ.

මේ වගන්තියේ කාර්ය සඳහා "ආයෝජනය" යන්නෙන් යම් ඉඩමක, පිරියතවල, යන්ත්‍රෝපකරණවල, උපකරණවල සහ වෙනත් ස්ථාවර වත්කම්වල පිරිවැය අදහස් වේ.''.

11. 2012 අංක 8 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:–

(1) ඒ උපවගන්තියේ (අ) ඡේදයේ අතුරු විධානයේ (ඇ) ඡේදයේ "සියයට පනහක් විය යුතු ය;" යන වචන වෙනුවට "සියයට පනහක් විය යුතු ය:

එසේ වුව ද, යම් වෙළෙඳාමක් හෝ ව්‍යාපාරයක් සඳහා 2013 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව අත්කර ගත් යම් අධි තාක්ෂණික පිරියත, යන්ත්‍රෝපකරණ හෝ උපකරණ භාවිතයෙන් වූ විකල්ප බලශක්ති මූලාශ්‍රවලින් ඒ වෙළෙඳාමේ හෝ ව්‍යාපාරයේ මුළු බලශක්ති උත්පාදන අවශ්‍යතාවලින් සියයට තිහකට වැඩි ප්‍රමාණයක් සපුරාලන අවස්ථාවක දී අනුප්‍රමාණය, අත්කර ගැනීමේ පිරිවැයෙන් සියයට සියයක් විය යුතු ය.

මේ අතුරු විධානයේ කාර්ය සඳහා "විකල්ප බලශක්ති මූලාශ්‍ර'' යන්නෙන් විදුලි බලය උත්පාදනය කරන ජාතික විදුලි බල පද්ධතිය හැර වෙනත් යම් මූලාශ්‍රයක් අදහස් වේ;'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) ඒ උපවගන්තියේ (අ) ඡේදයේ අතුරු විධානයේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේද එකතු කිරීමෙන්:–

"(ඉ) තාක්ෂණය ඉහළ නැංවීමේ කාර්ය සඳහා හෝ යම් නව තාක්ෂණය හඳුන්වා දීමේ කාර්ය සඳහා 2013 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව යම් ව්‍යාපාරයක් සඳහා යම් පිරියත හෝ යන්ත්‍රෝපකරණ හෝ උපකරණ අත්කර ගෙන භාවිතා කරනු ලබන අවස්ථාවක දී අනුප්‍රමාණය, අත්කර ගැනීමේ පිරිවැයෙන් සියයට පනහක් විය යුතු ය;

(ඊ) අවදානම් කළමනාකරණ පද්ධතියට අදාළව, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් බලපත්‍ර දී ඇති කොළඹ කොටස් හුවමාරුවේ අවශ්‍යතාවලට අනුකූලව, තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් ඉහළ නැංවීම සඳහා යම් කොටස් තැරැව්කාර සමාගමක් විසින් 2013 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව යම් පිරියත, යන්ත්‍රෝපකරණ හෝ උපකරණ අත්කර ගෙන භාවිතා කරනු ලබන අවස්ථාවක දී අනුප්‍රමාණය, අත්කර ගැනීමේ පිරිවැයෙන් සියයට සියයක් විය යුතු ය;

(උ) යම් වෙළෙඳාමක හෝ ව්‍යාපාරයක පිරිවැටුමෙන් අවම වශයෙන් සියයට හැටක් අපනයනවලින් ලැබෙන අවස්ථාවක දී හා ඒ වෙළෙඳාම හෝ ව්‍යාපාරය සඳහා 2013 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව යම් පිරියත, යන්ත්‍රෝපකරණ හෝ උපකරණ අත්කර ගෙන භාවිතා කරනු ලබන අවස්ථාවක දී අනුප්‍රමාණය, අත්කර ගැනීමේ පිරිවැයෙන් සියයට පනහක් විය යුතු ය;'';

(3) ඒ උපවගන්තියේ (එ) ඡේදයේ "සියයට දෙසීයකට සමාන යම් ප්‍රමාණයක්:'' යන වචනවල සිට "සියයට තුන්සියයකට සමාන මුදලක් විය යුතු ය;'' යන වචන දක්වා ඇති සියලු වචන සහ ඉලක්කම් ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්:–

"සියයට දෙසීයකට සමාන ප්‍රමාණයක්:

එසේ වුව ද,

(අ) ඒ වියදම 2012 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව, එහෙත් 2013 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව දරන ලද අවස්ථාවක දී සහ ඒ පර්යේෂණ යම් රාජ්‍ය ආයතනයක් හරහා සිදු කරනු ලබන අවස්ථාවක දී;

(ආ) ඒ වියදම 2013 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව දරන ලද අවස්ථාවක දී සහ ඒ පර්යේෂණ ශ්‍රී ලංකාවේ යම් ආයතනයක් හරහා සිදු කරනු ලබන අවස්ථාවක දී,

ඒ අඩු කිරීම ඒ තැනැත්තා විසින් දරන ලද ඒ වියදමෙන් සියයට තුන්සියයකට සමාන මුදලක් විය යුතු ය;''; සහ

(4) ඒ උපවගන්තියේ (ත) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්:–

"(ද) යම් රාජ්‍ය සංස්ථාවක් හෝ රජයට අයත් ව්‍යාපාර ආයතනයක් විසින් විශේෂ බද්දක් වශයෙන් ආණ්ඩුවට ගෙවනු ලබන යම් මුදලක්.".

12. 2012 අංක 8 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තියේ 1 වන උපවගන්තියේ (න) ඡේදයේ ''යම් භාණ්ඩ හෝ බඩුවල අපනයන වෙළෙඳාමට අදාළව'' යන වචන වෙනුවට ''ක්‍රීඩා විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද ජාත්‍යන්තර ක්‍රීඩා ඉසව්වල අනුග්‍රාහකත්වය සඳහා 2012 අගෝස්තු මස 1 වන දින හෝ එදිනට පසුව දරන ලද වෙළෙඳ ප්‍රචාරක දැන්වීම් සඳහා වූ වියදම් හෝ යම් භාණ්ඩ හෝ බඩුවල අපනයන වෙළෙඳාමට අදාළව'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

13. 2012 අංක 8 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:–

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (ත) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේද ඇතුළත් කිරීමෙන්:–

"(ද) ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන හෝ ශ්‍රී ලංකාවේ වාසිකයකු වන යම් පුද්ගලයකුගේ 4 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ සඳහන් ලාභ හැර සේවා නියුක්තියෙන් ලැබෙන ලාභ 2013 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා රුපියල් ලක්ෂ පහක් ඉක්මවන අවස්ථාවක-

(i) රුපියල් ලක්ෂ පහක් ඉක්මවා ඇති එම ලාභ වල කොටස; හෝ

(ii) රුපියල් ලක්ෂ එකක්,

යන මුදල් ප්‍රමාණ දෙකෙන් වඩා අඩු මුදල් ප්‍රමාණය; සහ

(න) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නා වූ හා ශ්‍රී ලංකාවේ වාසිකයකු නොවන්නා වූ යම් පුද්ගලයකුට 2013 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ශ්‍රී ලංකාව තුළ උපචිත වන නිල පඩිනඩිවලින් රුපියල් ලක්ෂ එකක් නො ඉක්මවන කොටස.''; සහ

(2) ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ (අ) ඡේදයේ (i) වන අනුඡේදයේ ''(2) වන උපවගන්තියේ (අ), (ආ), (ඇ), (ඉ), (උ), (ඌ), (ඍ), (එ), (ඒ), (ඔ), (ග),(ච), (ට), (ඩ), (ණ) සහ (ත) යන ඡේදවල සඳහන්'' යන වචන සහ ඉලක්කම් වෙනුවට ''(2) වන උපවගන්තියේ (අ), (ආ), (ඇ), (ඉ), (උ), (ඌ), (ඍ), (එ),(ඒ), (ඔ),(ග), (ච), (ට), (ඩ), (ණ), (ත), (ද) සහ (න) යන ඡේදවල සඳහන්'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

14. 2009 අංක 19 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 40අ වගන්තියේ ''සියයට විස්සක්'' යන වචන යොදා ඇති සෑම තැනකම ඒ වචන වෙනුවට ''සියයට දහසයක්'' යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

15. 2009 අංක 19 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 40ආ වගන්තියේ ''සියයට විස්සක්'' යන වචන යොදා ඇති සෑම තැනකම ඒ වචන වෙනුවට ''සියයට දහසයක්'' යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

16. ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තිය එම ප්‍රඥප්තියේ 46අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය:–

46අ. යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් තැනැත්තකුගේ බදු අය කළ හැකි ආදායමට (යම් ප්‍රාග්ධන වත්කමක් බැහැර කිරීම මගින් ලැබෙන ලාභ සහ ආදායම් කිසිවක් හැර) 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූලව කුකුළු ගොවිපළකින් ලැබෙන යම් ලාභ සහ ආදායම ඇතුළත් වන අවස්ථාවක, ඒ බදු අය කළ හැකි ආදායමෙහි ඒ ලාභ සහ ආදායම සංයුක්ත වන කොටසින් මේ පනතේ වෙනත් විධිවිධානවල පටහැනිව කුමක් සඳහන් වුව ද, මේ පනතේ පස්වන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන නිසි අනුප්‍රමාණය අනුව ආදායම් බදු අය කරනු ලැබිය යුතු ය.

මේ වගන්තියේ කාර්ය සඳහා "කුකුළු ගොවිපළකින් ලැබෙන ලාභ සහ ආදායම'' යන්නෙන්, ඒ තැනැත්තා විසින් එම නිෂ්පාදන යම් නිෂ්පාදන ක්‍රියාවලියකට හෝ සැදීමේ ක්‍රියාවලියකට භාජනය නොකර එම නිෂ්පාදන විකිණීමෙන් ලැබෙන ලාභ සහ ආදායම අදහස් වේ.".

17. ප්‍රධාන ප්‍රඥප්තියේ 48ආ වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තිය එම ප්‍රඥප්තියේ 48ඇ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය:–

48ඈ. යම් ව්‍යවසායක් ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පනතේ 17 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ බදු සහන ලබා දෙන යම් ගිවිසුමකට ඇතුළත්ව ඇති අවස්ථාවක දී සහ ඒ ගිවිසුම යටතේ සලසා දී ඇති බදු නිදහස් කාල සීමාව අවසන් වීමෙන් පසු ඒ ගිවිසුම යටතේ අය කරනු ලබන බද්ද දේශීය ආදායම් පනත යටතේ අය කරනු ලබන බද්දට වඩා වැඩි අවස්ථාවක දී, ඒ ව්‍යවසාය විසින් ඒ ගිවිසුම සම්බන්ධයෙන් තවදුරටත් යම් බදු සහනයක් යම් පරිපූරක ගිවිසුමක් මගින් ලබා නොගන්නේ නම්, ඒ බදු නිදහස් කාලසීමාව අවසන් වීමෙන් පසු ඒ ව්‍යවසායේ ලාභ සහ ආදායම මත දේශීය ආදායම් පනතේ විධිවිධානවලට අනුව ආදායම් බදු අය කරනු ලැබිය යුතු ය.''.

18. ප්‍රධාන ප්‍රඥප්තියේ 56 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :–

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ ''සියයට පහළොවක්'' යන වචන වෙනුවට ''සියයට දොළහක්'' යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ ''සියයට පහළොවක්'' යන වචන යොදා ඇති සෑම තැනක ම ඒ වචන වෙනුවට "සියයට දොළහක්" යන වචන ආදේශ කිරීමෙන්.

19. ප්‍රධාන ප්‍රඥප්තියේ 56 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්ති පිළිවෙළින් එම ප්‍රඥප්තියේ 56අ, 56ආ, 56ඇ සහ 56ඈ වගන්ති ලෙස බලපැවැත්විය යුතු ය.

56අ. ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පනතේ 17 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුමකට ඇතුළත්ව ඇති අපනයනාභිමුඛ සමාගමක් විසින් ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරන භාණ්ඩවලින් ආයෝජන මණ්ඩලය විසින් ආනයන ප්‍රතියෝජනය ලෙස අනුමත කරන ලද ප්‍රමාණය දක්වා–

(අ) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පනතේ 17 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුමකට ඇතුළත්ව ඇත්තා වූ ද, මේ පනතේ 16ඇ, 16ඈ හෝ 17අ වගන්ති යටතේ හෝ 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ බදු නිදහස් කාලසීමාවක් භුක්ති විඳින්නා වූ ද, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කාලපරිච්ඡේදය තුළ දී ඉහත කී ගිවිසුමේ විධිවිධාන යටතේ තීරු බදු රහිත පදනම මත ව්‍යාපෘතියට අදාළ භාණ්ඩ හෝ අමුද්‍රව්‍ය ආනයනය කිරීමට අවසර දෙනු ලැබ ඇත්තා වූ ද යම් සමාගමකට; හෝ

(ආ) යම් රජයේ ආයතනයක් යටතේ තීරු බදු රහිත පදනම මත නිශ්චිත භාණ්ඩ ආනයනය කිරීමට සුදුසුකම්ලත් යම් තැනැත්තකුට,

විකිණීමෙන් 2013 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා උද්ගත වන ලාභය සහ ආදායම මේ පනතේ වෙනත් යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන් වුව ද, අපනයනවලින් උද්ගත වූ ලාභ සහ ආදායම ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව ඒ ලාභ සහ ආදායමෙන් මේ පනතේ පස්වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උචිත අනුප්‍රමාණය අනුව ආදායම් බදු අය කරනු ලැබිය යුතු ය.

56ආ. විදේශ ව්‍යවහාර මුදලින් ගෙවීම් ලැබීම සඳහා, විදේශ නැව්වලට ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරනු ලබන යම් භාණ්ඩ සැපයීම හෝ සේවා සැපයීම වෙනුවෙන් 2013 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් තැනැත්තකු විසින් උපයනු ලබන ලාභ සහ ආදායම, මේ පනතේ වෙනත් යම් විධිවිධානවල පටහැනිව කුමක් සඳහන් වුව ද එය නොතකා, අපනයනවලින් උද්ගත වූ ලාභ සහ ආදායම ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ අනුව ඒ ලාභ සහ ආදායමෙන් මේ පනතේ පස්වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උචිත අනුප්‍රමාණය අනුව ආදායම් බදු අය කරනු ලැබිය යුතු ය.

56ඇ. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලය දී ඇති විදේශ විනිමය ඉපැයීම් ගිණුමක් හරහා විදේශ ව්‍යවහාර මුදලින් ගෙවීම් ලැබීම සඳහා ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත භාණ්ඩ විකිණීම මගින් 2013 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් තැනැත්තකු විසින් උපයනු ලබන ලාභ සහ ආදායම මේ පනතේ වෙනත් යම් විධිවිධානවල පටහැනිව කුමක් සඳහන් වුව ද එය නොතකා, අපනයනවලින් උද්ගත වූ ලාභ සහ ආදායම ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ අනුව ඒ ලාභ සහ ආදායමෙන් මේ පනතේ පස්වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උචිත අනුප්‍රමාණය අනුව ආදායම් බදු අය කරනු ලැබිය යුතු ය.

56ඈ. ස්වකීය නිෂ්පාදනවලින් සියයට හැටකට නො අඩු ප්‍රමාණයක් අපනයනය කරන යම් අපනයනාභිමුඛ සමාගමක් විසින් දේශීය වශයෙන් නිෂ්පාදනය කරන ලද නිමි ඇඳුම්, රෙදිවලින් සාදන ලද මලු, ලිනන්, තිර රෙදි හෝ වෙනත් යම් භාණ්ඩයක් දේශීය වෙළෙඳපොළෙහි විකිණීමෙන් 2013 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ඒ සමාගමට ලැබෙන ලාභයේ සහ ආදායමේ කොටස මත සියයට දොළහක අනුප්‍රමාණය මත ආදායම් බදු අය කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, අවස්ථාවෝචිත පරිදි ඒ නිමි ඇඳුම්වල, මලුවල, ලිනන්වල, තිර රෙදිවල හෝ වෙනත් භාණ්ඩවල දේශීය වටිනාකම එකතු කිරීම ශ්‍රී ලාංකීය වෙළෙඳ නාමය සහිතව සියයට හැට පහකට වැඩිවන අවස්ථාවක ඒ නිමි ඇඳුම්, මලු, ලිනන්, තිර රෙදි හෝ වෙනත් භාණ්ඩ දේශීය වෙළෙඳපොළෙහි විකිණීමෙන් ඒ අපනයනාභිමුඛ සමාගමට ලැබෙන ලාභයේ සහ ආදායමේ කොටස මත සියයට දහයක අනුප්‍රමාණය මත ආදායම් බදු අය කරනු ලැබිය යුතු ය.''.

20. 2012 අංක 8 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 59ආ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:–

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:–

"(ආ) (i) 2011 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන, එහෙත් 2013 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව වූ යම් තක්සේරු වර්ෂයක් වන එම තක්සේරු වර්ෂය සඳහා රුපියල් මිලියන තුන්සියයක් නො ඉක්මවන;

(ii) 2013 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් වන එම තක්සේරු වර්ෂය සඳහා රුපියල් මිලියන පන්සියයක් නො ඉක්මවන, (යම් ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලබන පිරිවැටුම නොවන) පිරිවැටුමක් සහිත,

යම් ව්‍යවසායක් අදහස් වේ."; සහ

(2) ඒ වගන්තියේ පැති සටහන වෙනුවට පහත දැක්වෙන පැති සටහන ආදේශ කිරීමෙන්:–

"වාර්ෂික පිරිවැටුම එක්තරා මුදලක් නො ඉක්මවන යම් ව්‍යාවසායකින් යම් තැනැත්තකු ලබන ලාභ සහ ආදායමට අදාළ අදායම් බදු අනුප්‍රමාණය.".

21. ප්‍රධාන ප්‍රඥප්තියේ 59ඇ වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්ති පිළිවෙලින් එම ප්‍රඥප්තියේ 59ඇ සහ 59ඉ වගන්ති ලෙස බලපැවැත් විය යුතු ය:–

59ඈ. (1) ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් බලපත්‍ර දී ඇති කොළඹ කොටස් හුවමාරුවේ 2013 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව එහෙත් 2014 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව තම කොටස් ලැයිස්තුගත කර ඇති සහ තම කොටස්වලින් සියයට විස්සකට නො අඩු කොටස් ප්‍රමාණයක් මුල් මහජන කොටස් නිකුතුව මගින් පොදු මහජනතාව වෙත නිකුත් කරනු ලබන යම් සමාගමක (යම් ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලැබෙන ලාභ සහ ආදායම හැර) 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූලව වූ ලාභ සහ ආදායම මත අදාළ වන බදු අනුප්‍රමාණය, ඒ සමාගම ලැයිස්තුගත කිරීමෙන් පසුව ඒ සමාගමේ කොටස්වලින් සියයට විස්සකට නො අඩු කොටස් ප්‍රමාණයක් පොදු මහජනතාව විසින් අඛණ්ඩව දරා සිටීමට යටත්ව, එම කොටස් ලැයිස්තුගත කරන ලද තක්සේරු වර්ෂය සඳහා සහ එම තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම වූ තවත් තක්සේරු වර්ෂ දෙකක කාලයක් සඳහා සියයට පනහකින් අඩු කරනු ලැබිය යුතු ය.

(2) තක්සේරුකරුවකුගේ මතය අනුව, (1) වන උපවගන්තියේ සඳහන් යම් සමාගමක් විසින් ස්වකීය කොටස් ලැයිස්තුගත කිරීමෙන් පසුව එළඹෙන යම් තක්සේරු වර්ෂයක දී, ඒ සමාගමේ කොටස්වලින් පොදු මහජනතාව විසින් දරා සිටින කොටස් ප්‍රමාණය සියයට විස්සකට වඩා අඩු නොවන පරිදි පවත්වාගෙන යාමට අපොහොසත් වන අවස්ථාවක දී, මේ පනතේ වෙනත් යම් විධිවිධානවල පටහැනිව කුමක් සඳහන් වුව ද එය නොතකා, (1) වන උපවගන්තිය යටතේ අඩු කරන ලද බදු මුදල නැවත තක්සේරු කරනු ලැබීමට, ගෙවනු ලැබීමට සහ අය කර ගනු ලැබීමට යටත් විය යුතු ය.

මේ වගන්තියේ කාර්ය සඳහා "පොදු මහජනතාව විසින් දරා සිටින කොටස්" යන්නෙන්, ලැයිස්තුගත සමාගමක් සම්බන්ධයෙන් වන විට-

(අ) ඒ සමාගමේ මව් සමාගම, පාලිත සමාගම් හෝ ආශ්‍රිත සමාගම් හෝ ඒ සමාගමේ මව් සමාගමේ යම් පාලිත සමාගම් හෝ ආශ්‍රිත සමාගම්;

(ආ) ඒ සමාගමේ අධ්‍යක්ෂවරුන් වශයෙන් ධූර දරමින් සිටින එහි අධ්‍යක්ෂවරුන්, ඔවුන්ගේ කලත්‍රයන් හා වයස අවුරුදු 18 ට අඩු ළමුන්;

(ඇ) ඒ සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී, ඔහුගේ කලත්‍රයා හා වයස අවුරුදු 18 ට අඩු ළමුන්; සහ

(ඈ) ඒ සමාගමේ කොටස්වලින් සියයට දහයක් හෝ ඊට වැඩි කොටස් ප්‍රමාණයක් දරන යම් තනි කොටස් හිමියකු,

විසින් සෘජුව ම හෝ වක්‍රව දරන කොටස් හැර යම් තැනැත්තකු විසින් දරන ඒ සමාගමේ කොටස් අදහස් වේ.

59ඉ. යම් කුඩා ජල විදුලිබල ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම ඇතුළත්ව, යම් විකල්ප බලශක්ති නිපදවීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම මගින් යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් උපයනු ලබන ලාභ සහ ආදායමෙන්, මේ පනතේ වෙනත් යම් විධිවිධානවල පටහැනිව කුමක් සඳහන් වුව ද, එය නොතකා, මේ පනතේ පස්වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උචිත අනුප්‍රමාණය අනුව ආදායම් බදු අය කරනු ලැබිය යුතු ය.

මේ වගන්තියේ කාර්ය සඳහා "කුඩා ජල විදුලිබල ව්‍යාපෘතියක්" යන්නෙන් මෙගා වොට්ස් දහයකට වඩා අඩු විදුලිබලයක් නිපදවනු ලබන යම් ජල විදුලිබල ව්‍යාපෘතියක් අදහස් වේ.".

22. 2009 අංක 19 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 60 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:–

(1) ඒ වගන්තියේ (අ) ඡේදයේ (ii) වන අනුඡේදයේ "තොග වශයෙන් වූ කළු තේ, ක්‍රේප් රබර්," යන වචන වෙනුවට "පැකට්ටු හෝ පාර්සල් ආකාරයෙන් නොවන, හා එක් එක් පැකට්ටුව හෝ පාර්සලය එක් කිලෝග්‍රෑමයකට වඩා බර නොවන කළු තේ, ක්‍රේප් රබර්," යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ වගන්තියේ "රබර් කිරි හෝ අලුත් පොල් හැර 16 වන වගන්තියේ සඳහන් වූ අනෙක් භාණ්ඩ අදහස් වේ;" යන වචන සහ ඉලක්කම් වෙනුවට "රබර් කිරි හෝ අලුත් පොල් හෝ 16 වන වගන්තියේ සඳහන් වෙනත් යම් නිෂ්පාදනයක් නොවන භාණ්ඩ අදහස් වන අතර, ඊට තොග වශයෙන් වන ඓන්ද්‍රීය තේ ඇතුළත් වේ." යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

23. 2011 අංක 22 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 78 වන වගන්තියේ (1) වන උපවගන්තිය සංශෝධනය කිරීම මගින් ඒ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:–

(1) ඒ උපවගන්තියේ (අ) ඡේදයේ "අනෙකුත් ආදායම්; සහ" යන වචන වෙනුවට "අනෙකුත් ආදායම්;" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ උපවගන්තියේ (ආ) ඡේදය වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේද ආදේශ කිරීමෙන්:–

"(ආ) 2007 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසු දිනයක සිට, එහෙත් 2013 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා 76 වන වගන්තියේ සඳහන් බේදිය හැකි ලාභය සහ අනෙකුත් ආදායම්වල එකතුවේ රුපියල් ලක්ෂ හයකට වැඩි අතිරික්තයක් වේ නම් එම අතිරික්තය ; සහ

(ඇ) 2013 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා 76 වන වගන්තියේ සඳහන් බෙදිය හැකි ලාභය සහ අනෙකුත් ආදායම්වල එකතුවේ රුපියල් මිලියන එකකට වැඩි අතිරික්තයක් වේ නම් එම අතිරික්තය,".

24. 2008 අංක 9 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 79 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:–

(1) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ "ඒ බැහැරව සිටීම ආරම්භ කරනු ලැබුවේ යම් තක්සේරු වර්ෂයක දී ද ඒ තක්සේරු වර්ෂයේ ආරම්භයේ සිට, නිර්වාසිකයකු ලෙස සලකනු ලැබිය යුතු ය." යන වචන වෙනුවට "ඒ බැහැරව සිටීම ආරම්භ කරනු ලැබුවේ 2013 අප්‍රේල් මස 1 වන දිනයට පෙරාතුව වූ තක්සේරු වර්ෂයක් වන්නා වූ යම් තක්සේරු වර්ෂයක දී ද ඒ තක්සේරු වර්ෂයේ ආරම්භයේ සිට, නිර්වාසිකයකු ලෙස සලකනු ලැබිය යුතු ය." යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ "දින තිහක් නො ඉක්මවන එම කාලසීමාව" යන වචන වෙනුවට "2013 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව වූ යම් තක්සේරු වර්ෂයක් සඳහා දින තිහක් නො ඉක්මවන එම කාලසීමාව" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

25. 2008 අංක 9 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 104 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:–

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "යම් ගනුදෙනුවක දී උද්ගත වූ" යන වචන වෙනුවට "යම් ජාත්‍යන්තර ගනුදෙනුවක දී උද්ගත වූ" යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:–

"(2) (1) වන උපවගන්තියේ සඳහන් ලාභ සහ ආදායම හෝ පාඩුව අසම්බන්ධිත මිල සැලකිල්ලට ගෙන තීරණය කර නැති බව තක්සේරුකරුවකුට පෙනී යන අවස්ථාවක, ඔහු විසින් ඒ ජාත්‍යන්තර ගනුදෙනුව සම්බන්ධයෙන් වන අසම්බන්ධිත මිල පිළිබඳ ආගණනය පැවරුම් මිල පිළිබඳ නිලධරයකු වෙත යොමු කරනු ලැබිය හැකි ය. අවස්ථාවෝචිත පරිදි ඒ ලාභ සහ ආදායම හෝ ඒ පාඩුව ඇත්ත වශයෙන් ම අසම්බන්ධිත මිල සැලකිල්ලට ගෙන තීරණය කර ඇති බවට ඒ පැවරුම් මිල පිළිබඳ නිලධරයා සෑහීමට පත්වන පරිදි ඔප්පු කරන ලෙස ඒ පැවරුම් මිල පිළිබඳ නිලධරයා විසින් (1) වන උපවගන්තියේ සඳහන් ආශ්‍රිත ව්‍යවසාය දෙකෙන් එක් ව්‍යවසායක් හෝ අනෙක් ව්‍යවසාය නැතහොත් ඒ ව්‍යවසාය දෙක ම පවත්වාගෙන යනු ලබන තැනැත්තා වෙත ලිඛිතව නියම කරනු ලැබිය හැකි ය. එසේ ඔප්පු කිරීමට ඒ තැනැත්තා අපොහොසත් වන අවස්ථාවක පැවරුම් මිල පිළිබඳ නිලධරයා විසින් අසම්බන්ධිත මිල තීරණය කොට තක්සේරුකරු වෙත දැනුම් දිය හැකි ය. එවිට ඒ තක්සේරුකරු විසින් (1) වන උපවගන්තියේ සඳහන්, අවස්ථාවෝචිත පරිදි ලාභයේ හා ආදායමේ හෝ පාඩුවේ ප්‍රමාණය ඇස්තමේන්තු කර ඒ අනුව තක්සේරුවක් කළ හැකි ය.";

(3) ඒ වගන්තියේ (3) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්;

"(3අ) මේ වගන්තියේ කාර්ය සඳහා නියමිත ආකාරයක් මත පදනම්ව අසම්බන්ධිත මිල සම්බන්ධයෙන් යම් තැනැත්තකු සහ කොමසාරිස් ජනරාල්වරයා අතර යම් පූර්ව මිල ගිවිසුමක් ඇති කරගනු ලැබිය හැකි ය.";

(4) ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ -

(අ) ඒ උපවගන්තියේ (ආ) ඡේදයේ "අදාළ කර ගනු ලබන මිළක් අදහස් වේ." යන වචන වෙනුවට "අදාළ කරගනු ලබන මිලක් අදහස් වේ;" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ආ) ඒ උපවගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන්:–

" "ජාත්‍යන්තර ගනුදෙනුවක්" යන්නෙන්, එක් ආශ්‍රිත ව්‍යවසායක් හෝ ආශ්‍රිත ව්‍යවසාය දෙකක් හෝ වැඩි ගණනක් නිර්වාසික ව්‍යවසාය වන්නා වූ යම් ආශ්‍රිත ව්‍යවසාය දෙකක් හෝ ඊට වැඩි ගණනක් අතර සිදුවන, යම් ස්පර්ශ කළ හැකි හෝ ස්පර්ශ කළ නොහැකි දේපල මිලදී ගැනීමේ, විකිණීමේ හෝ කල්බදු කිරීමේ හෝ සේවා සැපයීමේ හෝ මුදල් ණයට දීමේ හෝ මුදල් ණයට ගැනීමේ හෝ ස්වභාවයේ වන යම් ගනුදෙනුවක් හෝ ඒ ව්‍යවසායවල ලාභ, ආදායම්, පාඩු හෝ වත්කම් කෙරෙහි යම් බලපෑමක් ඇති කරන වෙනත් යම් ගනුදෙනුවක් අදහස් වන අතර, ඊට එවැනි ආශ්‍රිත ව්‍යවසාය දෙකක් හෝ වැඩි ගණනක් අතර වන යම් අන්‍යොන්‍ය ගිවිසුමක් හෝ වැඩපිළිවෙලක් යටතේ ඒ ව්‍යවසාය එකක් හෝ වැඩි ගණනක් සඳහා සපයනු ලබන හෝ සැපයීමට නියමිත යම් ප්‍රතිලාභයක්, සේවයක් හෝ පහසුකමක් සම්බන්ධයෙන් දරනු ලබන හෝ දැරීමට නියමිත යම් පිරිවැයක් හෝ වියදමක් සඳහා වූ යම් වෙන් කිරීමක්, බෙදා හැරීමක් හෝ දායකත්වයක් ඇතුළත් වේ. යම් ව්‍යවසායක් විසින් යම් තැනැත්තකු සමග ඇතුළත් වන යම් ගනුදෙනුවක දී එක්කෝ ඒ ව්‍යවසාය නැතහොත් ඒ තැනැත්තා නිර්වාසික වන අවස්ථාවක සහ ඒ ව්‍යවසාය හා ඒ තැනැත්තා ආශ්‍රිත ව්‍යවසායන් නොවන අවස්ථාවක දී, ඒ ව්‍යවසාය විසින් ඒ තැනැත්තා සමග ඇතුළත් වූ එම ගනුදෙනුව සම්බන්ධයෙන් ඒ ව්‍යවසාය හා ඒ තැනැත්තා අතර ඇතුළත් වූ යම් පූර්ව ගිවිසුමක් ඇත්නම් සහ ඒ ගිවිසුමේ අන්තර්ගත එම ගනුදෙනුව පිළිබඳ කොන්දේසි මගින්, ගෙවිය යුතු බදු මුදල් ප්‍රමාණය අඩු කරන හෝ අඩුවීමේ ප්‍රතිඵලය ඇති කරනු ලබන ආකාරයට ඒ ව්‍යවසාය හා ඒ තැනැත්තා අතර එම ගනුදෙනුව තීරණය කරනු ලබයි නම් එම ගනුදෙනුව (1) වන උපවගන්තියේ කාර්ය සඳහා ආශ්‍රිත ව්‍යවසාය දෙකක් අතර ඇතුළත් වූ ජාත්‍යන්තර ගනුදෙනුවක් ලෙස සලකනු ලැබිය යුතු ය;

මේ උපවගන්තියේ විධිවිධානවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, ජාත්‍යන්තර ගනුදෙනුවකින් උපචිතවන යම් වියදම් හෝ පොලිය සඳහා වූ යම් දීමනාවක් අසම්බන්ධිත මිල පිළිබඳව ද සැලකිල්ලට ගෙන තීරණය කළ යුතු ය;

"පැවරුම් මිල පිළිබඳ නිලධරයා" යන්නෙන් කොමසාරිස් ජනරාල්වරයා විසින් පැවරුම් මිල පිළිබඳ නිලධරයකු වශයෙන් නියම කරන ලද දේශීය ආදායම් නිලධරයකු අදහස් වේ."; සහ

(5) ඒ වගන්තියේ පැති සටහනේ සඳහන් "ගනුදෙනුවලින්" යන වචනය වෙනුවට "ජාත්‍යන්තර ගනුදෙනුවලින්" යන වචන ආදේශ කිරීමෙන්.

26. ප්‍රධාන ප්‍රඥප්තියේ 104 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 104අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:–

104අ. (1) 104 වන වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් ගනුදෙනු හැර, යම් ආශ්‍රිත ව්‍යවසාය දෙකක් අතර සිදුකරන ලද යම් ගනුදෙනුවක දී උද්ගත වූ, උපයාගත් හෝ උපචිත වූ යම් ලාභ සහ ආදායම හෝ දැරීමට සිදු වූ යම් පාඩුවක් අසම්බන්ධිත මිල සැලකිල්ලට ගෙන තීරණය කළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් ලාභ සහ ආදායම හෝ පාඩුව අසම්බන්ධිත මිල සැලකිල්ලට ගෙන තීරණය කර නැති බව තක්සේරුකරුවකුට පෙනී යන අවස්ථාවක දී, අවස්ථාවෝචිත පරිදි එම ලාභ සහ ආදායම හෝ පාඩුව ඇත්ත වශයෙන් ම අසම්බන්ධිත මිල සැලකිල්ලට ගෙන තීරණය කර ඇති බවට ඒ තක්සේරුකරු සෑහීමට පත්වන පරිදි ඔප්පු කරන ලෙස ඒ තක්සේරුකරු විසින් (1) වන උපවගන්තියේ සඳහන් ආශ්‍රිත ව්‍යවසාය දෙකෙන් එක් ව්‍යවසායක් හෝ අනෙක් ව්‍යවසාය හෝ ඒ ව්‍යවසාය දෙකම පවත්වාගෙන යනු ලබන තැනැත්තා වෙත ලිඛිතව නියම කරනු ලැබිය හැකි ය. එසේ ඔප්පු කිරීමට ඒ තැනැත්තා අපොහොසත් වන අවස්ථාවක දී, (1) වන උපවගන්තියේ සඳහන්, අවස්ථාවෝචිත පරිදි ලාභය සහ ආදායමේ හෝ පාඩුවේ ප්‍රමාණය ඒ තක්සේරුකරු විසින් ඇස්තමේන්තු කර ඒ අනුව තක්සේරුවක් කළ හැකි ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් අසම්බන්ධිත මිල, තත්කාර්ය සඳහා නියම කරනු ලබන ක්‍රම එකක් හෝ ඊට වැඩි ගණනක පදනම මත තීරණය කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ කාර්ය සඳහා–

(අ) යම් ව්‍යවසායක්, නියම කරනු ලැබිය හැකි ආකාරයට සහ ඒ වැනි ප්‍රමාණයකට, කෙළින් ම හෝ අන්‍යාකාරයකින් හෝ එක් මැදිහත්කරුවකු හෝ මැදිහත්කරුවන් වැඩි ප්‍රමාණයක් හරහා වෙනත් ව්‍යවසායක් පාලනය කිරීම සම්බන්ධයෙන් සහභාගි වන්නේ නම් පළමුව සඳහන් කළ ව්‍යවසාය දෙවනුව සඳහන් කළ ව්‍යවසායේ ආශ්‍රිත ව්‍යවසායක් ලෙස සලකනු ලැබිය යුතු ය;

(ආ) "අසම්බන්ධිත මිල" යන්නෙන් ආශ්‍රිත ව්‍යවසායන් නොවන තැනැත්තන් අතර ඇති කර ගනු ලබන ගනුදෙනුවල දී පාලනය කළ නොහැකි තත්වයන් යටතේ අදාළ කර ගනු ලබන මිලක් අදහස් වේ.".

27. 2012 අංක 8 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 113 වන වගන්තියේ (5) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:–

"(6) (5) වන උපවගන්තියේ සඳහන් ආයෝජන අරමුදලෙහි ආයෝජනය කිරීම සඳහා නියම කරනු ලැබ ඇති යම් බැංකුවක් හෝ මූල්‍ය ආයතනයක් විසින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශවලට අනුකූලව 2013 ජූලි මස 1 වන දිනට අරමුදලේ බැරට පවතින අරමුදල්වලින් යම් කොටසක් ප්‍රයෝජනයට ගෙන නොමැති අවස්ථාවක දී, එම ශේෂය අවස්ථාවෝචිත පරිදි එම බැංකුව හෝ මූල්‍ය ආයතනය විසින් ආණ්ඩුවට ගෙවනු ලැබිය යුතු ණය මුදලක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව එම ශේෂය ඒකාබද්ධ අරමුදල වෙත මාරු කරනු ලැබිය යුතු ය.".

28. ප්‍රධාන ප්‍රඥප්තියේ 121 වන වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:–

"(3) යම් තක්සේරු වර්ෂයක දී, යම් සේවා යෝජකයකු විසින් යම් ගෙවීම් කාලසීමාවක් සඳහා යම් සේවා නියුක්තයකුගේ පාරිශ්‍රමිකය සම්බන්ධයෙන් අඩු කළ යුතු මුදල ඉක්මවා එම සේවා නියුක්තයාගේ පාරිශ්‍රමිකයෙන් යම් ආදායම් බදු ප්‍රමාණයක් අඩු කරගෙන ඇති අවස්ථාවක දී, එම සේවා යෝජකයා විසින් එම තක්සේරු වර්ෂයේ හෝ එම තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන තක්සේරු වර්ෂයේ යම් ගෙවීම් කාලසීමාවක් සම්බන්ධයෙන් එම සේවා නියුක්තයාගේ පාරිශ්‍රමිකයෙන් අඩු කළ යුතු ආදායම් බදු මුදලින් එම වැඩිපුර අය කරන ලද මුදල අඩු කරනු ලැබිය හැකි අතර, ඒ බව කොමසාරිස් ජනරාල්වරයා වෙත එම ගැළපීම සිදු කර සති දෙකක් ඇතුළත ඒ වූ පරිදි ම දැනුම් දිය යුතු ය.".

29. 2011 අංක 22 දරන පනතින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 135 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "එම අඩු කිරීම, එම සාංගමික ණය සුරැකුම් පත්‍රය නිකුත් කරන අවස්ථාවේ දී සිදු කළ යුතු ය." යන වචන වෙනුවට "එම අඩු කිරීම, එම සාංගමික ණය සුරැකුම් පත්‍රය නිකුත් කරන අවස්ථාවේ දී සිදු කළ යුතු ය:

එසේ වුව ද–

(අ) සමාලෝචන කාලසීමාව පුරා ගෙවනු ලබන චල පොලී අනුප්‍රමාණයකට ඒ සාංගමික ණය සුරැකුම්පත් නිකුත් කරන අවස්ථාවක දී, ඒ අඩුකිරීම, එවැනි එක් එක් පොලී අනුප්‍රමාණ සමාලෝචන කාලසීමාව ආරම්භවන අවස්ථාවේ දී ම සිදු කළ යුතු ය;

(ආ) යම් සාංගමික ණය සුරැකුම්පතක් 2011 අප්‍රේල් මස 1 වන දිනයට පෙරාතුව නිකුත් කරන සහ 2011 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එයට පොලිය ගෙවනු ලබන අවස්ථාවක සහ ඒ සඳහා වූ පොලියෙන් කිසිදු ආදායම් බද්දක් අඩුකර නොමැති අවස්ථාවක, ඒ අඩු කිරීම ඒ පොලිය ගෙවන හෝ බැර කරන අවස්ථාවේ දී ම සිදු කළ යුතු ය; සහ

(ඇ) 9 වන වගන්තියේ (ච) ඡේදයේ සඳහන් යම් පොලියෙන් හෝ වට්ටමෙන් මේ වගන්තිය යටතේ ආදායම් බදු සඳහා කිසිදු අඩු කිරීමක් කරනු නො ලැබිය යුතු ය."

යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් වැඩිදුරටත් සංශෝධනය කරනු ලැබේ.

30. ප්‍රධාන ප්‍රඥප්තියේ 140 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(1) ඒ වගන්තියේ "මේ පනත යටතේ ආදායම් බදු අය කළ යුතු තැනැත්තන්ට යම් තක්සේරු වර්ෂයක දී බැංකුවේ හෝ මූල්‍ය ආයතනයක් විසින් ගෙවනු ලබන පොළියෙන්" යන වචනවල සිට "ඒ ආදායම් බද්ද අඩු කළ යුතු ය." යන වචන දක්වා ඇති සියලු

වචන ඉවත් කර ඒ වෙනුවට "මේ පනත යටතේ ආදායම් බදු අය කළ යුතු තැනැත්තන්ට යම් තක්සේරු වර්ෂයක දී බැංකුවක් හෝ මූල්‍ය ආයතනයක් හෝ සාංගමික ණය සුරැකුම්පත් නිකුත් කරන සමාගමක් විසින් අවස්ථාවෝචිත පරිදි, ගෙවනු ලබන, බැර කරනු ලබන හෝ වට්ටම් ලබාදෙන පොලියෙන් ආදායම් බදු අඩුකිරීමට නියම කරනු ලැබ ඇති ඒ සෑම බැංකුවක් හෝ මූල්‍ය ආයතනයක් හෝ සාංගමික ණය සුරැකුම්පත් නිකුත් කරන සමාගමක් විසින් ම, ඒ ගෙවීම සම්බන්ධයෙන් අවස්ථාවෝචිත පරිදි ඒ බැංකුව හෝ මූල්‍ය ආයතනය හෝ සමාගම සහ ඒ තැනැත්තා අතර ඇතුළත් වූ යම් ගිවිසුමකට අනුකූලව ඒ තැනැත්තාට ඒ පොලිය ගෙවනු ලබන අවස්ථාවේ දී හෝ ඒ සුරැකුම්පත් නිකුත් කරනු ලබන අවස්ථාවේ දී හෝ වල පොලී අනුප්‍රමාණයකට ඒ සාංගමික ණය සුරැකුම්පත් නිකුත් කරනු ලබන අවස්ථාවක එක් එක් සමාලෝචන කාලසීමාව ආරම්භයේ දී හෝ ඒ ආදායම් බද්ද අඩු කරනු ලැබිය යුතු ය."යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ වගන්තියේ පැති සටහනේ "බැංකු සහ මූල්‍ය ආයතන සතු කාර්ය." යන වචන වෙනුවට "බැංකු, මූල්‍ය ආයතන සහ සමාගම් සතු කාර්ය." යන වචන ආදේශ කිරීමෙන්.

31. ප්‍රධාන ප්‍රඥප්තියේ 141 වන වගන්තියේ "යම් ණය සුරැකුමක් නිකුත් කරන යම් බැංකුවක් හෝ මූල්‍ය ආයතනයක්" යන වචනවල සිට "මුදල් ප්‍රමාණයක දණ්ඩනයක්" යන වචන දක්වා ඇති සියලු වචන සහ ඉලක්කම් ඉවත් කර ඒ වෙනුවට "පොලිය ගෙවන හෝ යම් ණය සුරැකුමක් නිකුත් කරන යම් බැංකුවක් හෝ මූල්‍ය ආයතනයක් හෝ සාංගමික ණය සුරැකුම්පත් නිකුත් කරන යම් සමාගමක් විසින් 133 වන වගන්තියේ හෝ 135 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව බදු අඩුකර නොගන්නා බව කොමසාරිස් ජනරාල්වරයාගේ අදහස වන අවස්ථාවක, ඒ පිළිබඳ හේතු දැක්වීමට අවස්ථාවෝචිත පරිදි, පොලිය ගෙවන හෝ ණය සුරැකුම්පත් නිකුත් කරන හෝ සාංගමික ණය සුරැකුම්පත් නිකුත් කරන ඒ බැංකුවට, මූල්‍ය ආයතනයට හෝ ඒ සමාගමට අවස්ථාවක් ලබා දීමෙන් පසුව සහ 133 වන වගන්තියේ හෝ 135 වන වගන්තියේ විධිවිධාන උල්ලංඝනයවීමක් සිදු වී තිබෙන බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, පොලිය ගෙවන හෝ ණය සුරැකුම්පත් නිකුත් කරන හෝ සාංගමික ණය සුරැකුම්පත් නිකුත් කරන ඒ බැංකුව හෝ මූල්‍ය ආයතනය හෝ සමාගම විසින් එකී වගන්තිවල විධිවිධාන උල්ලංඝනය කිරීමෙන් මගහරින ලද ආදායම් බද්ද මෙන් සියයට පන්සියයකට සමාන මුදල් ප්‍රමාණයක දණ්ඩනයක් ඒ බැංකුව, මූල්‍ය ආයතනය හෝ සමාගම වෙත" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

32. ප්‍රධාන ප්‍රඥප්තියේ 142 වන වගන්තියේ "බැංකුවක් හෝ මූල්‍ය ආයතනයක්" යන වචන ඒ වගන්තියේ (1) වන, (2) වන සහ (3) වන උපවගන්තිවල යොදා ඇති සෑම තැනකම ඒ වචන වෙනුවට "බැංකුවක් හෝ මූල්‍ය ආයතනයක් හෝ සමාගමක්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

33. 2011 අංක 22 දරන පනතින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 163 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:–

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ-

(අ) ඒ උපවගන්තියේ අතුරු විධානයේ "සැප්තැම්බර් මස" යන වචන වෙනුවට "නොවැම්බර් මස" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) ඒ උපවගන්තියේ තවදුරටත් අතුරු විධානයේ "61 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ හෝ 62 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදය" යන වචන සහ ඉලක්කම් වෙනුවට "61 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (i) වන අනුඡේදය හෝ 61 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය හෝ 62 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ (ආ) ඡේදයේ "තක්සේරු කළ හැකි ආදායමෙහි" යන වචන වෙනුවට "තක්සේරු කළ හැකි ආදායමෙහි" යන වචන ආදේශ කිරීමෙන්;

(3) ඒ වගන්තියේ (5) වන උපවගන්තියේ (අ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:–

"(අ) යම් තක්සේරු වර්ෂයකට ඉක්බිතිව ම එළඹෙන තක්සේරු වර්ෂයේ නොවැම්බර් මස තිස්වන දින හෝ එදිනට පෙර යම් තැනැත්තකුගේ හෝ හවුල් ව්‍යාපාරයක ආදායම් පිළිබඳ වාර්තාව ඉදිරිපත් කර ඇති ඒ තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය සම්බන්ධයෙන්,

(i) ඒ තක්සේරු වර්ෂය 2013 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් වන අවස්ථාවක දී ඒ තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන තක්සේරු වර්ෂයේ නොවැම්බර් මස තිස්වන දින සිට වසර දෙකක කාලසීමාවක් ඉකුත්වීමෙන් පසුව; සහ

(ii) ඒ තක්සේරු වර්ෂය 2013 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් වන අවස්ථාවක දී ඒ තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන තක්සේරු වර්ෂයේ නොවැම්බර් මස තිස්වන දින සිට මාස දහ අටක කාලසීමාවක් ඉකුත්වීමෙන් පසුව; සහ"; සහ

(4) ඒ වගන්තියේ (9) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:–

"(10) මේ පනතේ වෙනත් යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන් වුව ද, යම් වෙළෙඳාමකින් හෝ ව්‍යාපාරයකින් 2011 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා සමාගමක හැර යම් තැනැත්තකුගේ සමස්ත වාර්ෂික පිරිවැටුම රුපියල් මිලියන තුන්සියයක් නොඉක්මවන අවස්ථාවක සහ ඒ තැනැත්තා දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් පරිපාලනය කරනු ලබන යම් බදු නීතියක විධිවිධානවලට අනුකූලව ක්‍රියාකර නොමැති අවස්ථාවක, ඒ තැනැත්තා විසින් 2011 අප්‍රේල් මස 1 වන දිනට පෙර එසේ උපයන ලද මුදල් 2014 මාර්තු මස 31 වන දින හෝ එදිනට පෙර යම් වෙළෙඳාමක හෝ ව්‍යාපාරයක ආයෝජනය කර 2014 අප්‍රේල් මස 1 දිනට පෙර ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා වූ ආදායම පිළිබඳ වාර්තාවක් සහ ඉන් පසුව එළඹෙන යම් කාලසීමාවක් සඳහා මේ පනතේ නියමයන්ට අනුකූලව ක්‍රියා කරන බවට ලිඛිත පොරොන්දුවක් ඔහු විසින් ඉදිරිපත් කරනු ලබන්නේ නම්, එම වාර්තාව පිළිගනු ලැබිය

යුතු අතර, එම වාර්තාව ඉදිරිපත් කර ඇති තක්සේරු වර්ෂය සම්බන්ධයෙන් සහ එම තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන තක්සේරු වර්ෂ පහක් සඳහා එම තැනැත්තා මත කිසිදු තක්සේරුවක් හෝ අතිරේක තක්සේරුවක් කරනු නොලැබිය යුතු ය.".

34. ප්‍රධාන ප්‍රඥප්තියේ 172 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:–

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "සමීක්ෂණ මණ්ඩලය වෙත" යන වචන වෙනුවට "2011 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව සමාලෝචන මණ්ඩලය වෙත හෝ 2011 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව බඳු අභියාචනා කොමිෂන් සභාව වෙත" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ "මේ වගන්තියේ ඉහත සඳහන් විධිවිධාන යටතේ වූ සෑම අභියාචනයක් විභාග කර ඊට සුදුස්සක් කිරීම සම්බන්ධයෙන් හැකිතාක් දුරට 169 වන වගන්තියෙහි විධිවිධාන අදාළ විය යුතු ය. කොමසාරිස් ජනරාල්වරයාගේ නියමය මගින් පනවනු ලැබුවා වූ ද අභියාචනයට විෂය වූ දණ්ඩන මුදල ස්ථිර කිරීම, අඩු කිරීම, වැඩි කිරීම නැතහොත් අවලංගු කිරීම සමීක්ෂණ මණ්ඩලය විසින් කරනු ලැබිය හැකි ය." යන වචන සහ ඉලක්කම් වෙනුවට "මේ වගන්තියේ ඉහත සඳහන් විධිවිධාන යටතේ වූ සෑම අභියාචනයක් ම 2011 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව විභාග කර ඊට සුදුස්සක් කිරීම සම්බන්ධයෙන් හැකිතාක් දුරට 169 වන වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය. කොමසාරිස් ජනරාල්වරයාගේ නියමය මගින් පනවනු ලැබුවා වූ ද අභියාචනයට විෂය වූ ද දණ්ඩන මුදල ස්ථිර කිරීම, අඩු කිරීම, වැඩි කිරීම නැතහොත් අවලංගු කිරීම අවස්ථාවෝචිත පරිදි 2011 අප්‍රේල් මස 1 වන දිනයට පෙරාතුව සමාලෝචන මණ්ඩලය විසින් හෝ 2011 අප්‍රේල් මස 1 වන දිනයට පසුව බඳු අභියාචනා කොමිෂන් සභාව විසින් කරනු ලැබිය හැකි ය." යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

35. 2011 අංක 22 දරන පනතින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 204අ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:–

(1) ඒ වගන්තියේ "මෙම පනතේ ඕනෑම වගන්තියක් හෝ ඒ යටතේ නිකුත් කොට ඇති යම් නියෝගයක්, රීතියක් හෝ නියමයක්" යන වචන වෙනුවට "කොමසාරිස් ජනරාල්වරයා විසින් පරිපාලනය කරන මේ පනතේ හෝ වෙනත් යම් පනතක යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදනු ලැබ ඇති යම් නියෝගයක්, රීතියක් හෝ නියමයක්" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ වගන්තියේ පැති සටහනේ "පනතේ" යන වචනය වෙනුවට "කොමසාරිස් ජනරාල්වරයා විසින් පරිපාලනය කරන මේ පනතේ හෝ වෙනත් යම් පනතක" යන වචන ආදේශ කිරීමෙන්.

36. ප්‍රධාන ප්‍රඥප්තියේ 208අ වගන්තියේ අවසානයට පහත දැක්වෙන වචන එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:–

"අර්ථනිරූපණය කිරීම සඳහා කමිටුව වෙත ඉදිරිපත් කරන ලද යම් ඉල්ලීමක් ඒ ඉල්ලීම ලැබුණු දින සිට මාස හයක් ඇතුළත කමිටුව විසින් නිශ්චය කරනු ලැබිය යුතු ය.".

37. 2012 අංක 8 දරන පනතින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 217 වන වගන්තියේ "ලාභාංශ" යන යෙදුමේ අර්ථ නිරූපණයේ (අ) ඡේදයේ (iv) වන අනුඡේදයේ "වෙනත් ආකාරයක ලාභාංශ:" යන වචන වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:-

"වෙනත් ආකාරයක ලාභාංශ ; හෝ

(v) සමාගමක් විසින් සිය කොටස්කරුවන්ගෙන් කොටස් ආපසු මිලදී ගනු ලබන අවස්ථාවක, ඒ කොටස් ආපසු මිලදී ගැනීම ඒ සමාගමේ කොටස්කරුවන් විසින් අනුමත කරන ලද රැස්වීමේ දිනයේ දී පැවති අවස්ථාවෝචිත පරිදි, කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කරන ලද ඒ කොටස්වල වෙළෙඳපොළ මිල හෝ වෙළෙඳපොළ වටිනාකම සහ ඒ සමාගම විසින් ඒ කොටස්කරුවන් වෙත ගෙවනු ලැබූ මුදල අතර යම් අතිරික්තයක් වේ නම් එම අතිරික්තය;".

38. 2012 අංක 8 දරන පනතින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනයේ V වන කොටස වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් ඒ උපලේඛනය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:–

**"V වන කොටස**

35 වන වගන්තියේ (2) වන උපවගන්තියේ අතුරු විධානයේ සඳහන් කර ඇති යම් මුදලකට අදාළ වන ආදායම් බදු අනුප්‍රමාණය-

| | |
|---|---|
| (අ) 2013 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පෙර ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා | I වන කොටස, Iඅ කොටස හෝ Iආ කොටස ප්‍රකාරව, එහෙත් සියයට 20 ක උපරිමයකට යටත්ව. |
| (ආ) 2013 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා | Iආ කොටස ප්‍රකාරව, එහෙත් සියයට 16ක උපරිමයකට යටත්ව.". |

39. 2012 අංක 8 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනයේ අ කොටසේ 2 වන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අයිතමය එකතු කිරීමෙන් ඒ උපලේඛනය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:-

"3. යම් ඒකක භාර කළමනාකරණ සමාගමක බදු අය කළ හැකි ආදායම මත-

| | |
|---|---|
| (අ) 2013 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා | ආ කොටස ප්‍රකාරව |
| (ආ) 2013 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා | සියයට 10". |

40. 2012 අංක 8 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ පස්වන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:–

(1) ඒ උපලේඛනයේ 22 වන අයිතමය වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන්:–

"22. 58 වන වගන්තියේ සඳහන් ලාභ සහ ආදායම මත ආදායම් බදු අනුප්‍රමාණය–

| | |
|---|---|
| (අ) 2011 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා | සියයට 15 |
| (ආ) 2011 අප්‍රේල් මස 1 වන දිනට හෝ එදිනට පසු ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා | සියයට 12"; |

(2) ඒ උපලේඛනයේ 23 වන අයිතමය වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන්:–

"23. 59 වන වගන්තියේ සඳහන් නැවකින් නැවකට මාරු කිරීමේ නියෝජ්‍යායතන ගාස්තුවලින් උපචිත වන ලාභ සහ ආදායම මත ආදායම් බදු අනුප්‍රමාණය –

| | |
|---|---|
| (අ) 2011 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා | සියයට 15 |
| (ආ) 2011 අප්‍රේල් මස 1 වන දිනට හෝ එදිනට පසු ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා | සියයට 12"; |

(3) ඒ උපලේඛනයේ 40 වන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අයිතම එකතු කිරීමෙන්:–

| | |
|---|---|
| 41. 46අ වගන්තියේ සඳහන් කුකුළන් ඇති කිරීම සඳහා වූ ව්‍යවසායකින් යම් තැනැත්තකුට ලැබෙන ලාභ සහ ආදායම් කොටසට අදාළ ආදායම් බදු අනුප්‍රමාණය. | පුද්ගලයකු සම්බන්ධයෙන් පළමුවන උපලේඛනය ප්‍රකාරව, එහෙත් සියයට 10 ක උපරිමයකට යටත්ව සහ සමාගමක් සම්බන්ධයෙන් සියයට 10. |
| 42. 56අ වගන්තියේ සඳහන් යම් ව්‍යවසායකින් යම් තැනැත්තකුට ලැබෙන ලාභ සහ ආදායම් කොටසට අදාළ ආදායම් බදු අනුප්‍රමාණය. | පුද්ගලයකු සම්බන්ධයෙන් පළමුවන උපලේඛනය ප්‍රකාරව, එහෙත් සියයට 12 ක උපරිමයකට යටත්ව සහ සමාගමක් සම්බන්ධයෙන් සියයට 12. |
| 43. 56ආ වගන්තියේ සඳහන් යම් ව්‍යවසායකින් යම් තැනැත්තකුට ලැබෙන ලාභ සහ ආදායම් කොටසට අදාළ ආදායම් බදු අනුප්‍රමාණය. | පුද්ගලයකු සම්බන්ධයෙන් පළමුවන උපලේඛනය ප්‍රකාරව, එහෙත් සියයට 12 ක උපරිමයකට යටත්ව සහ සමාගමක් සම්බන්ධයෙන් සියයට 12. |
| 44. 56ඇ වගන්තියේ සඳහන් යම් ව්‍යවසායකින් යම් තැනැත්තකුට ලැබෙන ලාභ සහ ආදායම් කොටසට අදාළ බදු අනුප්‍රමාණය. | පුද්ගලයකු සම්බන්ධයෙන් පළමුවන උපලේඛනය ප්‍රකාරව, එහෙත් සියයට 12 ක උපරිමයකට යටත්ව සහ සමාගමක් සම්බන්ධයෙන් සියයට 12. |
| 45. 59ඉ වගන්තියේ සඳහන් යම් ව්‍යවසායකින් යම් තැනැත්තකුට හෝ හවුල් ව්‍යාපාරයකට ලැබෙන ලාභ සහ අදායම් කොටසට අදාළ ආදායම් බදු අනුප්‍රමාණය. | පුද්ගලයකු සම්බන්ධයෙන් පළමුවන උපලේඛනය ප්‍රකාරව, එහෙත් සියයට 12 ක උපරිමයකට යටත්ව සහ සමාගමක් සම්බන්ධයෙන් සියයට 12.". |

41. මේ පනතේ යම් විධිවිධානයක් ප්‍රකාරව, 2013 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භව, මේ පනත සම්බන්ධයෙන් කථානායකවරයාගේ සහතිකය ඔහුගේ අත්සන් ඇතිව සටහන් කරන ලද දිනයෙන් අවසන් වන කාලසීමාව තුළ කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ ඔහු වෙනුවෙන්, යම් තැනැත්තකුගෙන් අය කරන ලද හෝ එකතු කරන ලද යම් බදු මුදලක් කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ කොමසාරිස් ජනරාල්වරයා වෙනුවෙන් ඒ බද්ද අයකරන ලද හෝ එකතු කරන ලද ඒ තැනැත්තා විසින් මේ පනත යටතේ වලංගු ලෙස හා නීත්‍යානුකූල ලෙස අය කරනු ලැබූ හෝ එකතු කරන ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය:

එසේ වුව ද, ඉහත කී විධිවිධාන, ඒ කාලසීමාව තුළ දී අයකරන ලද හෝ එකතු කරන ලද යම් බද්දක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් විසින් දෙන ලද යම් තීරණයකට හෝ කරන ලද යම් ආඥාවකට හෝ යම් අධිකරණයක විභාග වෙමින් පවතින යම් නීති කෘත්‍යයකට බල නො පෑ යුතු ය.

42. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

## 2013 අංක 19 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු (සංශෝධන) පනත

[සහතිකය සහටන් කළේ 2013 අප්‍රේල් මස 24 වැනි දින]

**1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :–

1. මේ පනත 2013 අංක 19 දරන ඔට්ටු ඇල්ලීම හා සූදු බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර මේ පනතේ විධිවිධාන සියලු කාර්ය සඳහා 2013 ජනවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

2. 2005 අංක 9 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු පනතේ 2 වන වගන්තිය එම වගන්තියේ (1) වන උප වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උප වගන්ති ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :–

"(1අ) (1) වන උපවගන්තිය යටතේ බද්ද ගෙවීමට යටත් සෑම තැනැත්තකුගෙන් ම එකී බද්ද ගෙවීමට අමතරව එක් එක් මාසය සම්බන්ධයෙන් (1) වන උපවගන්තියේ (අ) හෝ (ආ) ඡේදවල සඳහන් ව්‍යාපාරයක් කරගෙන යාමෙන් ලැබෙන දළ එකතුව මත සියයට පහක අනුපාතය අනුව වූ බද්දක් අය කරගනු ලැබිය යුතුය :

එසේ වුවද, මේ උපවගන්තිය යටතේ එකී බද්ද ගෙවීමට යටත් වන තැනැත්තා එම දල එකතුව මත 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත යටතේ එකතු කළ අගය මත බද්ද හෝ 2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත යටතේ ජාතිය ගොඩනැගීමේ බද්ද ගෙවීමට යටත් නොවිය යුතු ය :

එසේම තවදුරටත්, (1) වන උපවගන්තියේ (අ) හෝ (ආ) යන ඡේද වල සඳහන් ව්‍යාපාර කරගෙන යන යම් තැනැත්තකුගේ දල එකතුව මසකට රුපියල් මිලියන එකකට වැඩි නොවන්නේ නම්, එම තැනැත්තා මේ උපවගන්තිය යටතේ ගෙවීමට නියමිත බද්ද ගෙවීමට යටත් නොවිය යුතු ය.

(1ආ) (1අ) වන උපවගන්තිය යටතේ බද්ද ගෙවීමට යටත් සෑම තැනැත්තකු විසින් ම –

(අ) අදාළ කාර්තුව අවසන් වීමෙන් පසු එළඹෙන මාසයේ විසි වන දින හෝ එදිනට පෙර, එම තැනැත්තාගේ දළ එකතුව පිළිබඳ කොමසාරිස්-ජනරාල්වරයා විසින් නිශ්චිතව නියම කරනු ලැබිය හැකි යම් ආකෘති පත්‍රයකට අනුව සකස් කරනු ලැබුවා වූ ද හා එසේ නියමිත තොරතුරු ඇතුළත් වන්නා වූ ද වාර්තාවක් ලිඛිතව හෝ විද්‍යුත් මාර්ගයෙන් කොමසාරිස්-ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය ; සහ

(ආ) එක් එක් මාසය සම්බන්ධයෙන් වූ එම බද්ද එම මාසය අවසන්වීමෙන් පසු එළඹෙන මාසයේ පළමුවන සතියේ හෝ එම සතියට පෙර ගෙවා අවසන් කළ යුතු ය.

(1ඇ) (1අ) වන උපවගන්තිය යටතේ බදු ගෙවීමට යටත් යම් තැනැත්තකු, එකී බද්ද ගෙවීම පැහැර හරින අවස්ථාවක, මේ පනතේ 4 වන වගන්තියේ (2) වන, (3) වන, (4) වන, (5) වන සහ (6) වන උපවගන්තිවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව (1අ) උපවගන්තිය යටතේ ගෙවනු ලැබිය යුතු බද්ද ගෙවීම, පැහැර හැරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(1ඈ) මේ වගන්තියේ කාර්යය සඳහා-

(අ) "දළ එකතුව" යන්නෙන්, එම මාසය සම්බන්ධයෙන් බුකිකරුවකුගේ ව්‍යාපාරයෙන් හෝ සූදු ව්‍යාපාරයෙන් අයකර ගනු ලැබූ සම්පූර්ණ මුදල අදහස් වේ ;

(ආ) "අදාළ කාර්තුව" යන්නෙන්, යම් වර්ෂයක ජනවාරි මස පළමුවන දිනයෙන්, අප්‍රේල් මස පළමුවන දිනයෙන්, ජූලි මස පළමුවන දිනයෙන් හෝ ඔක්තෝබර් මස පළමුවන දිනයෙන් ආරම්භ වන මාස තුනක කාලසීමාව අදහස් වේ.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 2අ වගන්තිය වශයෙන් බලාත්මක විය යුතුය :–

2අ. (1) 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් වන පරිදි බුකිකරුවකුගේ ව්‍යාපාරය හෝ සූදු ව්‍යාපාරය කරගෙන යනු ලබන සෑම තැනැත්තෙක් ම 2013 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව අවස්ථාවෝචිත පරිදි මේ පනත ක්‍රියාත්මක වීමේ දිනයේ සිට මාස පහක කාලසීමාවක් ඇතුළත හෝ ව්‍යාපාරය ආරම්භ කිරීමේ දින සිට එක් මසක් ඇතුළත දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත ලියාපදිංචි විය යුතුය.

(2) නම, ලිපිනය, ලියාපදිංචි කිරීමේ අංකය සහ කොමසාරිස්-ජනරාල්වරයා විසින් තීරණය කරනු ලැබිය හැකි වෙනත් යම් විස්තර ඇතුලත් ලියාපදිංචි කිරීමේ සහතිකයක් කොමසාරිස්-ජනරාල්වරයා විසින් (1) වන උපවගන්තිය යටතේ ලියාපදිංචි වූ සෑම තැනැත්තකු වෙතම නිකුත් කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරන සෑම තැනැත්තෙකු ම වරදක් සිදු කරන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් අනතුරුව වරදකරු කරනු ලැබුවහොත් රුපියල් මිලියන දහයකට නොවැඩි දඩයකට හෝ මාස හයකට නොවැඩි කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කරනු ලැබීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාර ගත කිරීම යන දෙකටම හෝ ඔහු යටත් වන්නේ ය.".

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ :–

(1) "තක්සේරුකරු", "කොමසාරිස්-ජනරාල්වරයා", "නියෝජ්‍ය කොමසාරිස්වරයා" සහ "තැනැත්තන්" යන යෙදුම්වල අර්ථ නිරූපනය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපනය ආදේශ කිරීමෙන් :–

"තක්සේරුකරු", "කොමසාරිස්-ජනරාල්වරයා", "නියෝජ්‍ය කොමසාරිස්වරයා" යන යෙදුම්වල ඒවාට පිළිවෙලින් ව්‍යාපාර පිරිවැටුම් බදු පනතේ 59 වන වගන්තියෙන් ඊට දී ඇති අර්ථම ඇත්තේ ය.

(2) "සූදු" යන වචනයේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ නිරූපණය එකතු කිරීමෙන් :–

"තැනැත්තා" යන්නට යම් සමාගමක්, සංස්ථාපිත හෝ සංස්ථාපිත නොවූ පුද්ගල මණ්ඩලයක් හෝ යම් හවුල් ව්‍යාපාරයක් ඇතුළත් වේ;".

5. 2013 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වී මේ පනත සම්බන්ධයෙන් කථානායකවරයාගේ සහතිකය ඔහුගේ අත්සන ඇතිව සටහන් කරනු ලබන දිනයෙන් අවසන් වන කාල සීමාව තුළ දී ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ බලය දෙනු ලැබූ කොමසාරිස්-ජනරාල්වරයා හෝ යම් තැනැත්තකු විසින් ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තියේ (1අ) උපවගන්තිය යටතේ යම් තැනැත්තකුගෙන් අයකර එකතුකරගනු

ලැබූ බදු මුදල සියලු කාර්යයන් සඳහා මේ පනත යටතේ කොමසාරිස්-ජනරාල්වරයා හෝ එම තැනැත්තා විසින් වලංගු ලෙස පනවා එකතු කරගනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතුය :

එසේ වුව ද, ඉහත කී විධිවිධාන එකී කාලසීමාව තුළ දී අයකරන ලැබූ සහ එකතු කරනු ලැබූ එම බදු මුදල් සම්බන්ධයෙන් යම් අධිකරණයක් විසින් නිකුත් කරන ලද යම් තීරණයකට හෝ ආඥාවකට හෝ යම් අධිකරණයක විභාග වෙමින් පවත්නා නීති කෘත්‍යයකට බල නොපෑ යුතු ය.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන උපලේඛනය මෙයින් ආදේශ කරනු ලැබේ :–

"උපලේඛනය (2 වන වගන්තිය)

I වන කොටස

බුකීකරුවෙකු ලෙස ව්‍යාපාරය කරගෙන යන තැනැත්තකු විසින් මෙහි I වන තීරුවේ නිශ්චිතව සඳහන් සෑම වර්ෂයක් සඳහා ම ගෙවිය යුතු බදු මුදල් ප්‍රමාණය මෙහි II වන තීරුවේ අනුරූප සටහනේ නිශ්චිතව සඳහන් මුදල හා සමාන මුදලක් විය යුතුය.

| *I වන තීරුව* *වර්ෂය* | *II වන තීරුව* *බදු මුදල් ප්‍රමාණය* |
|---|---|
| 1. 1988 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 2001 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන සෑම වර්ෂයක්ම සඳහා. | රුපියල් එක් ලක්ෂයක්. |
| 2. 2001 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 2002 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන සෑම වර්ෂයක් සඳහා. | රුපියල් මිලියන එකක්. |
| 3. 2002 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 2005 අප්‍රේල් මස 1 දිනට පෙර ආරම්භ වන සෑම වර්ෂයක් සඳහා - | |
| (i) ව්‍යාපාරය පවත්වාගෙන යාමේදී සජීවී රූපවාහිනී විකාශන පහසුකම් භාවිතා කරන අවස්ථාවක. | රුපියල් තිස් දහසක්. |
| (ii) ව්‍යාපාරයක් පවත්වාගෙන යාමේදී සජීවී රූපවාහිනී විකාශන පහසුකම් භාවිතා නොකරන අවස්ථාවක. | රුපියල් දස දහසක්. |
| 4. 2005 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 2006 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන සෑම වර්ෂයක් සඳහා ඔට්ටු ඇල්ලීමේ ව්‍යාපාරය— | |
| (i) අනුයෝජිතයන් මාර්ගයෙන් කරනු ලබන විට. | රුපියල් මිලියන එකක්. |
| (ii) සජීවී රූපවාහිනී විකාශන පහසුකම් භාවිතාකර පවත්වාගෙන යනු ලබන අවස්ථාවක. | රුපියල් දෙලක්ෂ පනස්දහසක්. |
| (iii) සජීවී රූපවාහිනී විකාශන පහසුකම් භාවිතා නොකර පවත්වාගෙන යනු ලබන අවස්ථාවක. | රුපියල් මිලියන විසිපන් දහසක්. |
| 5. 2006 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 2013 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන සෑම වර්ෂයක් සඳහා ඔට්ටු ඇල්ලීමේ ව්‍යාපාරය — | |
| (i) අනුයෝජිතයන් මාර්ගයෙන් කරනු ලබන විට, | රුපියල් මිලියන එකක්. |
| (ii) සජීවී රූපවාහිනී පහසුකම් භාවිතා කර පවත්වාගෙන යනු ලබන අවස්ථාවක. | රුපියල් තුන් ලක්ෂයක්. |
| (iii) සජීවී රූපවාහිනී විකාශන පහසුකම් භාවිතා නොකර පවත්වාගෙන යනු ලබන අවස්ථාවක. | රුපියල් පනස් දහසක්. |
| 6. 2013 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන සෑම වර්ෂයක් සඳහා ඔට්ටු ඇල්ලීමේ ව්‍යාපාරය– | |
| (i) අනුයෝජිතයන් මාර්ගයෙන් කරනු ලබන විට, | රුපියල් මිලියන දෙකක්. |
| (ii) සජීවී රූපවාහිනී පහසුකම් භාවිතා කර පවත්වාගෙන යනු ලබන අවස්ථාවක. | රුපියල් තුන් ලක්ෂයක්. |
| (iii) සජීවී රූපවාහිනී විකාශන පහසුකම් භාවිතා නොකර පවත්වාගෙන යනු ලබන අවස්ථාවක. | රුපියල් විසිපන් දහසක්. |

II වන කොටස

සූදු ව්‍යාපාරයක් කරගෙන යනු ලබන තැනැත්තකු විසින් මෙහි I වන තීරුවේ නිශ්චිතව සඳහන් සෑම වර්ෂයක් සඳහාම ගෙවිය යුතු බදු මුදල් ප්‍රමාණය මෙහි II වන තීරුවේ අනුරූප සටහනේ නිශ්චිතව සඳහන් මුදල හා සමාන මුදලක් විය යුතු ය.

| *I වන තීරුව* *වර්ෂය* | *II වන තීරුව* *බදු මුදල් ප්‍රමාණය* |
|---|---|
| 1. 1988 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 2001 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන සෑම වර්ෂයක්ම සඳහා. | රුපියල් මිලියන එකක්. |

| | | |
|---|---|---|
| 2. | 2001 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 2002 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන සෑම වර්ෂයක්ම සඳහා. | රුපියල් මිලියන විසිපහක්. |
| 3. | 2002 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 2005 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන සෑම වර්ෂයක් සඳහා - | |
| | (i) (රූජිනෝ ක්‍රීඩාව කිරීම හැර) සූදු ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා. | රුපියල් මිලියන දොළහක්. |
| | (ii) රූජිනෝ ක්‍රීඩාව පමණක් ක්‍රීඩා කිරීමෙන් ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා. | රුපියල් පන් ලක්ෂයක්. |
| 4. | 2005 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසු එහෙත් 2013 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන සෑම වර්ෂයක්ම සඳහා රූජිනෝ ක්‍රීඩාව, ක්‍රීඩා කිරීම ඇතුළු සූදු ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා. | රුපියල් මිලියන පනහක්. |
| 5. | 2013 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසු ආරම්භ වන සෑම වර්ෂයක් සඳහා රූජිනෝ ක්‍රීඩාව, ක්‍රීඩා කිරීම ඇතුළු සූදු ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා. | රුපියල් මිලියන සියයක්." |

7. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

## 2013 අංක 20 දරන බදු අභියාචනා කොමිෂන් සභාව (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2013 අප්‍රේල් මස 24 වැනි දින]

**2011 අංක 23 දරන බදු අභියාචනා කොමිෂන් සභාව පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:–

1. මේ පනත 2013 අංක 20 දරන බදු අභියාචනා කොමිෂන් සභාව (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. 2012 අංක 4 දරන බදු අභියාචනා කොමිෂන් සභාව (සංශෝධන) පනත මගින් අවසන්වරට සංශෝධිත, (මෙහි මින්මතු ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2011 අංක 23 දරන බදු අභියාචනා කොමිෂන් සභාව පනතේ 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:–

(1) එහි (2) වන උපවගන්තියේ, විශ්‍රාමික ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරුන් සහ අභියාචනාධිකරණ විනිශ්චයකාරවරුන් අතරින් එක් අයෙකුගෙන් ද, බදුකරණය, මූල්‍ය සහ නීතිය යන ක්ෂේත්‍ර පිළිබඳ පුළුල් දැනුමක් සහිත සහ විශිෂ්ඨත්වයක් ලත් තැනැත්තන් අතරින් පත් කරනු ලබන වෙනත් සාමාජිකයන් දෙදෙනෙකුගෙන් ද සැදුම්ලත් සාමාජිකයන් තිදෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතු ය." යන වචන වෙනුවට විශ්‍රාමික ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරුන් සහ අභියාචනාධිකරණ විනිශ්චයකාරවරුන් අතරින් තුන්දෙනෙකුගෙන් ද, බදුකරණය, මූල්‍ය සහ නීතිය යන ක්ෂේත්‍ර පිළිබඳ පුළුල් දැනුමක් සහිත සහ විශිෂ්ඨත්වයක් ලත් තැනැත්තන් අතුරින් පත් කරනු ලබන වෙනත් සාමාජිකයන් හයදෙනකුගෙන් ද සැදුම්ලත්, සාමාජිකයන් නවදෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි (2) වන උපවගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන්:–

"(2අ) කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින්, කොමිෂන් සභාව ඉදිරියේ පවතින යම් කාරණයක් පිළිබඳ විභාගකොට තීන්දුවක් ලබා දීම සඳහා, එක් එක් මූලමණ්ඩලය (2) වන උපවගන්තිය යටතේ පත් කරනු ලබන සාමාජිකයන් අතුරින්, සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත සහ ඉන් එක් සාමාජිකයෙකු (2)වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති විනිශ්චයකාරවරයෙකු විය යුතු, මූල මණ්ඩල තුනක් පිහිටුවිය යුතු ය.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියේ "සාමාජිකයන් පස්දෙනෙකු විය යුතු ය." යන වචන වෙනුවට "සාමාජිකයන් හත්දෙනෙකු විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

4. 2012 අංක 4 දරන බදු අභියාචනා කොමිෂන් සභාව (සංශෝධන) පනත මගින් අවසන් වරට සංශෝධිත, ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:–

(1) එහි (1) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :–

"(1)(අ) මෙම පනතේ 1 වන උපලේඛනයේ I වන තීරයේ හෝ II වන උපලේඛනයේ, නිශ්චිතව දක්වා ඇති යම් ප්‍රඥප්තියක විධිවිධාන යටතේ යම් බද්දක්, ගාස්තුවක්, අයකිරීමක්, පැනවීමක් හෝ දණ්ඩනයක් පැනවීම හා අදාළ යම් කාරණාවක් සම්බන්ධයෙන් (මෙහි මින්මතු කොමසාරිස් - ජනරාල්වරයා" වශයෙන් සඳහන් කරනු ලබන) දේශීය ආදායම් පනත ප්‍රකාරව පත් කරන ලද දේශීය ආදායම් කොමසාරිස් - ජනරාල්වරයා විසින්; හෝ

(ආ) (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනතේ 10 වන වගන්තියේ (1අ) උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති යම් කාරණාවක් සම්බන්ධයෙන් (මෙහි මින්මතු "අධ්‍යක්ෂ - ජනරාල්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) රේගු අධ්‍යක්ෂ - ජනරාල්වරයා විසින්,

ලබාදෙන යම් තීරණයකින් අතෘප්තියට පත්වන යම් තැනැත්තෙකු විසින්, මෙහි මින්මතු දක්වා ඇති විධිවිධානවලට අනුකූලව කොමිෂන් සභාව වෙත අභියාචනා කළ හැකි ය:

එසේ වුව ද, (අ) ඡේදය යටතේ කොමිෂන් සභාව වෙත අභියාචනා කිරීමට අපේක්ෂා කරනු ලබන සෑම තැනැත්තකුටම, එම අභියාචනය කරනු ලබන අවස්ථාවේ දී ඉහත කී ප්‍රඥප්තිය යටතේ එම තැනැත්තා විසින් ගෙවිය යුතු බවට කොමසාරිස් - ජනරාල්වරයා විසින් තක්සේරු කර ඇති සහ එම තක්සේරුව අභියාචනයේ විෂයය කාරණය වී ඇති මුදලින් -

(අ) ආපසු ගෙවනු නොලබන සියයට දහයකට සමාන මුදල් ප්‍රමාණයක් කොමිෂන් සභාව විසින් තත්කාර්යය සඳහා විවෘත කරනු ලබන සහ පවත්වාගෙන යනු ලබන විශේෂ ගිණුමකට ගෙවන ලෙස; හෝ

(ආ) මෙම වගන්තියේ (1ආ) උපවගන්තියේ විධිවිධානවලට යටත්ව ආපසු ගෙවනු ලබන, සියයට විසි පහකට සමාන මුදල් ප්‍රමාණයක් කොමිෂන් සභාව විසින් තත්කාර්යය සඳහා විවෘත කරනු ලබන සහ පවත්වාගෙන යනු ලබන විශේෂ ගිණුමකට ගෙවන ලෙස හෝ කොමිෂන් සභාව විසින් අභියාචනය පිළිබඳ තීරණය කරනු ලබන තෙක් වලංගුව පවතින, එම මුදල් ප්‍රමාණයට සමාන මුදල් ප්‍රමාණයක බැංකු ඇපකරයක් තබන ලෙස,

නියම කරනු ලැබිය යුතු ය.".

(2) (1) වන උපවගන්තියට ඉක්බිතිවම පහත සඳහන් අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් :–

"(1අ) (අ) අවස්ථාවෝචිත පරිදි, (1) වන උපවගන්තියේ අතුරු විධානයේ (අ) හෝ (ආ) ඡේදවල දක්වා ඇති මුදල් ප්‍රමාණය එම මුදල් ප්‍රමාණය අදාළ වන්නේ යම් අභියාචනයක් සම්බන්ධයෙන් ද, එකී අභියාචනය නිශ්චය කළ පසු, සහ ඉහත කී ප්‍රඥප්ති යටතේ යම් බද්දක්, ගාස්තුවක්, අයකිරීමක්, පැනවීමක් හෝ දණ්ඩනයක් ලෙස ගෙවිය යුතු බවට කොමසාරිස්-ජනරාල්වරයා විසින් තක්සේරු කරන ලද සහ අභියාචනයට විෂයය කාරණය වී ඇති තක්සේරු මුදල් ප්‍රමාණයට එරෙහිව එම මුදල් ප්‍රමාණය හිලව් කළ පසු, කොමසාරිස්-ජනරාල්වරයා වෙත පවරනු ලැබිය යුතු ය.

(ආ) කොමසාරිස්-ජනරාල්වරයා විසින් පරිපාලනය කරනු ලබන, (1) වන උපවගන්තියේ අතුරු විධානයේ (ආ) ඡේදයේ දක්වා ඇති මුදල් ප්‍රමාණයේ යම් අතිරික්තයක් ගෙවීමට නියමිත යම් බදු මුදල් ප්‍රමාණයකට හිලව් කළ යුතු ය. එම හිලව් කිරීමෙන් පසුව තවදුරටත් එම මුදලේ යම් ශේෂයක් පවතින්නේ නම් අභියාචකයා විසින්, කොමසාරිස්-ජනරාල්වරයා වෙත කරනු ලබන ලිඛිත ඉල්ලීමක් මගින් අභියාචක වෙත එම මුදල නැවත ගෙවනු ලැබිය යුතු ය.";

(3) එම වගන්තියේ (2) වන උපවගන්තියේ "මේ පනතේ I වන උපලේඛනයේ සහ II වන උපලේඛනයේ I වන තීරයේ" යන වචන හා ඉලක්කම් වෙනුවට "මේ පනතේ 7 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) සහ (ආ) ඡේදවල" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(4) එම වගන්තියේ (3) වන උපවගන්තියේ "එම දැන්වීමේ පිටපතක් කොමසාරිස්-ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර," යන වචන වෙනුවට "එම දැන්වීමේ පිටපතක් අවස්ථාවෝචිත පරිදි, කොමසාරිස් - ජනරාල්වරයා වෙත හෝ අධ්‍යක්ෂ - ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර," යන වචන ආදේශ කිරීමෙන්.

5. 2012 අංක 4 දරන බදු අභියාචන කොමිෂන් සභාව (සංශෝධන) පනත මගින් අවසන්වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:–

8. (1) යම් තැනැත්තකු,

(අ) යම්බදු, ගාස්තු, අයකිරීම්, පැනවීම් හෝ දණ්ඩන පිළිබඳව වූ යම් කාරණයක් සම්බන්ධයෙන් කොමසාරිස්-ජනරාල්වරයාගේ තීරණයකින්; හෝ

(ආ) (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනතේ 10 වන වගන්තියේ (1ආ) උපවගන්තිය යටතේ අධ්‍යක්ෂ-ජනරාල්වරයාගේ තීරණයකින්,

අතෘප්තියට පත්වේ නම් එම තැනැත්තා විසින් අවස්ථාවෝචිත පරිදි, කොමසාරිස්-ජනරාල්වරයා හෝ අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් ප්‍රකාශ කරන ලද හේතු තමාවෙත ලැබුණු දිනයේ සිට දින තිහක් ඇතුළත ඒ පිළිබඳව කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය; හෝ

(2) අධ්‍යක්ෂ - ජනරාල්වරයා ඉහත ආඥාපනතේ 10 වන වගන්තියේ (1ආ) උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව තුළ දී එම තීරණය දීමට අපොහොසත් වන අවස්ථාවක දී එම තැනැත්තා විසින්, ඉහත ආඥාපනතේ 10 වන වගන්තියේ (1ආ) උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව අවසානයේ දී කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(3) අභියාචනයක් ඉදිරිපත් කිරීමේ ආකාරය සහ ආකෘතිය, එවැනි අභියාචනයක් විභාග කිරීමේ දී සහ තීරණය කිරීමේ දී කොමිෂන් සභාව විසින් අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සහ ඒ සම්බන්ධයෙන් ගෙවිය යුතු ගාස්තු ඇත්නම් එම ගාස්තු කොමිෂන් සභාව විසින් තත්කාර්ය සඳහා සාදනු ලබන රීති මගින් නිශ්චය කරනු ලබන ආකාරයට විය යුතු ය.".

6. 2012 අංක 4 දරන බදු අභියාචනා කොමිෂන් සභාව (සංශෝධන) පනත මගින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:–

(1) එහි (1) වන උපවගන්තියේ "කොමසාරිස්-ජනරාල්වරයා" යන වචන වෙනුවට "අවස්ථාවෝචිත පරිදි, කොමසාරිස් - ජනරාල්වරයා හෝ අධ්‍යක්ෂ-ජනරාල්වරයා" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි (2) වන උපවගන්තියේ "කොමසාරිස් - ජනරාල්වරයා විසින්" යන වචන සහ "I වන උපලේඛනයේ සහ II වන උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති" යන වචන සහ ඉලක්කම් වෙනුවට "අවස්ථාවෝචිත පරිදි, කොමසාරිස්-ජනරාල්වරයා හෝ අධ්‍යක්ෂ-ජනරාල්වරයා" යන වචන සහ "I වන උපලේඛනයේ I වන තීරයේ හෝ II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති හෝ (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනතේ අදාළ වන යම් විධිවිධාන," යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(3) එහි (4) වන උපවගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:–

(4) (අ) 7 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ වන අභියාචනයක් සම්බන්ධයෙන්, අභියාචනය කොට ඇත්තේ යම් තක්සේරුවකට එරෙහිව ද, එම තක්සේරුව කරන ලද තක්සේරුකරු හෝ තත් කාර්යය සඳහා කොමසාරිස් - ජනරාල්වරයා විසින් බලය පවරනු ලබන යම් තැනැත්තෙකු ; හෝ

(ආ) 7 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ වන අභියාචනයක් සම්බන්ධයෙන්, තත් කාර්යය සඳහා අධ්‍යක්ෂ - ජනරාල්වරයා විසින් බලය පවරනු ලබන යම් තැනැත්තෙකු,

අවස්ථාවෝචිත පරිදි, කොමසාරිස් - ජනරාල්වරයාගේ හෝ අධ්‍යක්ෂ - ජනරාල්වරයාගේ තීරණය සඳහා සහාය වීම පිණිස, එම අභියාචනය විභාග කරනු ලබන කොමිෂන් සභාවේ විභාග කිරීමට සහභාගි විය යුතු ය.".

(4) එහි (5) වන උපවගන්තියේ "I වන උපලේඛනයේ සහ II වන උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති" යන වචන සහ ඉලක්කම් වෙනුවට "I වන උපලේඛනයේ I වන තීරයේ හෝ II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(5) එහි (8) වන උපවගන්තියේ, "කොමසාරිස් - ජනරාල්වරයා" යන වචන සඳහන් වන කවර හෝ තැනක ඒ වචන වෙනුවට "අවස්ථාවෝචිත පරිදි, කොමසාරිස් - ජනරාල්වරයා හෝ අධ්‍යක්ෂ - ජනරාල්වරයා" යන වචන ආදේශ කිරීමෙන්;

(6) එහි (10) වන උපවගන්තියේ "තක්සේරුව ප්‍රතිශෝධනය කළ යුතු ය. කොමිෂන් සභාවේ තීරණය අභියාචකට සහ කොමසාරිස් - ජනරාල්වරයාට ලිඛිතව දැනුම් දිය යුතු ය." යන වචන වෙනුවට "තක්සේරුව ප්‍රතිශෝධනය කළ යුතු ය." යන වචන ආදේශ කිරීමෙන්;

(7) (10) වන උපවගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන්:–

(11) කොමිෂන් සභාවේ තීරණය අවසානාත්මක විය යුතු අතර, එම තීරණය අභියාචකට සහ අවස්ථාවෝචිත පරිදි, කොමසාරිස් - ජනරාල්වරයාට හෝ අධ්‍යක්ෂ - ජනරාල්වරයාට දැනුම් දිය යුතු ය.".

7. 2012 අංක 4 දරන බදු අභියාචනා කොමිෂන් සභාව (සංශෝධන) පනත මගින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය "අභියාචනය විභාග කිරීම ආරම්භ කළ දින සිට දින දෙසීය හැත්තෑවක් ඇතුළත ලබාදිය යුතු යඃ" යන වචනවලින් ආරම්භව ඒ වගන්තියේ අවසානය දක්වා වූ සියලු වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:–

"ඒ එක් එක් අභියාචනය විභාග කිරීම සඳහා රැස්වීම් ආරම්භ කරනු ලබන දින සිට දින දෙසීය හැත්තෑවක් ඇතුළත ලබාදිය යුතු යඃ

එසේ වුව ද, මේ පනතේ 1 වන උපලේඛනයේ 1 වන තීරයේ හෝ II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති පරිදි වෙනස් බදු අයකළ හැකි කාල සීමා සඳහා අදාළ වේ යන කරුණ නොතකා අදාළ ප්‍රඥප්තීන්හි විධිවිධානවලට අනුව අදාළ මණ්ඩල හෝ සමාලෝචන මණ්ඩල ඉදිරියේ විභාග වෙමින් පවත්නා සියලු අභියාචනා මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට කොමිෂන් සභාව වෙත පවරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර, වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන් ව තිබුණ ද, කොමිෂන් සභාව විසින් ඒ එක් එක් අභියාචනය විභාග කිරීම සඳහා කොමිෂන් සභාව සිය රැස්වීම් ආරම්භ කරනු ලබන දින සිට මාස විසි හතරක කාල සීමාවක් ඇතුළත දී ඒ සම්බන්ධයෙන් තීන්දුවක් ලබා දිය යුතු ය.".

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 11අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු යඃ–

11අ. (1) මේ පනතේ 7 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කරන (මෙම පනතේ මින්මතු "අභියාචක" ලෙස හඳුන්වනු ලබන) තැනැත්තෙකු හෝ කොමසාරිස්-ජනරාල්වරයා විසින් නීති ප්‍රශ්නයක් ගැන තීරණයක් සඳහා අභියාචනාධිකරණය වෙත කරුණු සැලකිරීමක් ඉදිරිපත් කරන ලෙස කොමිෂන් සභාවෙන් ඉල්ලීමක් කළ හැකි ය. කොමිෂන් සභාවේ තීරණය අවස්ථාවෝචිත පරිදි, කොමසාරිස්-ජනරාල්වරයා වෙත හෝ අභියාචක වෙත ලිඛිතව දැනුම් දෙනු ලැබූ දින සිට මසක් ඇතුළත රුපියල් එක් දහස් පන්සියයක ගාස්තුවක් ද සමග ලිඛිතව කොමිෂන් සභාවේ ලේකම්වරයා වෙත භාර දෙනු ලැබුවහොත් මිස, එවැනි ඉල්ලීමක් භාර නොගත යුතු ය.

(2) කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරන කරුණු සැලකිරීමෙහි අදාළ කාරණය ද, කොමිෂන් සභාවේ තීරණය ද ආරවුලට හේතු වූ බදු මුදල් ප්‍රමාණය රුපියල් පන්දහසකට වැඩි නම් ඒ බදු මුදල් ප්‍රමාණය දක්වා තිබිය යුතු අතර, එම කරුණු සැලකිරීම ඉදිරිපත් කරන ලෙස කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටින පාර්ශවකරු විසින් කරුණු සැලකිරීම, සැලකිරීමෙන් සහ අත්සන් කිරීමෙන් පසු දින දාහතරක් ඇතුළත අභියාචනාධිකරණය වෙත යැවිය යුතු ය.

(3) 1982 අංක 43 දරන මුද්දර ගාස්තු පනතේ විධිවිධාන අදාළ කිරීමේ කාර්යය සඳහා-

(අ) අභියාචනාධිකරණය වෙත මේ වගන්තිය යටතේ යොමු කරන ලද කරුණු සැලකිරීමක් පිළිබඳව හෝ එබඳු කරුණු සැලකිරීමක් විභාග කිරීමට, නිශ්චය කිරීමට හෝ එබඳු කරුණු සැලකිරීමකට සුදුස්සක් කිරීමට අදාළව අභියාචනාධිකරණය ඉදිරියේ පවත්වනු ලබන රුපියල් පන්දහසක හෝ ඉදිරිපත් කරන ලද කරුණු සැලකිරීමෙහි ආරවුලට හේතු වූ බදු ප්‍රමාණය වශයෙන් මණ්ඩලය විසින් දක්වනු ලබන වැඩි මුදලක් හෝ වටිනාකම ඇති අභියාචනාධිකරණය ඉදිරියෙහි වූ සියලු නඩු කටයුතු සිවිල් නඩු කටයුතු ලෙස සැළකිය යුතු ය.

(ආ) එසේ ඉදිරිපත් කරන ලද සෑම කරුණු සැලකිරීමක්ම කොමිෂන් සභාව විසින් එයට අමුණා ඇති සියලු පොත්, ලේඛන සහ කඩදාසි සමග අභියාචනාධිකරණය ඉදිරියෙහි වූ සිවිල් නඩු කටයුත්තක තනි ඉදිරිපත් කිරීමක් ලෙස සැලකිය යුතු ය; තව ද,

(ඇ) කොමසාරිස් - ජනරාල්වරයා, අභියාචක වේ නම් නිල බලයෙන් වූ නඩුවක නඩු පවරන රජයේ නිලධරයකු ලෙස ද ඔහු අභියාචනයෙහි වගඋත්තරකරු වේ නම්, නිලබලයෙන් වූ නඩුවක තමාට එරෙහිව නඩු පවරන ලද රජයේ නිලධරයකු ලෙස ඔහු සලකනු ලැබිය යුතු ය.

(4) අභියාචනාධිකරණය වෙත කරුණු සැලකිරීමක් ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටින පාර්ශවකරු විසින් ඒ කරුණු සැලකිරීම එසේ ඉදිරිපත් කරන වේලෙහි හෝ ඊට පෙර, ස්වකීය ඉල්ලීම පරිදි කරුණු සැලකිරීමක් කරනු ලැබූ බවට දැනුම් දෙමින්

ලිඛිත දැන්වීමක් යැවිය යුතු අතර අනෙක් පාර්ශවයට ඉදිරිපත් කරන ලද කරුණු සැලකිරීමෙහි පිටපතක් ද සැපයිය යුතු ය.

(5) අභියාචනාධිකරණයේ ඉදිරිපත් කරන ලද කරුණු සැලකිරීමක්, සංශෝධනය කිරීම පිණිස, යම් විනිශ්චයකාරවරුන් දෙදෙනකු හෝ ඊට වැඩි ගණනක් විසින් කොමිෂන් සභාව වෙත ආපසු එවනු ලැබිය හැකි අතර කොමිෂන් සභාව විසින් ඒ අනුව කරුණු සැලකිරීම සංශෝධනය කළ යුතු ය.

(6) ඉදිරිපත් කරන ලද කරුණු සැලකිරීමෙන් පැන නගින යම් නීතිමය ප්‍රශ්නයක් අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් දෙදෙනෙකු හෝ ඊට වැඩි ප්‍රමාණයක් විසින් විභාග කොට නිශ්චය කළ යුතු අතර, එම නීතිමය ප්‍රශ්නය පිළිබඳ අධිකරණයේ තීරණයට අනුව කොමිෂන් සභාව විසින් තීරණය කර තිබූ තක්සේරුව අභියාචනාධිකරණය විසින් ස්ථිර කිරීම, අඩු කිරීම, වැඩි කිරීම හෝ අවලංගු කිරීම සිදු කළ හැකි ය. නැතහොත් එම කරුණු පිළිබඳව අධිකරණයේ මතය සහිතව අදාළ කරුණු සැලකිරීම කොමිෂන් සභාව වෙත ආපසු එවිය හැකි ය. අධිකරණය විසින් අදාළ කරුණු සැලකිරීමෙන් එසේ ආපසු යවනු ලැබූ අවස්ථාවක දී කොමිෂන් සභාව විසින් අධිකරණයේ මතය අනුව තක්සේරුව ප්‍රතිශෝධනය කරනු ලැබිය යුතු ය.

(7) අභියාචනාධිකරණය වෙත යොමුකර ඇති නඩුවේ තීරණයක් කරන තුරු ආරවුලට තුඩු දී ඇති බදු ප්‍රමාණය සම්බන්ධයෙන් කොමසාරිස් - ජනරාල්වරයා විසින් අය කර ගනු ලැබිය හැකි බදු මුදල සම්බන්ධයෙන් අභියාචනාධිකරණය විසින් කොමසාරිස් - ජනරාල්වරයා විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තාවක් මත පදනම්ව අතුරු තීරණය කරනු ලැබිය හැකි ය.

(8) මේ වගන්තිය යටතේ අභියාචනාධිකරණය ඉදිරිපිට පැවැත්වෙන යම් නීති කෘතියක දී අවස්ථාවෝචිත පරිදි අභියාචනාධිකරණයේ ගාස්තු සම්බන්ධයෙන් සහ (1) වන උපවගන්තිය යටතේ ගෙවිය යුතු මුදල සම්බන්ධයෙන් එම අධිකරණය විසින් සුදුසු යයි සළකනු ලබන ආකාරයට එම අධිකරණය විසින් ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(9) (6) වන උපවගන්තිය යටතේ අභියාචනාධිකරණය විසින් කරන ලද යම් ආඥාවකට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනය කිරීමට කොමසාරිස් - ජනරාල්වරයාට හෝ වෙනත් පාර්ශ්වයකට හැකි වීමේ කාර්ය සඳහා සහ අභියාචනාධිකරණයේ තීරණවලට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරනු ලබන අභියාචනවලට අදාළ යම් ලිඛිත නීතියක විධිවිධාන අදාළ කර ගැනීමේ කාර්ය සඳහා -

(අ) (6) උපවගන්තිය යටතේ අභියාචනාධිකරණය විසින් කරනු ලබන ආඥාවක් සහ (8) උපවගන්තිය යටතේ අභියාචනාධිකරණයේ යම් ආඥාවක් කොමසාරිස් - ජනරාල්වරයා සහ වෙනත් යම් පාර්ශ්වයක් අතර පවතින සිවිල් නඩුවක දී අභියාචනාධිකරණය විසින් ප්‍රකාශයට පත් කරනු ලබන අවසාන නඩු තීන්දුවක් ලෙස සළකනු ලැබිය යුතු ය.

(ආ) එවැනි සිවිල් නඩුවක දී ආරවුලට තුඩු දී ඇති කාරණයේ වටිනාකම රුපියල් පන්දහසක් ලෙස සලකනු ලැබිය යුතු ය.

එසේ වුව ද, අදාළ නඩුවේ දී ආරවුලට තුඩු දී ඇති බදු ප්‍රමාණය වශයෙන් මණ්ඩලය විසින් රුපියල් පන්දහසකට වැඩි මුදලක් සඳහන් කර ඇති අවස්ථාවක එම සිවිල් නඩුවේ දී ආරවුලට තුඩු දී ඇති කාරණයේ වටිනාකම එකී වැඩි මුදල ලෙස සලකනු ලැබිය යුතු ය; සහ

(ඇ) එවැනි යම් අභියාචනයක් සම්බන්ධයෙන් එවැනි යම් ලිඛිත නීතියකින් නියමිත යම් මුදලක් තැන්පත් කරන ලෙස හෝ, යම් ගාස්තුවක් ගෙවන ලෙස හෝ යම් ඇපයක් තබන ලෙස කොමසාරිස් - ජනරාල්වරයාට නියම කරනු නොලැබිය යුතු ය.".

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:–

13. මෙම පනතේ I වන උපලේඛනයේ I වන තීරුවේ නිශ්චිතව දක්වා ඇති ප්‍රඥප්තිවල විධිවිධාන වල වගන්ති හෝ කොටස් එම උපලේඛනයේ II වන තීරුවේ නිශ්චිතව දක්වා ඇති ප්‍රමාණයට සහ ආකාරයට මෙයින් සංශෝධනය කිරීම හෝ ඉවත් කිරීම කරනු ලැබේ.".

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 13අ වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 13අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:–

13අ. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ කාර්ය සඳහා-

"තක්සේරුකරු" යන්නට දේශීය ආදායම් පනතේ එයට දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"දේශීය ආදායම් පනත" යන්නෙන්, 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත සහ අවශ්‍ය සහ උචිත අවස්ථාවල දී 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත සහ 2000 අංක 38 දරන දේශීය ආදායම් පනත ඇතුළත් වේ.".

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 1 වන උපලේඛනය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපලේඛනය ආදේශ කරනු ලැබේ:–

"I වන උපලේඛනය

| *I වන තීරුව* <br> *ප්‍රඥප්තිවල නම්* | *II වන තීරුව* <br> *අදාළ සංශෝධන* |
|---|---|
| 1. 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත | (අ) 166 වන, 167 වන, 168 වන, 169 වන සහ 170 යන වගන්ති ඉවත් කිරීමෙන්; සහ <br> (ආ) ඒ පනතේ 172 වන වගන්තියේ (2) වන සහ (3) වන උපවගන්තිවල "සමාලෝචන මණ්ඩලය" යන වචන වෙනුවට "2011 අංක 23 දරන බදු අභියාචනා කොමිෂන් සභාව පනත මගින් පිහිටුවන ලද බදු අභියාචනා කොමිෂන් සභාව" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්. |
| 2000 අංක 38 දරන දේශීය ආදායම් පනත | (අ) 137 වන, 138 වන, 139 වන, 140 වන සහ 141 වන වගන්ති ඉවත් කිරීමෙන්; සහ <br> (ආ) ඒ පනතේ 143 වන වගන්තියේ (2) වන සහ (3) වන උපවගන්තිවල "සමාලෝචන මණ්ඩලය" යන වචන වෙනුවට "2011 අංක 23 දරන බදු අභියාචනා කොමිෂන් සභාව පනත මගින් පිහිටුවන ලද බදු අභියාචනා කොමිෂන් සභාව" යන වචන ආදේශ කිරීමෙන්. |
| 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත | (අ) 118 වන, 119 වන, 120 වන, 121 වන සහ 122 වන වගන්ති ඉවත් කිරීමෙන්; සහ <br> (ආ) එහි 124 වන වගන්තියේ (2) වන සහ (3) වන උපවගන්තිවල "සමාලෝචන මණ්ඩලය" යන වචන වෙනුවට "2011 අංක 23 දරන බදු අභියාචනා කොමිෂන් සභාව පනත මගින් පිහිටුවන ලද බදු අභියාචනා කොමිෂන් සභාව" යන වචන ආදේශ කිරීමෙන්. |
| 2. 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත | 35 වන සහ 36 වන වගන්ති ඉවත් කිරීමෙන්. |
| 3. 2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත | 8 වන වගන්තියේ "166, 167, 168 සහ 169 යන වගන්ති හැර, අභියාචනාවලට අදාළ XXII පරිච්ඡේදය" යන වචන සහ ඉලක්කම් වෙනුවට "166 වන, 167 වන, 168 වන, 169 වන සහ 170 වන වගන්ති හැර, අභියාචනාවලට අදාළ XXIII වන පරිච්ඡේදය" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්. |
| 4. 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත. | 11 වන වගන්තියේ "අදාළ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව මේ පනත යටතේ පිළිවෙලින් අභියාචනය" යන වචන වෙනුවට "අදාළ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව 166 වන, 167 වන, 168 වන, 169 වන සහ 170 වන වගන්තිවල විධිවිධාන හැර මේ පනත යටතේ පිළිවෙලින් අභියාචනයක්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්. |
| 5. 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත | මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 11 වන වගන්තියේ "තක්සේරු කිරීම, අභියාචන, අභියාචන පිළිබඳව තීරණය කිරීම සහ තක්සේරුවල අවසානාත්මකභාවය සහ ආදායම් බදු අයකරගැනීම හෝ ආපසු ගෙවීමට අදාළව දේශීය ආදායම් පනතේ XVIII සිට XXIV පරිච්ඡේදවල" යන වචන වෙනුවට "තක්සේරු කිරීම, අභියාචන, අභියාචන පිළිබඳ තීරණය කිරීම සහ තක්සේරුවල අවසානාත්මකභාවය සහ ආදායම් බදු අයකර ගැනීම හෝ ආපසු ගෙවීමට අදාළව දේශීය ආදායම් පනතේ සමාලෝචන මණ්ඩලය වෙත කරනු ලබන අභියාචනා සම්බන්ධයෙන් 167 වන, 168 වන, 169 වන සහ 170 වන වගන්ති හැර XVIII සිට XXIV පරිච්ඡේදවල" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.". |

13. ප්‍රධාන ප්‍රඥප්තියේ II වන උපලේඛනය එහි 2 වන අයිතමයට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:–

"3. 2004 අංක 11 දරන මුදල් පනත.

4. 2002 අංක 16 දරන හරබදු පනත.".

14. (1) 2 වන වගන්තියට, 7 වන වගන්තියේ (1) වන උපවගන්තියේ අතුරු විධානයට සහ (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනත යටතේ වන අභියාචනා සම්බන්ධයෙන් සිදු කරන ලද සංශෝධන හැර මේ පනතේ ප්‍රධාන ප්‍රඥප්තියට මේ පනතේ විධිවිධාන මගින් සිදු කරන ලද සංශෝධන සියලු කාර්ය සඳහා 2011 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මකව පැවති බවට සලකනු ලැබිය යුතු ය.

(2) 2012 අංක 4 දරන බදු අභියාචනා කොමිෂන් සභාව පනත මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තියට සිදු කරන ලද සංශෝධනය සියලු කාර්ය සඳහා 2011 මාර්තු මස 31 වන දින සිට බලාත්මකව පැවති බවට සලකනු ලැබිය යුතු අතර, කොමිෂන් සභාව විසින්, 2011 මාර්තු මස 31 වන දිනෙන් ආරම්භව මේ පනත ක්‍රියාත්මක වන දින දක්වා වන කාලසීමාව තුළ දී කරනු ලබන යම් ක්‍රියාවක් හෝ ගනු ලබන යම් තීරණයක් හෝ සියලු කාර්ය සඳහා වලංගු ලෙස සලකනු ලැබිය යුතු ය.

15. මේ පනත මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීමට පෙරාතුව, 10 වන වගන්තිය මගින් එකී වගන්තිය යටතේ කොමිෂන් සභාව වෙත පැවරුණු යම් අභියාචනයක් තීරණය කිරීම සඳහා ප්‍රදානය කොට තිබූ මාස දොළහක කාලසීමාව ඉකුත් වී තිබුණ ද, මේ පනතින් සංශෝධිත පරිදි වූ ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය අනුව, එම අභියාචනය විභාග කොට තීරණය කිරීම සඳහා කොමිෂන් සභාවට බලය ඇති බව සැකදුරු කිරීමේ කාර්ය සඳහා මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

16. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.